# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2017 පෙබරවාරි 21** වන අඟහරුවාදා
2017 மாசி 21 செவ்வாய்க் கிழமை
Tuesday 21st February 2017

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.31 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.31 க்கு சபை கூடியது
*The Provincial Council met at 09.31 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*“2017.02.09 වන දින ලංකාදීප පුවත්පතේ 2 වන කොටසෙහි පළමු පිටුවේ “ආණ්ඩුකාරයා වැරැදි වැඩකට අතදාලා” යන ශීර්ෂය යටතේ පළ වී ඇති වාර්තාවට අදාළව පැහැදිලි කිරීමක් බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ලේකම් විසින් දිනපතා ලංකාදීප ප්‍රධාන කර්තෘ වෙත යොමු කර තිබෙන බවත්, එම පැහැදිලි කිරීමේ පිටපතක්, බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි, බස්නාහිර පළාතේ පළාත් සභාවේ ගරු සභාපතිතුමාව දැනුවත් කිරීම සඳහා හා අවශ්‍ය කටයුතු සඳහාත්, ඒ සමඟම එවන ලද ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ GOS/ADM/14/2/8/4 හා 2017.02.09 දිනැති ලිපිය මගින් සභා ලේකම්තුමා වෙතත් දන්වා එවා තිබෙනවා.*

*ඒ පිළිබඳව මගේ අවධානය ද යොමු කරනු ලැබුවා. ගරු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. ස්වකීය අභිමතය පරිදි කටයුතු කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා පළාත් සභා පනතින් ඉඩ ලැබෙන තාක් දුරට, ගරු ආණ්ඩුකාරතුමා තම කාර්යයන් සපුරාලීම කෙරෙහි බලපාන කිසියම් කරුණක් සම්බන්ධයෙන් සාකච්ඡාවක් සිදු නොවිය යුතුය යන්න කෙරෙහි රීති අංක 64(3) හි පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා. ඒ අනුව මම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා, ඒ රීතියට ඔබතුමන්ලාගේ අවධානය යොමු කරලා, ඒ අනුව ඉදිරියේදී කටයුතු කරන ලෙසට.*

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් විධියටයි මම මෙය මතු කරන්නේ. ඔබතුමා පැහැදිලි කරපු කාරණය ගරු ආණ්ඩුකාරතුමාගේ අභිමතය පරිදි කටයුතු කරන්න පුළුවන්. ඒ අභිමතය අයුතු ලෙස පාවිච්චි කරන ඕනෑම මොහොතක මේ සභාවේ මන්ත්‍රීවරුන්ට ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න කරන්න අයිතිය තිබෙනවා. එහෙම නැතුව ආණ්ඩුකාරවරයා ගන්න ඕනෑම තීන්දුවක් අභියෝගයට ලක් කළ නොහැකියි කියන කාරණය මේ සභාවට පූර්වාදර්ශයක් ලෙස දුන්නොත්, ඒක ඉතාම නරක තත්ත්වයක් ඇති වෙනවා. ඒ නිසා අභිමතය සද්භාවයෙන් පාවිච්චි කරන තාක් කල් මන්ත්‍රීවරුන්ට ඒ අයිතිය බැහැ. හැබැයි, ඒක අසත්භාවයෙන් පාවිච්චි කරනවා නම්, ඕනෑම මන්ත්‍රීවරයෙකුට අයිතිය තිබෙන්න ඕනෑ. මේ සභාවේ ඊට අදාළ ප්‍රශ්නය නඟන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම අයිතියක් තිබෙනවා. නමුත් අපි පැහැදිලිවම දන්නවා, ආණ්ඩුකාරතුමා සද්භාවයෙන් තමයි තීන්දු ගන්නේ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේ ආයුර්වේද කොමසාරිස් ධූරයට අදාළ කාරණාවයි ඔබතුමා කියන්නේ. ඒක වැරැදියි, අරන් තිබෙන කාරණාව. වගන්තිය කියවන්න පුළුවන්. නමුත් ඒකෙන් අදහස් වෙන්නේ නැහැ, මන්ත්‍රීවරුන්ගේ අයිතිය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇත්තටම එතුමා අදහස් කළේ, 64(3) රීතිය අනුව එතුමාගේ පැවැත්ම කථා කරන්න යන එක එච්චරම සදාචාර නැහැ.

*[නිවේදන]*
*[ANNOUNCEMENTS]*

*ii*

*"ගරු අග්‍රාමාත්‍යතුමා විසින් 2017.01.03 වන දින ශ්‍රී ලංකා ජනරජයේ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති බලගතු ශ්‍රී ලංකාවක් - ජාතික ආර්ථික සංවර්ධන සැලැස්ම නම් වූ පොතෙහි සිංහල හා දෙමළ පිටපත් සීමිත සංඛ්‍යාවක් ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් වෙත බෙදා දීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම් විසින් සියලුම පළාත් සභාවල සභා ලේකම්වරුන් අමතමින් අංක PMO/1/Gen හා 2017.01.09 දිනැති ලිපිය සමඟ එවා තිබෙනවා.*

*ඒ පිළිබඳව 2017.02.08 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ දී අවධානය යොමු කරන ලද අතර, එම කාරක සභා නිර්දේශය අනුව එම පොතෙහි පිටපත් අද දින ගරු මන්ත්‍රීවරුන්ගේ සභා මේසය මත තබා තිබෙන බව ගරු මන්ත්‍රීවරුන් වෙත කාරුණිකව දැනුම් දෙනවා. "*

*iii*

*2017 වර්ෂය වෙනුවෙන් පැවැති අයවැය විවාදයේ 2016 දෙසැම්බර් මස 06, 07, 08, 09, 14 හා 15 යන දිනයන්හි නිල හැන්සාඩ් වාර්තා අද දින සභාගත කර ඇති බව කාරුණිකව දැනුම් දෙනවා.*

## කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2017.02.08 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම ගරු ඔබතුමන්ලා වෙත පිළිගන්වනවා.

## පෙත්සම්
PETITIONS

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මහරගම, නල්ලවත්ත පාර, අංක 115 හි පදිංචි ඩී. තිලකසිරි පෙරේරා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් ඉදිරිපත් කරනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මීරිගම, ඩඩ්ලි සේනානායක විද්‍යාලයේ සේවය කරන එච්.ආර්.ඩී. සමන් කුමාරි යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, පානදුර, මොරවින්න, මොරවින්න පාර, අංක 382 හි පදිංචි එම්. පියසේන ප්‍රනාන්දු යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු සභාපතිතුමනි, හල්තොට, පෙතිගමුව, බාලසූරිය මාවතේ හි පදිංචි යූ.කේ.ඩී. නදීකා හර්ෂණී යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

* *[කල් ගන්නා ලද ප්‍රශ්නය ]*
*[ Adjourned Question]*

**01.**

**නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)17/02)**

අ. නැබොඩ ආයුර්වේද රෝහලේ එක්තරා සුළු සේවක උපස්ථායිකාවකගේ නොමනා හැසිරීමක් පාදක කොට ගනිමින් කිසියම් සේවක නොසන්සුන්තාවක් ඇති වී ඇති බව ඔබතුමා පිළිගන්නේද?

ආ. ඉහත කී උපස්ථායිකාවගේ ක්‍රියා කලාපය පිළිබඳව සුළු සේවකයන් භාරව සිටින පරිපාලන නිලධාරී විසින් පරීක්ෂණයක් සිදු කොට වාර්තාවක් සකසා තිබේද? එකී වාර්තාව සභාගත කළ හැකිද?

ඇ. පසුව බස්නාහිර පළාත භාරව සිටින ආයුර්වේද කොමසාරිස්වරිය විසින් ද පරීක්ෂණයක් සිදු කොට, ඇයව මාරු කරන ලෙසට නිර්දේශ කොට ඇති බව ඔබතුමා පිළිගන්නේද? එකී වාර්තාවද සභාගත කළ හැකිද?

ඈ. ඉහත සියලු වාර්තා තිබියදී කිසියම් දේශපාලනික බලපෑමක් මත සේවිකාව ස්ථාන මාරු නොකොට තවමත් එම සේවයේම තබා ගෙන ඇති බව ඔබතුමා පිළිගන්නේද?

ඉ. පුරුද්දක් ලෙස එම රෝහල භාරව සිටින ස්ථානභාර වෛද්‍යවරයා (MOIC) රෝහලට පැමිණෙන්නේ, පැය ගණනාවක ප්‍රමාදයක් සහිත බව ඔබතුමා පිළිගන්නේද?

ඊ. එම ප්‍රමාද වී පැමිණීම ආයුර්වේද කොමසාරිස්වරිය අතටම හසු වී ඇති අතර ඒ පිළිබඳව විනය ක්‍රියා මාර්ග නොගන්නේ මන්ද?

උ. මෙම සියලු ක්‍රියා මාර්ග පිටුපස ආයුර්වේද කොමසාරිස්වරියගෙන් ආශිර්වාදය මෙන්ම, නරක පූර්වාදර්ශයන් පවතින බව ඔබතුමා පිළිගන්නේද?

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

අ. ඔව්.

ආ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකරණ සහකාර විසින් පරීක්ෂණයක් කරන ලදී. වාර්තාව ඇමුණුම 01[1] ලෙස සභාගත කරමි.

ඇ. ඔව්. පළාත් ආයුර්වේද කොමසාරිස්ගේ පරීක්ෂණය අනුව ඇයව රෝහලේ බාහිර රෝගී අංශයට මාරු කර ඇත. වාර්තාව ඇමුණුම II[2] ලෙස සභාගත කරමි.

ඈ. නැත.

ඉ. නැත.

ඊ. අදාළ නොවේ.

උ. නැත.

ඒ වාගේම නෑබඩ මේ ආර්යුවේද රෝහලේ සුළු සේවක උපස්ථායකයෙක් පිළිබඳව සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා මම නැති වෙලාවේදී ප්‍රකාශයක් කර තිබෙනවා, මම මෙයට මැදිහත් වෙලා කියලා. මම ඒ උපස්ථායිකාව දැකලත් නැහැ. එහෙම දෙයක් මම කරලත් නැහැ. බලපෑමක් කරලත් නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පත්තරෙන් දැක්කේ.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

පත්තරෙන් මම දැක්කා, මෙහෙම දෙයක් කරලා තිබෙනවා කියලා. එහෙම ප්‍රකාශ කරන්න එපා. ඇමැතිවරයෙක් ඉන්න වෙලාවකදී ඕනෑම ප්‍රශ්නයක් අපෙන් අහන්න. අපි උත්තර දෙන්නම්. අනික් එක ඒ උපස්ථායිකාව පෙන්ෂන් ගිහිල්ලා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඉදිරිපත් කරන වෙලාවට ඔබතුමන්ලා ඉන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, දැන් ඔබතුමාට මට කාලය දෙන්න බැහැ.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

උත්තර දෙන්න පුළුවන් වෙලාවට කථා කරන්න ඕනෑ. නිකන් බොරුවට කථා කරලා වැඩක් නැහැ නේ? ජනතා විමුක්ති පෙරමුණ කරපු වැඩ අපි දන්නවා. ඒවා මගෙන් අහගන්න එපා -

[1] හැන්සාඩ් අංශයේ තබා ඇත.
[2] හැන්සාඩ් අංශයේ තබා ඇත.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මගේ පෞද්ගලික ප්‍රකාශයක් ඒ වෙලාවේ කළේ. මෙතුමා ඉන්න වෙලාවටද මගේ ප්‍රකාශය කරන්න ඕනෑ. ඒක මාර කථාවක් නේ?

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

පත්තරේ යන්න කථා කරලා වැඩක් නැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේ ඇමැතිතුමන්ලා වැඩිපුර කාලයක් මේ සභාවේ නැහැ.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඉන්න වෙලාවට ඉන්නවා. අපි ඕනෑ වෙලාවට ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

මෙතැන ඉන්න ඕනෑම කියලා නැහැ නේ? එහෙම ඉන්නම ඕනෑ කියලා නීතියක් තිබෙනවාද? මේ සභාවේ අපි හරියට වැඩ කරනවා. ඔබතුමන්ලාට ප්‍රශ්න නැතිව, නැති ප්‍රශ්නයක් මෙතැනට ඇදගෙන වැඩක් නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, සමාවෙන්න. කරුණාකර ඔබතුමා වාඩි වෙන්න. අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, මගේ පළමුවැනි ප්‍රශ්නය -

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

අපි ඉන්න වෙලාවේ ඕනෑ ප්‍රශ්නයක් අහන්න. අපි උත්තර දෙනවා. ගරු මහ ඇමැතිතුමා, අනික ඒක ඇත්තක් නොවේ. ඒක බොරුවක්. කාගේ හරි බොරුවක්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පෞද්ගලික ප්‍රකාශ කරන්නේ පෞද්ගලික ප්‍රකාශ ඉදිරිපත් කරන වෙලාවට. අපට ඕනෑ වෙලාවට නොවෙයි.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

පෞද්ගලිකව මඩක් ගහන්න නේ මේ කරලා තිබෙන්නේ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

පෞද්ගලික ප්‍රකාශයක් කළේ. පෞද්ගලික ප්‍රකාශය කරන වෙලාවේ මෙතුමා සභාවේ සිටියේ නැහැ. මම මොනවා කරන්නද? ගරු සභාපතිතුමා අවස්ථාව දෙන වෙලාවේ තමයි මම අදහස් ඉදිරිපත් කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ ප්‍රශ්නවලට ගොඩක් විසඳුම තමයි, ගරු ඇමැතිතුමන්ලා උදේ වරුවේ සභාවේ ඉන්න ඕනෑ. එතකොට මේ ප්‍රශ්න උද්ගත වෙන්නේ නැහැ. ගරු මහ ඇමැතිතුමා වාගේ වෙලාටව ඇවිල්ලා මේ සභා ගර්භයේ ඉන්නවා නම්, එහෙම එච්චර ප්‍රශ්නයක් වෙන්නේ නැහැ.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, මගේ අතුරු ප්‍රශ්න අංක 01. ගරු ඇමැතිතුමා "ඊ" ප්‍රශ්නයට උත්තර දුන්නා,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න. එතුමා කියන එක ඇහෙන්නේ නැහැ.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, ගරු ඇමැතිතුමා උත්තරයක් දුන්නා ප්‍රශ්න අංක "ඊ" යටතේ වෛද්‍යවරයා ප්‍රමාද වෙලා පැමිණීම සම්බන්ධව. මම හිතන්නේ එතුමා මේ ගැන සොයා බැලුවොත් එහෙම ඒ රෝහලේ සිටින සේවක පිරිසෙන් සහ අනෙකුත් වෛද්‍යවරුන්ගෙන් ඇහුවා නම්, හැමදාම මේ වෛද්‍යවරයා ප්‍රමාද වෙලා පැමිණෙන්නේ. වෛද්‍යවරයා සම්බන්ධව එතුමා පරීක්ෂණයක් කරනවාද? එම පරීක්ෂණ වාර්තාව මේ සභාවට ඉදිරිපත් කරනවාද? කියන එක තමයි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය වන්නේ.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඔව්. ඔව්. ඒක කරන්න ඕනෑ. මට වාර්තා වෙලා නැහැ. වාර්තාව අනුව මම කටයුතු කරනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

වෛද්‍යවරයා සම්බන්ධව වාර්තාව ඉදිරිපත් කරන්න -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ අවසරය පරිදි, -

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

පත්තරේ දාන ඒවා දන්නවා නේ?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, එතුමාගේ අවසරය පරිදි දෙවැනි ප්‍රශ්නය අහනවා. ගරු සභාපතිතුමනි, "ඈ" ප්‍රශ්නයට දෙන ලද පිළිතුර අසත්‍ය පිළිතුරක් ගරු සෞඛ්‍ය ඇමැතිතුමා දුන්නේ. බස්නාහිර පළාත භාරව සිටින ආයුර්වේද කොමසාරිස්වරිය විසින් ද පරීක්ෂණයක් සිදු කොට ඇයව මාරු කරන ලෙසට නිර්දේශ කොට ඇති බව ඔබතුමා පිළිගන්නේද? එකී වාර්තාවද සභාගත කළ හැකිද? කියලා.

එතකොට එතුමාගේ පිළිතුරු වුණේ, එම රෝහලේම බාහිර අංශයට මාරු කළා කියලා. මා දන්න තරමින් දැනට ඇයව වෙනත් රෝහලක් කරා මාරු කරලා තිබෙනවා. එය අසත්‍ය පිළිතුරක් කියලා මම ගරු සෞඛ්‍ය ඇමැතිතුමාට කියනවා.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඔබතුමා අහගෙන සිටියේ නැහැ. මේකේ වාර්තාව සභාගත කරනවා. ඒකේ තිබෙනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය. ස්ථානභාර වෛද්‍යවරයා වන එම්.ඕ.අයි.සී. රෝහලට පැමිණෙන්නේ හැමදාම ප්‍රමාද වෙලයි කියන කාරණාව. ඒකේදී "නැත" කියලා තමයි ගරු සභාපතිතුමනි, පිළිතුර ඇවිල්ලා තිබෙන්නේ. මම ඔබතුමාගෙන් අහනවා, ආයුර්වේද කොමසාරිස්වරිය පරීක්ෂණයක් සඳහා මේ රෝහලට ගියපු අවස්ථාවේ එදිනත් මේ වෛද්‍යවරයා 11.30 ට තමයි රෝහලට වාර්තා කරලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

එතකොට ඒ සම්බන්ධයෙන් ගරු ඇමැතිතුමා වාර්තාවක් කැඳවනවාද කියලා දැනගන්න කැමැතියි.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඔව්. ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කැඳවලා ඊළඟ සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

බොහොම ස්තුතියි.

## 02.

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)17/05)**

අ. පිළියන්දල මාම්පේ කණිෂ්ට විද්‍යාලයේ 2017 වසරේ පවත්නා පළමු ශ්‍රේණියේ පන්ති ගණන කීයද?

ආ. ඒ අනුව ඇතුළත් කර ගන්නා මුළු ළමුන් ගණන කීයද?

ඇ. මේ වන විට ඇතුළත් කරගෙන ඇති ළමුන් ගණන, ඒ ඒ ගණයට අනුව මුළු ගණන කීයද?

ඈ. ඇතුළත් කරගෙන ඇති ළමුන්ගේ නම, ගණය, ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ ලකුණු, අභියාචනා හා විරෝධතා පරීක්ෂණයට අනුව ලකුණු, ස්ථිර පදිංචි ලිපිනය, භාරකරුගේ නම ලෙස වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

ඉ. ඇතුළත් කර ගන්නා ලද ළමුන් ගණනට අනුව මේ වන විට මුළු පුරප්පාඩු ගණන කීයද?

ඊ. ආරක්ෂක අංශවල සේවයේ නියුතු වූවන්ගේ හා ස්ථාන මාරු ලැබ එන නිලධාරීන්ගේ ළමුන්ගේ ගණයට ඇතුළත් කර ගැනීමට පුරප්පාඩු ලෙස වෙන් කළ ගණන කීයද?

උ. පාසලට ඇතුළත් කර නොගත් පොරොත්තු ලේඛනයේ සිටින, ඒ ඒ ගණයට අනුව නම, ගණය, ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ ලකුණු, අභියාචනා හා විරෝධතා පරීක්ෂණයට අනුව ලකුණු, ස්ථිර පදිංචි ලිපිනය, භාරකරුගේ නම යන තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

අ. පන්ති 03 කි.

ආ. ළමුන් 117 යි.

ඇ.

| | | |
|---|---|---|
| පාසලට ආසන්න | 74 |
| ආදි ශිෂ්‍ය | 06 |
| සහෝදර | 21 |
| අධ්‍යාපන | 00 |
| ස්ථාන මාරු | 00 |
| විදේශ | 01 |
| එකතුව | 102 |

ඈ. ඔව්. (ඇමුණුම 01[3] ලෙස සඳහන් කර ඇත.)

ඉ. පුරප්පාඩු නොමැත.

ඊ. ආරක්ෂක අංශවල සේවයේ නියුතු වූවන්ගේ ළමුන් 15 යි.

උ. ඔව්. (ඇමුණුම 02[4] )

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු ඇමැතිතුමා, ඔබතුමා පුරප්පාඩු ඉවරයි කියලා කියන්නේ, ඒ පාසලට සියලුම ළමයින් අරගෙන ඉවරද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැහැ. මේ කියන්නේ ක්‍රියාන්විත සේවයේ පුරප්පාඩු තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක තමයි. ඒ ළමයින් ටික අරගෙන ඉවර කරන දිනයක් තිබෙනවාද? නැත්නම් මැයි වනතුරු යනවාද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැහැ. අපි ඊයේත් උදේ වරුවේම නිලධාරීන් කැඳවලා සාකච්ඡාවක් කළා. ලේකම්තුමාත් තියාගෙන. අපි උපදෙස් දුන්නා, ඉදිරි සති දෙකක් තුළ ඉතාම කඩිනමින් අවසන් කරන්න කියලා. පසුගිය වසරේ වාගේ ප්‍රමාද කරන්න එපා කියලා. ගරු සභාපතිතුමනි, අපි සියලුම කලාපවල වාර්තා කැඳෙව්වා. ඒ වාර්තාවල පිටපතක් වුණත් ගරු මන්ත්‍රීතුමාට අපේ අමාත්‍යාංශයෙන් ලබා ගන්න පුළුවන්.

---

[3] හැන්සාඩ් අංශයේ තබා ඇත.
[4] හැන්සාඩ් අංශයේ තබා ඇත.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ ළමයින් ටික ගන්නේ චක්‍රලේඛයට අනුවද? ඊට පිටින්ද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

චක්‍රලේඛයට අනුව ගන්න සිද්ධ වෙනවා. නමුත් ප්‍රශ්නයක් තිබෙනවා. සමහර පාසල්වලට - ගරු මන්ත්‍රීතුමා අසන ප්‍රශ්නයේ ධ්වනිත අර්ථය මට දැනෙනවා. මොකද මේ චක්‍රලේඛයේ මොනවා කිව්වත්, මේ පාසල අයිනේම ඉන්න ළමයින් ඉන්නවා. සීයත් එහේ. ආච්චිත් එහේ. තාත්තාත් එහේ. ළමයාත් එහේ. ඒ ළමයින් තමයි ඔය ටයර් පුච්චන්නේ. චක්‍රලේඛය තුළ මේ ළමයින්ට යන්න නැහැ. මගේ හෘද සාක්ෂිය සහ මේ රටේ හැම අම්මා තාත්තා කෙනෙක්ගේ හෘද සාක්ෂිය සමහරවිට මට සාධාරණව ක්‍රියාත්මක කරවන්න පුළුවන් වෙයි. ඔබතුමාගේ හෘද සාක්ෂියත් සාධාරණ වේවි. වෙන අකටයුතුකම් නම් මගෙන් වෙන්නේ නැහැ. හෘද සාක්ෂිය, මොන ලකුණු නැති වුණත් දරුවාට අයිති තිබෙනවා නම්, ඒ පාසලේ ඒ සීයා, ආච්චී, මුත්තා පවා පදිංචිය එහෙනම්, ඉඩම එතැන නම් - මේ චක්‍රලේඛයේ ඔප්පු තිරප්පු ඉදිරිපත් කරන්න බැහැ. ඉඩම් ආඥා පනත යටතේ තිබෙන දේවල් සම්පූර්ණ කරන්න බැහැ. ප්‍රාදේශීය ලේකම් යටතේ ඉඩම් පැවරීම් තිබෙනවා. ජයභූමි, ස්වර්ණ භූමි, ඔක්කොම තිබෙනවා. මමත් මෙය ටිකක් දන්නවා. ඒ බැරි නිසා ළමයා පිටිපස්සට යනවා. හැබැයි, අපේ හෘද සාක්ෂිය මේ දරුවා ඇතුළත් විය යුතුයි කියන එකයි. ඒකට විශේෂ වාර්තාවක් අපි ප්‍රාදේශීය ලේකම්කරුවන්ගෙන් කැඳවන්න ඊයේ තීන්දු කළා. ඒකයි මම සති දෙකක් විතර යනවා කියලා කිව්වේ. ඉතින් මම සහ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ හෘද සාක්ෂිය වලංගු වේවි කියලා මම විශ්වාස කරනවා, ඒ අවංක භාවය සඳහා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා හෘද සාක්ෂියට අනුව ළමයින් ටික ගන්න කෝ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

හොඳයි.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු මන්ත්‍රීතුමා, මට අතුරු ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පුළුවන්. පුළුවන්.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා ප්‍රකාශ කළ පරිදි -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමාගෙන් අවසර ගන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

හරි. එතුමාගේ අවසරය පරිදි, ගරු අධ්‍යාපන ඇමැතිතුමාට යොමු කරන්නේ. එතුමා කිව්ව පරිදි වැට අයිනේ, නැත්නම් වෙනත් වෙනත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කිව්වාට සමාවන්න. අනවශ්‍ය විස්තර නොවෙයි. ඔබතුමාට අවසර දුන්නේ, මේ ප්‍රශ්නවලට අදාළව ප්‍රශ්න අහන්න. ඔබතුමා වෙන වල් පල් අහන්න එපා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඒකට අදාළව තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අදාළ නැහැ. ඔබතුමා ප්‍රශ්න ටික දන්නවාද? දන්නේ නැහැ නේ?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ප්‍රශ්න අහන්න මට ඉඩ දෙන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ප්‍රශ්නයක් මෙතැන නැහැ නේ? ප්‍රශ්නය තිබෙන්නේ මෙතුමාට. ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. අවසර දුන්නේ මේ ප්‍රශ්නවලින් අහන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මට අවස්ථාවක් දෙන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු ඇමැතිතුමාගෙන් පැහැදිලි කර ගැනීමක්. අභියාචනා ඉදිරිපත් කරන කාරණාවලදී ඒ සියලුම අභියාචනා අභිබවා තීන්දු ගැනීමේ බලය ඔබතුමාට තිබෙන බව ඔබතුමා දන්නවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සමාවන්න. මේ ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. ඒවාට අදාළව -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

නැත. නැත.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

අධ්‍යාපනයට අදාළව අහන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අධ්‍යාපන ඔක්කොම අහන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, නිවැරදි කිරීමක් සඳහා මට විනාඩියක් දෙන්න. මේ ප්‍රශ්නය යොමු කරන ලද ගරු මන්ත්‍රීතුමාගෙන් බාහිරව ඒ ප්‍රශ්නයට වෙනත් අයට සම්බන්ධ වීමට සහ උත්තර සැපයීමට තිබෙන අවස්ථාව රීති කාරක සභාවෙන් සංශෝධනය කළ යුතුයි කියලා මම විශ්වාස කරනවා, මා ලබා තිබෙන අත්දැකීම් අනුව. එතකොට මේ ප්‍රශ්නය විසඳෙයි. දැන් ඉතින් ඕනෑ දෙයක් අහන්න පුළුවන් නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා රීතිවල තිබෙනවා, ප්‍රශ්නය යොමු කරපු ගරු මන්ත්‍රීතුමා කැමැති නම් -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

එතුමාත් එක්ක මගේ ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවසරය තිබෙනවා නම් අහන්න පුළුවන්.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මම ප්‍රශ්නය අහන්න කලින් තමුන්නාන්සේ අංජනම් එළි බලනවා වාගේ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මෙහෙමයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

හැබැයි, ඇමැතිවරයාට බලයක් නැහැ. ඒක කියන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මානුෂිකව බලලා මම ඔබතුමාට අවස්ථාව දුන්නේ. ඔබතුමා වෙන ඒවා නේ අහන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කාලය ඉතිරි කරගෙන වැඩ කරන්න. අනික් අයගේ කාලය වටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක ඔබතුමා වෙනම අහන්න. අමාත්‍යාංශයෙන් වෙනම ඉල්ල ගන්න. මෙතැන දෙන්න බැහැ. රීතිවල තිබෙන්නේ, අහපු ප්‍රශ්නයට අනුව තමයි ප්‍රශ්න අහන්න පුළුවන්. ඊට එහා මට යන්න දෙන්න බැහැ. තුන්වැනි ප්‍රශ්නය සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන ඇමැතිතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ඒ සඳහා පිළිතුරු දීමට සති දෙකක් කල් ඉල්ලනවා.

**04.**

**සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)17/07)**

අ. හෝමා/අවිස්සාවේල්ල ජනාධිපති කණිෂ්ඨ විද්‍යාලයේ 2017 වසරේ පවත්නා පළමු ශ්‍රේණියේ පන්ති ගණන කීයද?

ආ. ඒ අනුව ඇතුළත් කර ගන්නා මුළු ළමුන් ගණන කීයද?

ඇ. මේ වන විට ඇතුළත් කරගෙන ඇති ළමුන් ගණන ඒ ඒ ගණයට අනුව මුළු ගණන කීයද?

ඈ. ඇතුළත් කරගෙන ඇති ළමුන්ගේ නම, ගණය, ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ ලකුණු, අභියාචනා හා විරෝධතා පරීක්ෂණයට අනුව ලකුණු, ස්ථිර පදිංචි ලිපිනය, භාරකරුගේ නම ලෙස වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

ඉ. ඇතුළත් කර ගන්නා ලද ළමුන් ගණනට අනුව මේ වන විට මුළු පුරප්පාඩු ගණන කීයද?

ඊ. ආරක්ෂක අංශවල සේවයේ නියුතු වූවන්ගේ හා ස්ථාන මාරු ලැබ එන නිලධාරීන්ගේ ළමුන්ගේ ගණයට ඇතුළත් කර ගැනීමට පුරප්පාඩු ලෙස වෙන් කළ ගණන කීයද?

උ. පාසලට ඇතුළත් කර නොගත්, පොරොත්තු ලේඛනයේ සිටින ඒ ඒ ගණයට අනුව නම, ගණය, ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ ලකුණු, අභියාචනා හා විරෝධතා පරීක්ෂණයට අනුව ලකුණු, ස්ථිර පදිංචි ලිපිනය, භාරකරුගේ නම යන තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. පන්ති 06 යි.

ආ. ළමුන් 234 යි.

ඇ.

| | |
|---|---|
| පාසලට ආසන්න | 103 |
| ආදි ශිෂ්‍ය | 51 |
| සහෝදර | 31 |
| අධ්‍යාපන | 09 |
| ස්ථාන මාරු | 07 |
| විදේශ | 02 |
| ක්‍රියාන්විත | 23 |
| එකතුව | 226 |

ඈ. ඔව්. (ඇමුණුම 01[5] හි සඳහන් කර ඇත.)

ඉ. ළමුන් 08 යි.

ඊ. ආරක්ෂක අංශවල සේවයේ නියුතු වූවන්ගේ ළමුන් 30 යි.
ස්ථාන මාරු ගණය සඳහා ළමුන් 07 යි.

උ. ඔව්. (ඇමුණුම 02[6] )

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, "ඊ" ප්‍රශ්නයට දෙන ලද පිළිතුර සම්බන්ධයෙනුයි ප්‍රශ්නයක් නඟන්නේ. ආරක්ෂක අංශවල සේවයේ නියුතු වූවන්ගේ හා ස්ථාන මාරු ලැබ එන නිලධාරීන්ගේ ළමුන්ගේ ගණයට ඇතුළත් කර ගැනීමට පුරප්පාඩු ලෙස වෙන් කළ ගණන කීයද? ඔබතුමාගේ පිළිතුර 08 යි නේ. එතකොට දැන් ගරු ඇමැතිතුමනි, මේ ළමුන් 08 දෙනා සමඟ -

---
[5] හැන්සාඩ් අංශයේ තබා ඇත.
[6] හැන්සාඩ් අංශයේ තබා ඇත.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේකේ තිබෙනවා, නියුතු වූවන්ගේ ප්‍රමාණය 30 යි කියලා. ඒ කියන්නේ, පන්ති හය නම් පස්වරක් හය තිහයි. පන්ති හයක් එන කොට තිහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම සාකච්ඡා කරන්න දෙන්න බැහැ. කාලය නැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒත් සමඟ පන්ති කාමරයක සමස්ත ළමුන් ගණන කීයක් වෙනවාද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

පන්ති කාමරයක මුල් ලේඛනයේ 34 යි. ආරක්ෂක අංශයේ 05 යි, 39 යි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

හරි. එතකොට අවසානයටම පන්ති කාමරයකට යන්න පුළුවන් ළමුන් ගණන කීයද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

තිස් නවය හයෙන් වැඩි කළාම හරි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

නැහැ, නැහැ. මම අහන්නේ එක පන්ති කාමරයක -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

39 යි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

එක පන්ති කාමරයක සිටින ළමුන් ගණන 39 යි ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

පන්ති කාමරයේ ක්‍රියාන්විත සේවයේ පහ හැර, අවසන් ගණන 35 යි, 39 යි අවසන් ගණන.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒ අවසන් ගණනින් එහා ළමුන් බඳවා ගැනීම සම්බන්ධයෙන් ඔබතුමන්ලා ප්‍රතිපත්තිමය තීරණයක් දැනට අරගෙන තිබෙනවාද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

පැහැදිලිව අරගෙන තිබෙනවා. ඒ කියන්නේ අපි උපදෙස් දීලා තිබෙනවා. ඒ නියමිත ප්‍රමාණය අභිබවා යන්න එපා. එහෙම අරගෙන තිබුණොත් අපි -

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්න කීයක් අහන්න පුළුවන්ද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අපේ චක්‍රලේඛයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න. මට කාලය දෙන්න බැහැ. සැරින් සැරේ අහන හින්දා මට කාලය -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

එතුමා අහන නිසා මට උත්තර දෙන්න වෙනවා. මට ප්‍රශ්නයක් නැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ප්‍රශ්නයක් අහන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ප්‍රශ්න කීයක් ඇහුවාද? ප්‍රශ්න කීයක් අහන්න පුළුවන්ද කියන්න කෝ?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අවසාන අතුරු ප්‍රශ්නය මේ අහන්නේ. ළමුන් 39 ඉක්මවා බඳවා ගැනීමට ප්‍රතිපත්තිමය තීන්දුවක් අරගෙන තිබේද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

නැත. නැත.

**05.**

**සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)17/08)**

අ. ජය/මහරගම ජනාධිපති විද්‍යාලයේ 2017 වසරේ පවත්නා පළමු ශ්‍රේණියේ පන්ති ගණන කීයද?

ආ. ඒ අනුව ඇතුළත් කර ගන්නා මුළු ළමුන් ගණන කීයද?

ඇ. මේ වන විට ඇතුළත් කරගෙන ඇති ළමුන් ගණන ඒ ඒ ගණයට අනුව මුළු ගණන කීයද?

ඈ. ඇතුළත් කරගෙන ඇති ළමුන්ගේ නම, ගණය, ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ ලකුණු, අභියාචනා හා විරෝධතා පරීක්ෂණයට අනුව ලකුණු, ස්ථිර පදිංචි ලිපිනය, භාරකරුගේ නම ලෙස වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

ඉ. ඇතුළත් කර ගන්නා ලද ළමුන් ගණනට අනුව මේ වන විට මුළු පුරප්පාඩු ගණන කීයද?

ඊ. ආරක්ෂක අංශවල සේවයේ නියුතු වූවන්ගේ හා ස්ථාන මාරු ලැබ එන නිලධාරීන්ගේ ළමුන්ගේ ගණයට ඇතුළත් කර ගැනීමට පුරප්පාඩු ලෙස වෙන් කළ ගණන කීයද?

උ. පාසලට ඇතුළත් කර නොගත්, පොරොත්තු ලේඛනයේ සිටින ඒ ඒ ගණයට අනුව නම, ගණය, ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ ලකුණු, අභියාචනා හා විරෝධතා පරීක්ෂණයට අනුව ලකුණු, ස්ථිර පදිංචි ලිපිනය, භාරකරුගේ නම යන තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අ. පන්ති 04 යි.

ආ. ළමුන් 156 යි.

ඇ.

| | |
|---|---|
| පාසලට ආසන්න | 68 |
| ආදි ශිෂ්‍ය | 34 |
| සහෝදර | 20 |
| අධ්‍යාපන | 07 |
| ස්ථාන මාරු | 06 |
| විදේශ | 01 |
| ක්‍රියාන්විත | 20 |
| එකතුව | 156 |

ඈ. ඔව්. (ඇමුණුම 01[7] ලෙස සඳහන් කර ඇත.)

ඉ. පුරප්පාඩු නොමැත.

ඊ. ආරක්ෂක අංශවල සේවයේ නියුතු වූවන්ගේ ළමුන් 20 යි.
ස්ථාන මාරු ගණය සඳහා ළමුන් 06 යි.

උ. ඔව්. (ඇමුණුම 02[8])

**06.**

**නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරි මාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)17/09)**

අ. බස්නාහිර පළාත තුළ නියඟයේ බලපෑමට හසු වී ඇති වී වගා කරන ලද ඉඩම් ප්‍රමාණය කොපමණද?

ආ. බස්නාහිර පළාත තුළ නියඟයේ බලපෑමට හසු වී ඇති එළවළු වගාබිම් කොපමණද?

[7] හැන්සාඩ් අංශයේ තබා ඇත.
[8] හැන්සාඩ් අංශයේ තබා ඇත.

ඈ. මෙම වගාබිම් වලට අවශ්‍ය වාරි ජලය සැපයීමේ හැකියාවක් තිබේද?

ඇ. බස්නාහිර පළාත තුළ සත්ව පාලනයට එනම් ගව පාලනයට හා බොයිලර් කුකුළු පාලනයට දිනකට අවශ්‍ය ජල ප්‍රමාණය කොපමණද?

ඉ. සත්ව පාලනය සඳහා අවශ්‍ය කරන ජලය සම්පාදනය කළ නොහැකි නම් ඊට ඇති විසඳුම් හා ක්‍රමවේදයන් මොනවාද?

ඊ. බස්නාහිර පළාතේ මහ කන්නයේ අස්වැන්න කෙතරම් වේදැයි තක්සේරු කර තිබේද?

උ. ජලය හිඟකම නිසා වී වෙනුවට විකල්ප භෝග සඳහා ගොවියන් යොමු කරන්නේද?

ඌ. එසේනම් ඒ භෝග වර්ග මොනවාද?

එ. නියං සමයේදී ගෙවතු වගාව සහ නාගරික මහල් නිවාසවල මල් බඳුන්වල කරන වගාවන් සඳහා අනුබල දෙන්නේද?

ඒ. බස්නාහිර පළාත තුළ නියඟයෙන් සත්ව පාලනයට හා පශු සම්පත් නිෂ්පාදනයට ඇති කරන බලපෑම පිළිබඳව තක්සේරු කර ඇත්තේද?

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

අ. හෙක්ටයාර 4,476.9 කි.

ආ. හෙක්ටයාර 201.4 කි.

ඈ. නොමැත.

ඇ. දෛනික මුළු ජල අවශ්‍යතාව ලීටර් 6,539,000 කි.

ඉ. ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ සහාය ලබාගෙන ජලය සපයා ගැනීමට කටයුතු කිරීම. අවස්ථානුකූලව වෙනත් සුදුසු පියවරක් ගැනීම.

ඊ. ඔව්.
බස්නාහිර පළාතේ මහ කන්නයේ තක්සේරුගත අස්වැන්න මුළු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 50,251.84 (කාලගුණික තත්ත්වය සහ යෙදවුම් මත මෙම අගය වෙනස් විය හැකිය.

උ. ඔව්.

ඌ. ඇමුණුම 01 යටතේ දක්වා ඇත.

ඇමුණුම 01

| දිස්ත්‍රික්කය | භෝග වර්ගය | භූමි ප්‍රමාණය (හෙක්ටයාර) | එකතුව (හෙක්ටයාර) |
|---|---|---|---|
| කොළඹ | කෙටි කාලීන වී | 12 | |
| | පතෝල, බටු, මිරිස් | 45 | |
| | කොළ එළවළු | 20 | 92 |
| | මඤ්ඤොක්කා | 15 | |
| ගම්පහ | මඤ්ඤොක්කා | 184 | |
| | බතල | 7.5 | |
| | එළවළු | 97 | 298.5 |
| | බඩඉරිඟු | 7.5 | |
| | මුං | 2.5 | |
| කළුතර | **<u>පුරන් කුඹුරු</u>** | - | |
| | කොළ එළවළු | 7 | |
| | එළවළු | 20 | 34 |
| | බතල | 5 | |
| | ඉන්නල | 2 | |
| | **<u>ගොඩබිම් වගාව</u>** | | |
| | මඤ්ඤොක්කා | 15 | |
| | වැල් අල | 3 | 23 |
| | කිරි අල | 5 | |

එ. ඔව්.

ඒ. මේ දක්වා තක්සේරු කර නොමැත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

07 වැනි ප්‍රශ්නය. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

සති දෙකක් කල් ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

08 වැනි ප්‍රශ්නය. මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**08.**

**මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/17/11)**

අ. බියගම ග්‍රාමීය රෝහල පාලනය වන්නේ ඔබ අමාත්‍යාංශය යටතේ ද ?

ආ. එම රෝහල තුළ රෝගීන්ට නේවාසිකව සිටීමට ඇඳන් කීයක් තිබේද ?

ඇ. එම රෝහලේ එක් එක් අංශවල කාර්යය මණ්ඩලය කොපමණද ?

ඈ. මෙම රෝහල සඳහා ඉදි කර ඇති ගොඩනැගිලිවල අඩුපාඩු සම්පූර්ණ කිරීමට ඔබතුමා ගත් ක්‍රියා මාර්ගය මොනවාද ?

ඉ. මෙම රෝහලේ අනෙකුත් අඩුපාඩු 2017 වර්ෂය තුළ සම්පූර්ණ කර දීමට ඔබතුමා කටයුතු කරන්නේද ?

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

අ. ඔව්.

ආ. නේවාසික රෝගීන් සඳහා ඇඳන් - 30
රෝගීන් පරීක්ෂාව සඳහා ඇඳන් - 07

ඇ.

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| වෛද්‍ය නිලධාරී | 04 |
| දන්ත ශල්‍ය වෛද්‍ය | 01 |
| හෙද සොයුරි | 01 |
| හෙද නිලධාරී | 12 |
| සංවර්ධන නිලධාරී | 01 |
| රියදුරු | 01 |
| උපස්ථායිකා | 06 |
| කණිෂ්ට කාර්ය මණ්ඩලය | 08 |

ඈ. රුපියල් මිලියන 2.9 ක් වියදම් කර 2016 වර්ෂය තුළ බාහිර රෝගී අංශය ඇතුළු අනෙකුත් ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු කරන ලදී.

ඉ. ඔව්.
2017 වර්ෂය තුළ ඉතිරි අලුත්වැඩියා සම්පූර්ණ කිරීම සඳහා රුපියල් මිලියන 0.9 ක් අවිච්ඡේද මුදල් යටතේ අනුමත කර ගැනීමට කටයුතු කර ඇත.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු සභාපතිතුමනි, පළමුවැනි අතුරු ප්‍රශ්නය. ගරු අමාත්‍යතුමා ඉදිරිපත් කරපු පිළිතුරේ සඳහන් වෙනවා, මේ ග්‍රාමීය රෝහල 2017 වර්ෂයේදී නව ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ කොටස කරනවා කියලා.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඇහෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු අමාත්‍යතුමා ඉදිරිපත් කරනවා, 2017 වර්ෂයේදී නව ගොඩනැගිල්ලේ ඉදිරි වැඩ කටයුතු අවසන් කරනවා කියලා. බාහිර රෝගී අංශයේ. මම හිතනවා, ඒක ඉතාම වැදගත් යෝජනාවක්. මම ගරු සෞඛ්‍ය ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. බියගම ආසනයටම තිබෙන්නේ, මේ රෝහල විතරයි. අපේ ආසනයේ විශාල ජනගහනයක් ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ප්‍රශ්නය අහන්න කෝ.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

මෙහි වෛද්‍යවරු ප්‍රමාණයක් තව අඩුයි. ඒ නිසා එම වෛද්‍යවරු ටික 2017 වර්ෂයේදී ඔබතුමා රෝහලට ලබා දෙනවාද?

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ලබා දෙන්න, මධ්‍යම රජයත් එක්ක කථා කරලා බලන්න ඕනෑ.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු සභාපතිතුමනි, දෙවැනි ප්‍රශ්නය. මේ රෝහල සංවර්ධනය කරන්නට ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ගරු අග්‍රාමාත්‍යතුමා යම්කිසි මුදල් ප්‍රතිපාදන ප්‍රමාණයක් 2016 වර්ෂයේ වෙන් කළාද?

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

වෙන් කරලා තිබෙනවාද?

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ඒක තමයි මම ඔබතුමාගෙන් අහන්නේ. මම හරියට දන්නේ නැහැ.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

මම දැනුවත්ව වෙන් කරලා නැහැ.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

මට ආරංචියක් ආවා, මිලියන 3 ½ ක් ගරු අග්‍රාමාත්‍යතුමා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙන් වෙන් කළා කියලා. ඒක ඔබතුමා කියන්නේ නැහැයි කියලා.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

සොයා බලන්නම්.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. බියගම ජාතික රෝහලේ ඉතිරි අඩුපාඩු ටික 2017 වර්ෂයේදී ඔබතුමාගේ මැදිහත්වීමෙන් හැකි ඉක්මණින් හදන්නය කියලා.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

උත්සාහ කරමු.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලි නැහැ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා. ගරු සභාපතිතුමනි, මගේ මේසය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න. ගරු මන්ත්‍රීතුමන්ලා සාකච්ඡාව පොඩ්ඩක් නවත්වන්න. ඇහෙන්නේ නැහැ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, මගේ මේසය මත පොතක් තබා තිබෙනවා. මොකක්ද දන්නේ නැහැ. මේක ලංකාවේ සුරංගනා ගමනක්ද? මොකක්ද? පොතක් තියලා තිබෙනවා. මොකක්ද දන්නේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඕක නිවේදනවලට කිව්වා නේ? ඔබතුමා දැන්නේ එන්නේ. පරක්කු වෙලා නේ එන්නේ?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

එක බොරුවක් කළා. තව බොරුවක්. මේ සුරංගනා කථාවක්. මිනිස්සුන්ට හාල් සේරුවක් ගන්න සල්ලි නැහැ. හාල් සේරුව රුපියල් එකසිය ගණනට ගිහිල්ලා. ඩොලර් එක පාවෙන එක හිර කරගෙන ඉන්නවා. රටේ සල්ලි එළියට ආලා.

**0329**

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අනේ ඒ කාලයේ ඩයිරි ගහන්න -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, මේ මොකක්ද? අපේ මේසයට කවුද මේක එව්වේ? මේකේ තිබෙන්නේ මොකක්ද? සුරංගනා කථා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේක චින්තනයක් නොවෙයි.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

බලගතු ශ්‍රී ලංකාවක් යහපත් ආර්ථිකයක්. මොකක්ද මේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

36(1) කියලා කාලය දෙන්න බැහැ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මොකක් නිසා මේක දුන්නාද දන්නේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එතුමා වෙලා ගිහින් ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඉස්සෙල්ලා කියවන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මේකේ සුරංගනා කථා තිබෙන්නේ. ලංකාවේ මිනිහෙකුට හාල් සේරුවක් ගන්න විධියක් නැහැ. හාල් සේරුවේ මිල ඉහළ යනවා. සුරංගනා කථාවක් ඉදිරිපත් කරනවා. මොකක්ද මේක. අද ඩොලර් එක -

**0330**

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේක චින්තනයක් නොවෙයි.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මේ රට මෙහෙම ගෙනි යන්නේ කොහොමද?

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඕවා දැක්කාම හරි අමාරුයි නේද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මේ තනිකර බොරු.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

සංවර්ධනය දැක්කාම අමාරුයි නේද?

[සභාවේ ඝෝෂා]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

විහිළු කථා. සුරංගනා කථා මේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, මේක එව්වේ ඇයි? අපි දැනගන්න ඕනෑ. හේතුව මොකක්ද කියලා.

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මීට කලින් දැකලා නැහැ නේ?

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

මීට කලින් දැක්කේ බැනරුයි, සල්ලියි විතරයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේ සුරංගනා කථා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

සුරංගනා කථා. මේ පොත මොකක්ද? කවුරු හරි පොඩි ළමයෙක්ගේ සුරංගනා කථා පොතක්ද දන්නේ නැහැ. මොකක්ද කියලා සොයා ගන්න බැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මේක කොහොමද අපේ මේසය උඩට ආවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

කිසි එලක් නැති දෙයක් මේක.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, අපි සභාවට ඇවිල්ලා වෙලාවට න්‍යාය පත්‍රයකට වැඩ කරන්න. ඒ අනුව තමයි -

[සභාවේ ඝෝෂා]

අපේ වරප්‍රසාද කඩ වෙනවා.

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, මෙතුමන්ලාට මොනවා හරි කථා කරන්න ඕනෑ නම් වෙලාව වෙන් කරගෙන කථා කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපේ වරප්‍රසාද කඩ කරන්න දෙන්න බැහැ.

**0329**

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර දෙන්නම වාඩි වෙන්න. මෙතුමිය 36(1) යටතේ කථා කරනවා. වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතුමියට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු මන්ත්‍රීතුමිය කියන්න. ඔබතුමියගේ වරප්‍රසාදය කියන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ඉතාම ගෞරවයෙන් සඳහන් කරනවා. මේ පළාත් සභාවට අපි කාලය වෙන් කරගෙන පැමිණෙනවා. මේ පළාත් සභාව තුළ න්‍යාය පත්‍රයක් තිබෙනවා. ඒ න්‍යාය පත්‍රය අනුව කටයුතු කරන්න ඕනෑ. මේ හිතෙන හිතෙන වෙලාවට වරප්‍රසාද ප්‍රශ්න කියලා අපේ කාලය නාස්ති කරනවා. එතකොට අපි මෙතැන ඇවිල්ලා ඉඳගෙන ඉන්නවා. ඒ නිසා කරුණාකර න්‍යාය පත්‍රයට වැඩ කරන්න. නැත්නම් අපේ වරප්‍රසාද උල්ලංඝණය වෙනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

වරප්‍රසාදයක් තමයි අපි අහන්නේ. මේවා කොහොමද අපේ මේසය උඩට ආවේ. අපි වරප්‍රසාද ප්‍රශ්නයක් තමයි අහන්නේ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

[සභාවේ ඝෝෂා]

**0330**

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න. දිගින් දිගටම ගියොත් සභාව ගෙනි යන්න බැහැ. කරුණාකර වාඩි වෙන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මේ සේරම බොරු. වැඩක් ඇති දේවල් නොවෙයි. මේවා වෙනවා නම් හොඳයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඩයිරි ගැහුවේ කවුද? කැලැන්ඩර් ගැහුවේ කවුද?

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

36(1) කියලා කථා කරන්න ගියාම -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, 36(1).

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේවා ගහලා තිබෙන්නේ රට ගැන. කැලැන්ඩර් ගැහුවේ කවුද?

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

කැලැන්ඩර් ගැහුවේ දින බලන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මේකේ තිබෙන්නේ හම්බන්තොට වරාය සහ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කැලැන්ඩර් ගැහුව නිසා නේ ගෙදර යැව්වේ. දැන් මොකටද මේවා ගහන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි,

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් හරි.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

36(1).

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

09 වැනි ප්‍රශ්නය. මංජුල ප්‍රසන්න ගරු මන්ත්‍රීතුමා විසින් මාර්ග ප්‍රවාහන ගරු අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**09.**

**මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/12)**

අ. දෙල්ගොඩ මහා බස් නැවතුම්පොල ඉදි කර ඇත්තේ ඔබ අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ ද?

ආ. එම බස් නැවතුම්පල සාදා නිම කරන ලද්දේ කුමන ආයතනයක් විසින්ද?

ඇ. මෙම බස් නැවතුම්පල සකස් කිරීමට ප්‍රතිපාදන ලබා දී ඇත්තේ කුමන අමාත්‍යාංශයකින්ද ?

ඈ. ප්‍රතිපාදන මුදල කොපමණද?

ඉ. එම බස් නැවතුම්පලේ සියළු වැඩ අවසන් වී ඇත්ද?

ඊ. තවත් නිම කිරීමට වැඩ කොටස් ඉතිරිව තිබේද?

උ. ඒ මොනවාද?

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

අ. ඔව්.

ආ. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින්.

ඇ. බස්නාහිර පළාත් ප්‍රවාහන අමාත්‍යාංශය මගින්

| වසර | අමාත්‍යාංශය | මුදල් මූලාශ්‍රය |
|---|---|---|
| 2008 | පළාත් ප්‍රධාන හා ප්‍රවාහන අමාත්‍යාංශය | අමාත්‍යාංශ අරමුදල |
| 2010 | පළාත් ප්‍රවාහන අමාත්‍යාංශය | පරිපූරක වැඩ සටහන |
| 2012 | පළාත් ප්‍රවාහන අමාත්‍යාංශය | පළාත් නිශ්චිත වැඩ සටහන |

ඈ. රු. 33,287,766.93 යි.

ඉ. ඔව්.

ඊ. නැත.

උ. අදාළ නැත.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු සභාපතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය. මම හිතන්නේ, මේ බස් නැවතුම්පොළ ඉදි කිරීමේදී බස් නැවතුම් පොළේ වැඩ සම්පූර්ණයෙන්ම අවසානයි කියලා ගරු අමාත්‍යතුමා කිව්වා. මම හිතන්නේ, ඒක අසත්‍යයක්. මම ඊයේත් මෙය ගිහින් පරීක්ෂා කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විස්තර කරන්න බැහැ. ප්‍රශ්න අහන්න.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු සභාපතිතුමනි, මේ බස් නැවතුම් පොළේ ඉහළ මහලේ ටයිල් සහ දොරවල් සවි කරලා නැහැ. මේක සම්පූර්ණයෙන්ම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය කෙටියෙන් අහන්න කෝ.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ඒ නිසා ඔබතුමා එහි ඉතිරි වැඩ කොටස කරන්න ඉක්මණින් කටයුතු කරනවාද?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

එසේ අඩුපාඩු තිබෙනවා නම් එය ඉදිරියේදී කරනවා.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

විශාල අඩුපාඩු තිබෙනවා. වැඩ ඉවරයි කියලා කිව්වා, ගරු සභාපතිතුමනි. වැඩ ඉවර නැහැ නේ? ඒ වාගේම ගරු සභාපතිතුමනි, දෙවැනි ප්‍රශ්නය තමයි මේ දෙල්ගොඩ නගරයේ රාත්‍රියට සවස 06.00, 06.30 වන විට බස් එකක් නැහැ. මේ සභාවේදී මමයි ගුණසිරි ජයනාත් ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමයි නිතරම කථා කරනවා. සවස 06.00, 06.30 න් පසුව දෙල්ගොඩ 234 මාර්ගයේ ගරු අමාත්‍යවරයා මැදිහත් වෙලා රාත්‍රියට බස් සේවයක් ඉදිරියේදී ආරම්භ කරන්න කටයුතු කරනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

234 බස් මාර්ගයේ සවස 06.30 න් පසුව ප්‍රවාහන පහසුකම් දෙනවාද?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ඉදිරියේදී සාකච්ඡා කරලා ඒක -

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ඉදිරියේදී සාකච්ඡා කරලා විසඳුමක් දෙන්න. ඒක මිනිසුන්ගේ විශාල ප්‍රශ්නයක්.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

හොඳයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක් නැහැ නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා මේ සභාවේ සභාපතිතුමාද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඔව්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. ඔබතුමා ඉතින් අහන්න කෝ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අයියෝ ඒකවත් දන්නේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම දන්නේ නැහැ. ඔබතුමා මේ සභාවේ සභාපතිතුමා නම් මෙවැනි ප්‍රකාශයක් මේ මේසය උඩට බෙදන්න ඔබතුමාට බලය දුන්නේ කවුද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බලය දුන්නේ සභා කටයුතු කාරක සභාව. වෙන කවුරුත් බලය දුන්නේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේකේ මුද්‍රණකරුවෙක් නැතිව ඒ වගකීම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කියන්න කෝ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ වැදගත් සභාවකට මෙවැනි - මෙවැනි ප්‍රකාශයක් බෙදීම සම්බන්ධයෙන් ඔබතුමා වගකීමෙන් පැහැර හැර තිබෙනවා කියලා ඔබතුමා දන්නවාද? මන්ත්‍රීවරුන්ට මෙහෙම ප්‍රකාශයක් බෙදනකොට ආයතනයක නමක් තිබෙන්න ඕනෑ. නැත්නම් මුද්‍රණකරුවෙක් ඉන්න ඕනෑ. ඒ මොකක්වත් නැතිව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේවා කියන කොට ඔබතුමා උදේ ආවේ නැහැ නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෙවැනි ප්‍රකාශයන් නිකුත් කිරීම ඔබතුමා සම්පූර්ණයෙන් මේ සභාවට කරන අපහාසයක් කියලා තමයි මම දකින්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා උදේ ආවේ නැති නිසා අහගෙන සිටියේ නැහැ. ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මෙම ප්‍රකාශනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ මූලික මිනිස් අයිතිවාසිකමක් විධියට තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිඅරගෙන තිබෙනවා. ඒ තොරතුරු දැන ගැනීමේ අයිතිය පනත් කෙටුම්පතක් විධියට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා ඒක නීතියක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ රටේ අනාගත සංවර්ධනය පිළිබඳව, අනාගත සැලසුම් පිළිබඳව, මේ රටේ ආර්ථිකය පිළිබඳව මේ සභාවේ ඉන්න සියලුම ගරු මන්ත්‍රීවරුන්ට දැන ගැනීමේ අයිතියක් තිබෙනවා. ඒ නිසා මේ වරප්‍රසාදය අපට ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ඔබතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. සභා ලේකම් කාර්යාලයටත් අපි ස්තුවන්ත වෙනවා. මෙයින් අපට තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කරලා තිබෙනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, මෙතුමා කියන එක සම්පූර්ණයෙන් වැරැදියි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒකෙන් කාගෙවත් වරප්‍රසාද කඩ වෙලා නැහැ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මෙතුමා කියන්නේ වෙන දෙයක්. මේ වාගේ පොතක් -

[සභාවේ ඝෝෂා]

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

බේරුවල මුස්ලිම් මිනිස්සු ටික මරලා ඉවර වෙලා -

[සභාවේ ඝෝෂා]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

එහෙම අපේ මේසේ උඩ තියන්න බැහැ. මේක කවුරු නිකුත් කළාද? කවුරු එව්වාද? අපි ඒවා දැනගන්න ඕනැ. එහෙමනම් ඉතින් ඕනැ දෙයක් ගෙනත් දායි නේ මේසේ උඩට. කිසිම වගකීමක් නැතිව. මේකේ තේරුම මොකක්ද?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ජනාධිපතිතුමායි, අගමැතිතුමායි මෙය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අගමැතිතුමා කියන තරම් බොරු ටික මේකේ දාලා අපේ මේසේ උඩ දැම්මාම මිනිස්සු නොමග යවන වැඩක් මේ කරන්නේ.

[සභාවේ ඝෝෂා]

මේ රටේ මිනිහෙකුට හාල් කිලෝ එකක් ගන්න විධියක් නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඔබතුමා ගත්ත මේ ක්‍රියාමාර්ගය හරියට හරි.

[සභාවේ ඝෝෂා]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මොකක්ද මේ කරන්නේ?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

අපට තොරතුරු දැන ගැනීමේ අයිතියක් තිබෙනවා.



**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

තනිකර මේක මිනිස්සු නොමඟ යවන වැඩක්. පළාත් සභාවට මේක ආවේ කොහොමද කියලා අපි දැනගන්න ඕනැ.

[සභාවේ ඝෝෂා]

දේශපාලන බොරු, මේවා එහෙම මේ මේසය උඩට එවන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මේ රටේ අනාගතය -

[සභාවේ ඝෝෂා]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා රට යන්න අවසර දෙන්නය කියලා පොලිසියෙන් සමාව ගත්තා.

[සභාවේ ඝෝෂා]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මේක කොහෙන්ද ආවේ.

[සභාවේ ඝෝෂා]

තේරුමක් නැති වැඩක් මේ.

[සභාවේ ඝෝෂා]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඔබතුමා සභාපති හැටියට ගත්ත තීරණය හරියටම හරි. මේක දැනගන්න අපට අයිතියක් තිබෙනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අපට ගැටලුවක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, අපි ඔබතුමාගෙන් උත්තරයක් බලාපොරොත්තු වෙනවා. මේක මොකක්ද? මේක මොන හේතුවක් උඩ මෙතැනට ආවද? එහෙම නැත්නම් -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

හොරුන්ට අමාරුයි වාගේ.

[සභාවේ ඝෝෂා]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

කැළෑ පත්තරයක් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බලගතු ශ්‍රී ලංකාවට ජය වේවා.

[සභාවේ ඝෝෂා]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අපට මේක දැනගන්න ඕනෑ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාගේ -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, තර්කය බොහොම පුස්සක්. මේකේ බොහොම පැහැදිලිව තිබෙනවා. ශ්‍රී ලංකා මුද්‍රණ දෙපාර්තමේන්තුව. රජයෙන් තමයි මේක මුද්‍රණය කරලා තිබෙන්නේ. ඔළුවක් නැහැ වාගේම ඇස් දෙක පෙනෙන්නෙත් නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගහලා තිබෙන්නේ කොහේද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බලගතු ශ්‍රී ලංකාවට ජය වේවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කැළෑ පත්තරයක් නොවෙයි.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මේ වාගේ කතන්දර පොත් ඕනෑ තරම් තිබෙනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මේ අයිතිවාසිකමක් -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මොන අයිතිවාසිකමක්ද?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

රටේ අනාගතය දැනගන්න එක අපේ අයිතිවාසිකමක්.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

සුරංගනා කථා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩි පැහැදිලි කිරීමක් කරන්න පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න කෝ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, අර මයික් එක on කරලා තිබෙන්නේ මොකද?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා -

[සභාවේ ඝෝෂා]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔබතුමා පොලීසියට ගිහිල්ලා සමාව ගත්තා නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෙවැනි ප්‍රකාශයන් නිකුත් කරන්න, කැළෑ පත්තරයක් හා සමාන ප්‍රකාශයක් නිකුත් කිරීම සම්බන්ධව අපි කනගාටු වෙනවා. මොකද හේතුව 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා, ඒ පළාත් සභා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සිල් රෙදි බෙදුවේ කවුද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පළාත් සභාව ඔබතුමාගේ නායකත්වයෙන් තිබෙන හැටි, කොළයක් බෙදන හැටි. ඒකේ නීති උපදෙස් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න. මේක හරි ප්‍රශ්නයක් නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෙවැනි පත්‍රිකා නැවත බෙදන්න එපා කියලා කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, මේ සම්බන්ධව මම පොඩි පැහැදිලි කිරීමක් කරන්නම්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මේ බලගතු ශ්‍රී ලංකාවක් සැලසුම් සහගත ගමනක්, කාටත් යමක් කමක් ලැබෙන ආර්ථිකයක් කියන පොත මේක එවලා තිබෙන්නේ අග්‍රාමාත්‍ය කාර්යාලයෙන්. ඔබතුමා අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් එවපු ලිපිය සඳහන් කළා. මෙතුමා ගිහිල්ලා පොලිසියෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට තේරෙනවා. පැහැදිලි කිරීමක් -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා ගිහින් පොලිසියෙන් සමාව ගත්තා. රට යන්න ඕනෑ නිසා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න කෝ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් ලිපියක් එව්ව පලියට මේ සභාවට එවන්න පුළුවන්කමක් නැහැ. අපේ සභාවට එවනවා නම් -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඇයි බැරි? කොහෙද නීතිය තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

රජයේ නිවේදන එවන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මේ සම්බන්ධව පොඩි පැහැදිලි කිරීමක් කරන්නම්. මට අවස්ථාව දෙන්න. කරුණාකර නිශ්ශබ්ද වන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වෙලා ගිහින් ඇවිල්ලා. වුණු දේ දන්නේ නැහැ.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, පිළියන්දල පොලිසීයේ පැමිණිල්ලක් තිබෙනවා. ඇමැතිවරයෙක් කාන්තාවක් පැහැරගෙන ගියා කියලා. ඒකත් තවම විභාග කරලා නැහැ. දැන් මාස තුනක් වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇමැතිවරයෙක් ?

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ඇමැතිවරයෙක්. දැන් ඉන්න ඇමැතිවරයෙක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක පස්සේ ගන්න කෝ.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

අර සුවාරපොල හන්දියේ පැමිණිල්ල දාලා තිබෙන්නේ. තමන්ගේ කාන්තාව පැහැරගෙන ගියා කියලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔබතුමාගේ භාර්යාවද අරගෙන ගිහින් තිබෙන්නේ.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

මේ දක්වා ඒකට විභාගයක් කළාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න කෝ.

[සභාවේ ඝෝෂා]

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

තවම විභාගයක් නැහැ. මාස දෙකහමාරක් වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපේ ගරු සභානායකතුමා කරුණාකර වාඩි වෙන්න කෝ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

හිතට අමාරුයි. කෑ ගහනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභානායකතුමා, ඔබතුමා අපේ සභා නායකතුමා. කරුණාකර මට ඔබතුමා උදව් කරන්න. නැත්නම් මට මේක පාලනය කරන්න බැහැ. සභානායකතුමයි, ඔක්කොම කෑ ගැහුවාම මේක කරන්න බැහැ. මම මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්නම්. පළාත් සභාවට සාමාන්‍යයෙන් යම් යම් තොරතුරු ලැබෙනවා. පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගෙන් අපට යම්කිසි දැනුවත් කිරීම් වෙනවා. අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් අපට යම්කිසි නිවේදන එනවා. අපේ යුතුකමක් වෙනවා, ඒ ලැබුණු සෑම දෙයක්ම වාගේ අපි ඒ ගැන සාකච්ඡා කිරීමට සභා කටයුතු කාරක සභාවට යොමු කරනවා.

ඒ අනුව තමයි මෙම පොත් පිංචත් සභා ලේකම්තුමාට අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් එවලා තිබෙනවා. මම මුලින්ම උදේ මෙය කිව්වා. PMO/1/Gen කියන ලිපියෙන් පොතක් අපේ සභා ලේකම්තුමාට එවලා තිබෙනවා. අපි මෙය 2017.01.09 වන දිනැති ලිපියෙන් එවා තිබෙන පොත සභා කටයුතු කාරක සභාවට යොමු කළා. තීන්දු ගත්තේ මම විතරක් නොවෙයි. සභා කටයුතු කාරක සභාවේ නොයෙක් පක්ෂවල මන්ත්‍රීවරු සහභාගි වෙනවා. 2017.02.08 සභා කටයුතු කාරක සභාවේදී මේ පොත සම්බන්ධයෙන් සාකච්ඡාවක් කරලා, තීරණයක් අරගන්න මේ පොත සභාවේදී ගරු මන්ත්‍රීතුමන්ලාට බෙදලා දෙන්න. ඉතින් ඔබතුමන්ලාට අයිතියක් තිබෙනවා. මෙය කියවලා බලලා ඔබතුමන්ලා මේ සම්බන්ධයෙන් සෑහීමකට පත් වෙන්නේ නැත්නම් මෙයට එකඟ නැහැයි කියලා ඔබතුමා යෝජනාවක් ගෙනෙන්න. එච්චරයි තිබෙන්නේ. බොරුවට මේ වරප්‍රසාද ප්‍රශ්න කියලා මේ සභාව ඇතුළේ කෑ ගහන්න එපා. කාලය වටිනවා. (බාධා කිරීම්) ඒ නිසා ඕනෑම මන්ත්‍රීවරයෙකුට අයිතියක් තිබෙනවා. මේ පොතේ තිබෙන කරුණු කාරණා පිළිබඳව හොඳට කියවලා බලලා මේ පොතට ඔබතුමන්ලා එකඟ වන්නේ නැත්නම් මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා මගෙන් විවාදයක් ඉල්ලන්න. මම අවස්ථාව දෙන්නම්. මෙතැනදී බොරුවට මේ සභාවේ කාලය ගන්න එපා. මේ අපරාධයක් කරන්නේ. ඔබතුමන්ලා මගෙන් විවාදයක් ඉල්ලන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඉවරයි දැන්.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, මේ 2017.02.08 දින සභා කටයුතු කාරක සභාවේදී ද මේ තීන්දුව ගත්තේ. මේ මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය බොහොම පැහැදිලිව තිබෙනවා. ඔබතුමා අවසර දෙනවා නම් මේ සභාවට කියවන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තිබෙනවා. නැහැ, නැහැ. ඕනෑ නැහැ. මම කියවන්නම්.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ලැජ්ජයි. කවුද මේකේ ඉන්නේ කියලා බලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

10 වැනි ප්‍රශ්නය. නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**10.**

**නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/13)**

අ. i. කළුතර අධ්‍යාපන කලාපයේ පානදුර කොට්ඨාශයේ වාද්දුව මධ්‍ය මහා විද්‍යාලය ද්විතියික පාසල් ව්‍යාපෘතියට ඇතුලත් කර ඇති බව දන්නේද ?

ii. ඒ කුමන වර්ෂයේ සිටද ?

ආ. i මෙම ද්විතීයික පාසලට ඇතුලත් කර ඇති පෝෂක පාසල් ප්‍රමාණය කොපමණද ?

ii එම පාසල් මොනවද ?

iii එම පාසල්වල 5 ශ්‍රේණියේ සමාන්තර පංති ප්‍රමාණය කොපමණද ?

ඇ. ද්විතීයික පාසල් ව්‍යාපෘතිය යටතේ වාද්දුව මධ්‍ය මහා විද්‍යාලයට භෞතික සම්පත් ලබාදී තිබේද? ඒ මොනවාද ?

ඈ. i ඔබ අමාත්‍යාංශය මගින් මෙම විද්‍යාලයේ නව තෙමහල් ගොඩනැගිල්ලකට අත්තිවාරම් දමා ඇති බව දන්නේද ?

ii ඒ කවදාද ?

iii ඒ සඳහා අනුමත වූ මුදල කොපමණද ?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අ. i. ඔව්.

ii. 2010 වර්ෂයේ දෙසැම්බර් මස සිට.

ආ. i පාසල් 03 යි.

ii වාද්දුව ප්‍රාථමිකය, මොල්ලිගොඩ ප්‍රාථමිකය, පෝහද්දරමුල්ල ප්‍රාථමිකය.

iii වාද්දුව ප්‍රාථමිකය 03
මොල්ලිගොඩ ප්‍රාථමිකය 03
පෝහද්දරමුල්ල ප්‍රාථමිකය 01

ඇ. ඔව්. මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාරය හා එයට අවශ්‍ය භෞතික සම්පත්

ඈ. i ඔව්.

ii 2015 දෙසැම්බර් මස.

iii රුපියල් මිලියන 04 යි.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය තමයි, ද්විතියික පාසල් ව්‍යාපෘතිය තුළ පාසල්වලට ගොඩක් දේවල් දෙනවා කිව්වා නේ. ඒ කියන්නේ Swim pool දෙනවා කිව්වා. ගණිතාගාර, භාෂාගාර ගොඩක් දේවල් දෙනවා කිව්වා. මේ පාසලට දීලා තිබෙන්නේ විද්‍යාගාරය විතරයි. ඒ දෙනවා කිව්ව ඒවා තුළ මහින්දෝදය විද්‍යාගාරය විතරයි දීලා තිබෙන්නේ. මේ දෙනවා කිව්ව භෞතික සම්පත්වලින් දීලා තිබෙන්නේ එකක් පමණක් කියලා ඔබතුමා පිළිගන්නවාද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඔව්. ඔව්. පිළිගන්නවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

මම ඔබතුමාගෙන් අහන දෙවැනි ප්‍රශ්නය. මේ පෝෂක පාසල් තුනක් ඔබතුමා නම් කළා. වාද්දුව ප්‍රාථමික විද්‍යාලයත්, පොහද්දරමුල්ල විද්‍යාලයත්, මොල්ලිගොඩ ප්‍රාථමිකයත්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

වාද්දුව ප්‍රාථමිකය, මොල්ලිගොඩ ප්‍රාථමිකය, පොහද්දරමුල්ල ප්‍රාථමිකය.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

මේ පාසල් තුනේම පන්ති හතක් තිබෙනවා. ඔබතුමා නම් කළා. මේ පන්ති හතට ළමයින් 40 ගණනේ ආවත් ළමයින් 280 ක් වෙනවා. ගිය මාසයේ මේ ළමයින් සමත් වෙලා හයට එන්න ඕනෑ, වාද්දුව ද්විතික පාසලට. මේ ළමයින්ට පන්ති කාමර නැතිව මාසයක් ගෙදර සිටියා. මේ ළමයින් 280 ක්. පන්ති හතක දරුවන්. මේ දරුවන්ට ලොකු අසාධාරණයක් වෙලා තිබෙනවා කියලා ඔබතුමා පිළිගන්නවාද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

පැහැදිලිවම පිළිගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ළමයින් 280 ක් ගෙදර සිටියාම පිළිගන්න වෙනවා නේද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේ සභාවේ මම බොරු කියන්න කැමැති නැහැ.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

මේ ළමයින් මාසයක් ගෙදර සිටියා. ඔබතුමා ගොඩනැගිල්ලක් හදන්න -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේ එකක් කියනවා. සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මේ කයිය ගහනවා. මොනවද මේ කරන්නේ? මට කථා කරන්න දෙන්නෙත් නැහැ. කථා කළොත් හැම එකකටම කට දානවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා හිනා වෙන්න එපා. පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අනික් එක එතුමා කැමැති නැහැ, කළුතර නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා lead වෙනවාට එතුමා කැමැති නැහැ. ජේ.වී.පී. එකේ කැපිල්ල තමයි.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ළමයින් 280 ක් මාසයක් ගෙදර ඉඳලා තිබෙනවා. අවුරුදු තුනක් තිස්සේ ගොඩනැගිල්ලකට ෆවුන්ඩේෂන් දාලා තිබෙනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

පැහැදිලිවම දන්නවා.



**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ලබන අවුරුද්දෙත් ළමයින්ට ඔය අසාධාරණය වෙනවා. මේ වසර තුළ මේ ගොඩනැගිල්ල ඉදි කරලා දෙනවාද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ලැබිලා තිබෙන මුදල් ප්‍රමාණයන් සම්බන්ධව - ගරු සභාපතිතුමා, පැහැදිලි කිරීමකට මට විනාඩියක් දෙන්න. එතුමා බොහොම කැපවීමකින් මේ වාගේ කටයුතු කිහිපයක් මට ඉදිරිපත් කරලා තිබෙනවා. මේ සභාවේ ඉදිරිපත් නොකළත් මට වාචිකව ඉදිරිපත් කරන හොඳ මන්ත්‍රීවරයෙක්. ඉතින් මට මුදල් ලැබෙන ප්‍රමාණයත් එක්ක - මම ඊයෙත් සාකච්ඡාවක් තිබ්බා. උපරිම සාධාරණත්වය ඉෂ්ට කරනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු ඇමැතිතුමා මෙහෙමයි. දැන් මේ වසරේ ළමයින් 280 ක් මාසයක් ගෙදර සිටියා නේ. ලබන අවුරුද්දෙත් ඒකම වෙයි. පන්ති දෙක තුනක් කරලා තමයි මේ මාසයක් ගෙදර හිටපු ළමයින් ඇතුළත් කළේ. ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරන්නේ. මේ වසර ඇතුළත මේ ගොඩනැගිල්ල හැදුවොත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ! ඔහොම යන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

බොහොම ස්තුතියි. ඉල්ලීම භාර ගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අධ්‍යාපන ප්‍රශ්නයක් නිසා මම කාලය දුන්නේ. දරුවන් මාසයක් ගෙදර හිටපු නිසා මම ඔබතුමාට කාලය දුන්නේ. එතුමා කිව්වා නේ දරුවන් මාසයක් ගෙදර සිටියා කියලා.

ඒකයි මම එතුමාට කාලය දුන්නේ. ගරු ඇමැතිතුමා ඔබතුමා වහාම ඒ සම්බන්ධයෙන් පියවරක් ගන්න. දරුවන් සම්බන්ධයෙන් ප්‍රශ්නයක්.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මාසයකදී ගොඩනැගිලි ඉදි කිරීමේ විශ්ම කර්ම ක්‍රමයක් ලංකාවේ කොහෙවත් නැහැ. මම එතුමාත් එක්ක අවංකව සාකච්ඡා කරලා හොඳ සහයෝගයක් දීලා මේ ප්‍රශ්නය විසඳන්න උපරිම උත්සාහ කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. බොහොම ස්තුතියි. 11 වැනි ප්‍රශ්නය සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**11.**

**සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/14)**

අ. ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ දේපල සඳහා වන ඔප්පුවක් ලියාපදිංචි කිරීම අනිවාර්ය කාර්යයක් නොවන බව ඔබතුමා පිළිගන්නේද ? නොඑසේ නම් මන්ද ?

ආ. කරුණු එසේ තිබියදී බස්නාහිර පළාතේ ආදායම් කොමසාරිස්වරයා විසින් රු. 3000/- ක මුද්දර ගාස්තු නොගෙවීමට අදාලව වර්ෂ 2017 ජනවාරි මස අංක WPC/SD/LR/17/U 1177 යටතේ බී. පර්ල් පෙරේරා වෙත ලිපියක් යවා ඇති බව ඔබතුමා පිළිගන්නේද ?

ඇ. එකී ලිපිය මගින් බී.පර්ල් පෙරේරා වෙත වගකීම් පැවරීම නීති විරෝධි බව ඔබතුමා පිළිගන්නේද ?

ඈ. එකී ලිපියේ සඳහන් මුදල ප්‍රසිද්ධ නොතාරිස් කඳුරුවාන ඥානසිරි විසින් ගෙවිය යුතු බව ඔබතුමා පිළිගන්නේද ?

ඉ. උක්ත නොතාරිස්වරයා මිය ගොස් ඇත්නම් එහි වගකීම පැවරෙන්නේ කාහටද ? යන්න පැහැදිලි කළ හැකිද ?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. ඔව්.

ආ. ඔව්.

ඇ. නැත.

ඈ. නැත.

ඉ. 1990 අංක 06 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තියේ 51 (අ) වගන්තිය අනුව පැවරීමේ සාධන පත්‍රයක් සඳහා මුද්දර ගාස්තු ගෙවිය යුත්තේ ප්‍රදාන ලාභියා විසිනි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමාගේ අවසරය ඇතිව අතුරු ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඔබතුමා අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා. මෙම ප්‍රශ්නවලට අදාළව අහන්න. වෙන ඒවාට මට කාලය දෙන්න බැහැ. ගරු ඇමැතිතුමා කිව්වා

වාගේ මේක නරක දෙයක් වන්නේ. ඒ ප්‍රශ්නය අහන ගරු මන්ත්‍රීතුමාත් අතුරු ප්‍රශ්න අහන්න ලෑස්තිව ඉන්නවා. ගරු ඇමැතිතුමා කිව්වා වාගේ -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එතුමා සාමාන්‍ය මන්ත්‍රී කෙනෙක් නම් අතුරු ප්‍රශ්නයක් ඇසීම පිළිබඳව ගැටලුවක් නැහැ. එතුමා මේ රටේ වැදගත්, උගත් නීතිඥ මහත්මයෙක්. එතකොට මෙතුමා දන්නවා, නීතිඥ මහත්වරු මුදල් ගෙවන්නේ නැතිව පැහැර හැරපු වාර්තා මා ළඟ තිබෙනවා. එක නීතිඥයෙක් මිනිස්සුන්ගේ ඔප්පු අරගෙන රුපියල් තිස් දෙලක්ෂ දහනව දහස් දෙසීයක් ගෙවලා නැහැ. එතකොට මේක ඔප්පු ගත්තාම ඔප්පුවේ අයිතිකාරයාට තමයි ඒ ගෙවීමේ වගකීම තිබෙන්නේ. ලෝයර්ට නොවෙයි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

එතුමාගේ පැහැදිලි කිරීම හරි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ නීති ප්‍රශ්නයක් තිබෙන්නේ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

නමුත් ගරු සභාපතිතුමනි, මෙතැන ඇති වෙලා තිබෙන ගැටලුව නීතිඥවරයා මිය ගියාට පස්සේ - අදාළ නීතිඥවරයා මිය ගිය බව ඔබතුමා පිළිගන්නේද? කියලා ඇහුවාම ඔබතුමාගේ උත්තරය ඇවිල්ලා තිබෙන්නේ, "නැත" කියලා. එහෙම නේද? ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මේ නීතිඥවරයා මිය ගිහින් තිබෙන්නේ. නීතිඥවරයා -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය. උක්ත නොතාරිස්වරයා මිය ගොස් ඇත්නම්, එහි වගකීම පැවරෙන්නේ කාහටද යන්න පැහැදිලි කළ හැකිද ? ඒක තමයි කියන්නේ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

එතකොට -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එතකොට 1990 අංක 06 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය 51 (ආ) වගන්තිය අනුව පැවරීමේ සාධන පත්‍රයක් සඳහා මුද්දර ගාස්තු ගෙවිය යුත්තේ ප්‍රදාන ලාභියා විසිනි. මම දුන්න උත්තරය හරි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මම කියන්නේ අදාළ නීතිඥවරයාට අදාළ සේවාදායකයා විසින් ගාස්තුව ගෙවනවා, මුද්දර ගාස්තු ගෙවන්න. එතකොට ගරු සභාපතිතුමනි, නීතිඥවරයා මේ අවස්ථාවේදී මිය ගිහින්. නමුත් 100% ක දඩයක් නීතිඥවරයා මිය ගියාට පස්සේ සේවදායකයාට යොමු කරන එක අසාධාරණ ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි, පනතේ පැහැදිලිවම අදාළ මුද්දර ගාස්තුව ගෙවන්නේ නීතිඥ මහත්මයා දෙවැනි පිටපතට අමුණලා. නමුත් නීතිඥවරයා ඒ කටයුත්ත වෙලා නැත්නම් අදාළ නොතාරිස් ආඥා පනත යටතේ නීතිඥවරයා සම්බන්ධයෙනුයි කටයුත්තක් ගෙනි යන්නේ. ගරු සභාපතිතුමනි, දැන් ඔප්පුවක් ලියාපදිංචි කිරීම අනිවාර්ය නැහැ. එතුමා පළමුවැනි ප්‍රශ්නයෙන් පිළිගත්තා. එහෙමනම් කොහොමද මේක Cancel කරන්න 100% ක දඩයක් ඉල්ලන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සම්බන්ධයෙන් දීර්ඝව සාකච්ඡා කරන්න දෙන්න බැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක පුද්ගලික නීති ප්‍රශ්නයක්. ඒක ඒ දොගොල්ලෝ විසඳන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක මෙතැන බේරගන්න බැහැ. අනික් එක ගරු මහ ඇමැතිතුමා පැහැදිලි උත්තරයක් දුන්නා නේ? 12 වැනි ප්‍රශ්නය. ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**13.**

**රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/16)**

අ. පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ වැඩකටයුතු සඳහා කුලියට ගෙන ඇති වාහන ප්‍රමාණය කොපමණද ?

ආ. එකී වාහනවල ලියාපදිංචි අංක සහ ඒ පිළිබඳව පුද්ගලයන් සමඟ ඇති කරගෙන තිබෙන ගිවිසුම් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද ?

ඇ. එකී එක් එක් වාහනය සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ගෙවන මාසික මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද ?

ඈ. එකී වාහන කුලියට ගෙන ඇත්තේ රියදුරු සහිතවද ? රහිතවද ?

ඉ. දැනට පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සතු වාහන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් මොනවාද ?

ඊ. වාහන කුලියට ගැනීම වෙනුවට වාරික ගෙවීම් යටතේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය නමින් වාහන මිලදී ගැනීම් කළ නොහැකිද ?

උ. නොඑසේනම් ඒ මන්ද ?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

අ. සැහැල්ලු වාහන 17

ආ. ඔව්.
විස්තර අමුණා ඇත. ( ඇමුණුම් අංක 01)

ඇ. විස්තර අමුණා ඇත. ( ඇමුණුම් අංක 02)

ඈ. විස්තර අමුණා ඇත. ( ඇමුණුම් අංක 02)

ඉ. විස්තර අමුණා ඇත. ( ඇමුණුම් අංක 03[9])

ඊ. අධිකාරිය නමින් වාහන ලබාගත නොහැක. පළාත් සභාවට වාහන ප්‍රසම්පාදනය කිරීමට අදාළව නිකුත් කර ඇති ප්‍රධාන ලේකම්ගේ මූල්‍ය චක්‍රලේඛ අංක 12/2016(1) හා ව්‍යාපාර චක්‍රලේඛ 4/2016 යටතේ ඒ සඳහා කටයුතු කරමින් පවතින බව දන්වමි.
චක්‍රලේඛ පිටපත් අමුණා ඇත. (ඇමුණුම් අංක 04[10])

උ. අදාළ නොවේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, අතුරු ප්‍රශ්න ඇසීමේ අයිතිය රඳවා ගන්නවා. මොකද, ඔක්කොම ඇමුණුම්වල තිබෙන්නේ. ඔක්කෝම ඇමුණුම්වලින් පිළිතුරු තිබෙන්නේ. අතුරු ප්‍රශ්න අවශ්‍ය නම් ලබන සභාවේ අසන්න අයිතිය රඳවා ගන්නවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඊළඟ ප්‍රශ්නයත් රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාට යොමු කිරීමේ අවස්ථාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

---

[9] හැන්සාඩ් අංශයේ තබා ඇත.
[10] හැන්සාඩ් අංශයේ තබා ඇත.

**14.**

**රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/17/17)**

අ. කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පීල්ලවත්ත නමැති ගමේ පිහිටි කුඩා වැව ප්‍රතිසංස්කරණය සඳහා පසුගිය පළාත් සභා කාල සීමා දෙක තුළ රජය විසින් වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද?

ආ. එකී ප්‍රතිසංස්කරණයන් හේතුවෙන් ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ මොනවාද?

ඇ. මෙම වැව මගින් ප්‍රදේශයේ වගා බිම් කොපමණ ප්‍රමාණයකට ජලය සැපයෙන්නේද?

ඈ. එකී වැව පිහිටි ඉඩමේ ප්‍රමාණය කොපමණද?

ඉ. එකී ඉඩමෙන් කොටසක් වගා කිරීම සඳහා පුද්ගලයන්ට බදු දී ඇද්ද?

ඊ. i. එසේ බදු දෙන ලද්දේ නම් එම බදු ගිවිසුම් සභාවට ඉදිරිපත් කරන්නේද?

ii. එකී ඉඩමෙන් බදු වශයෙන් රැස් කර ඇති මුදල කොපමණද?

iii. එලෙස බදු දී ඇති පුද්ගලයන්ගේ නම් මොනවාද?

උ. මෙම ඉඩමට අදාළ පිඹුරුපත් තිබේද?

ඌ. එසේ ඇත්නම් එය සභාගත කරන්නේද?

එ. නොඑසේනම් ඒ මන්ද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

අ. පළාත් සභා ප්‍රතිපාදන යටතේ රු. 567,656.95 ක මුදලක් වැය කර ඇත. (වර්ෂ 2004 හා 2005 අවිච්ඡේද)

ආ. වැව් සොරොව්ව, වාන ඉදි කිරීම සහ වැව් බැම්ම ශක්තිමත් කිරීම මගින් වැවේ ජලය රැස් කර තබා ගැනීමට හැකි වීම.

ඇ. හෙක්ටයාර් 16 ක් පමණ
(හෙක්ටයාර් 01 කට අක්කර 2.47)

ඈ. හෙක්ටයාර් 1.4961 ක් පමණ (අක්කර 3.6)
(හෙක්ටයාර් 01 කට අක්කර 2.47)

ඉ. වගා කිරීම සඳහා බදු දී නොමැති අතර, ඵලදාව ලබා ගැනීම සඳහා පමණක් බදු මුදලක් අය කරනු ලැබේ.

ඊ. i. බදු ගිවිසුමක් නොමැත.

ii. රු. 17,950.00 කි.

| **වර්ෂය** | **මුදල (රු.)** |
|---|---|
| 2007 | 250.00 |
| 2008 | 1200.00 |
| 2009 | 1200.00 |
| 2010 | 1400.00 |
| 2011 | 1400.00 |
| 2012 | 2800.00 |
| 2013 | 2700.00 |
| 2014 | 2700.00 |
| 2015 | 2700.00 |
| 2016 | 1600.00 |
| **එකතුව** | **17950.00** |

මිටි ප්‍රභේදයේ පොල් ගස්වල ඵලදාව අඩු වීම නිසා 2016 වර්ෂයේ දී අය කරන ලද බදු මුදල ද අඩු වී ඇත.


iii. ඒ.වී. අමරසේන මහතා

උ. ඔව්.

ඌ. ඔව්. (ඇමුණුම 02)[11]

එ. අදාළ නොවේ.

[11] පිළිතුර අවසානයේ පළ කර ඇත.



**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු ඇමතිතුමනි, මෙම ඉඩම බදු දී ඇති අමරසේන කියන පුද්ගලයා මේ ඉඩම තාප්පයක් ගහලා වෙන් කර ගෙන ගොඩනැගිල්ලක් හදන්න ලැහැස්ති වන බව ඔබතුමා දන්නවාද? මේ බදු දී තිබෙන පුද්ගලයා මේ ඉඩම් කොටස තාප්පයක් ගහලා වෙන් කර ගෙන ගොඩනැගිල්ලක් හදන්න සූදානම් වුණා කියලා දන්නවාද?

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

නැහැ. මම දන්නේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දෙවැනි එක. ඒ බදු මුදල් 17,500 ක් කියලා කිව්වා නේ? වාර්ෂිකවද? මාසිකවද?

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

බදු වශයෙන් රැස් කර ඇති මුදල කොපමණද? ගරු රෝස්

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔව්. දහ හත් දහස් ගණනක් කියලා කිව්වා නේ?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

සම්පූර්ණ මුදල.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක මොන කාර්තුවටද කියලා විස්තරයක් නැහැ නේද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මේක බදු මුදලක් හැටියට නොවෙයි. පොල් ගස් අරවා මේවාට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ගන්න එක. බදු වශයෙන් ලබා දීලා නැහැ එයාට. පොල් ගස් ටික විතරක් ලබා දීලා තිබෙනවා. පොල් කඩා ගන්න පොඩි මුදලක් අය කරනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔබතුමාට තිබෙන බලතල ප්‍රකාරව මෙම පිටස්තර පුද්ගලයින්ට දීලා තිබෙන ඉඩම් ප්‍රමාණය පොදු අයිතියට පත් කිරීමට පියවර ගන්නවාද? මොකද, අනවසර බිල්ඩින් හදලා, තාප්ප ගහලා වෙන් කර ගන්න හදන්නේ. මේක රජයේ -

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

එහෙම ලබා දෙන්න කටයුතු කරන්නේ නැහැ අපි. මේක දැනට -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මධ්‍යම රජයට තමයි කටයුතු කරන්න තිබෙන්නේ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

පොල් ගස් ටික පවා ලබා දීලා තිබෙන්නේ ප්‍රාදේශීය ලේකම්තුමා මාර්ගයෙන්. ඒ පොල්වලින් ගන්න ආදායම පමණයි. ඒක බද්දට ලියලා දීලා නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අවිධිමත් ආකාරයට දීලා තිබෙන්නේ. ඉදිරි කටයුතු අපි නීත්‍යානුකූලව සිදු කරමු. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අංක 15 ප්‍රශ්නයත් එතුමියගේමයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**15.**

**රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/18)**

අ. කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ මහහුනුපිටියේ පිහිටි 'ඇවේන්ද්‍රා' හෝටලයේ ඇතුළුවීමේ සහ පිටවීමේ මාර්ග කාපට් කිරීමේ කොන්ත්‍රාත්තුව පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් භාර ගත්තේ කවදාද?

ආ. එකී කොන්ත්‍රාත්තුව පරිදි වැඩ අවසන් කරන ලද්දේ කවදාද?

ඇ. එකී මාර්ග කාපට් කිරීමට අදාළ වර්ග අඩි ගණන කොපමණද?

ඈ. එකී වර්ග අඩි ප්‍රමාණයට ඇවේන්ද්‍රා හෝටල් හිමිකරුවන්ගෙන් අය කර ගත් මුදල කොපමණද?

ඉ. එකී කොන්ත්‍රාත්තුව භාර ගන්නා විට රජයේ විමධ්‍යගත අරමුදලින් සහ පළාත් අරමුදලින් සිදු කිරීම සඳහා භාර ගෙන තිබූ වැඩ අවසන් කර තිබුණේද?

ඊ. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පාරවල් ඉදි කිරීම, කාපට් කිරීම ඇතුළු වැඩ සිදු කරනු ලබන්නේ ලැබෙන අනුපිළිවෙළක් මතද?

උ. 2016 වසර අවසානයේ වැඩ අවසන් කිරීම සඳහා කාලය ප්‍රමාණවත් නැතැයි පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කළ නැතහොත් හරවා යැවූ ව්‍යාපෘති ගණන කොපමණද?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

අ. පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය මගින් මෙම ව්‍යාපෘතිය ඉටු කර නොමැත.

ආ. අදාළ නොමැත.

ඇ. අදාළ නොමැත.

ඈ. අදාළ නොමැත.

ඉ. අදාළ නොමැත.

ඊ. ඔව්.

උ. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කළ නැතහොත් හරවා යවන ලද ව්‍යාපෘති නොමැත.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අතුරු ප්‍රශ්නයක්. පළාත් මාර්ග සංවර්ධනයේ වාහන එතැන තිබුණා කියලා තොරතුරු ලැබිලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, දැන් මේ හෝටලක් ඇතුළේ පාරක් කාපට් කරලා තිබෙන්නේ. දැන් කියනවා ඒක කළේ නැහැයි කියලා. ඒ වාහන එතැන ගමන් කරලා වැඩ කටයුතු කරපු බවට සාක්ෂි තිබෙනවා. මම ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරනවා. ඔබතුමා ඒ ගැන කිසිවක් දන්නේ නැද්ද?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

නැහැ. මම නම් දන්නේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දන්නේ නැහැයි කියනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාගේ කාලයේ නොවෙයි හෝටලය කාපට් කරලා තිබෙන්නේ. (බාධා කිරීම්)

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

*ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.*
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

## නොපැමිණ සිටීමේ අවසරය
## LEAVE OF ABSENCE

**ගරු සේනක දමයන්ත ද සිල්වා**
Hon. Senaka Damayantha de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "*විජිත් ප්‍රියන්ත ගරු මන්ත්‍රීතුමාට මාස තුනක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි*" යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## අමාත්‍යාංශ නිවේදන/ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
## MINISTRIES' ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊයේ ලංකාදීප පත්තරේ, 20 වැනි සඳුදා. බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරු 45 ක් ස්වාධීන වෙති කියලා වාර්තාවක් තිබෙනවා. ඒක ඇත්ත වශයෙන්ම මේ ඇමතිවරු තුන් දෙනෙකුට විරෝධය කියලත් තිබෙනවා. මගෙත්, ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමාගේත්, රංජිත් සෝමවංශ ගරු ඇමතිතුමාගේත් නම් මේ පත්තරේ තිබෙනවා. රංජන් කස්තුරි කියලා වාර්තාකාර මහත්තයෙක් තමයි මේක කරලා තිබෙන්නේ. මම ප්‍රධාන අමාත්‍යතුමාගෙන්

[ගරු සුමිත්ලාල් මැන්දිස් - අමාත්‍යතුමා]

මේ පිළිබඳව විමසුවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා කිව්වා, එහෙම දෙයක් වුණේ නැහැ. මමත් දන්නවා. වාර්තාකාර මහත්තයා ආණ්ඩු පක්ෂයේ රැස්වීම්වලට එන්නේ නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හෙට මේ වාර්තාව ලංකාදීප පත්තරේ නිවැරදි නොකළොත්, අපි මීට විරුද්ධව නීතිමය කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. පුවත්පත් මණ්ඩලයට දැනුම් දෙනවා. අපි පත්තර වාර්තාකාර මහත්වරුන්ට කියනවා, නියමිත තොරතුරු නොදැන මේ වාගේ මහජනයා නොමග යන දේවල් පළ කරන්න එපාය කියලා. මේ පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කවදාවත් ස්වාධීන වෙන්නේ නැහැ. අපි එක්සත් ජනතා නිදහස් සන්ධානයේත්, අනෙකුත් සුළු පක්ෂ කිහිපයක් එකතු වෙලා මන්ත්‍රීවරු 62 ක් ඉන්න ආණ්ඩු පක්ෂයක් තිබෙන්නේ. ඒ නිසා මේ වාගේ වාර්තා පළ නොකරන ලෙස මම ඉල්ලා සිටිනවා. හෙට මේ වාර්තාව නිවැරදි කරන්නය කියලා දැනුම් දෙන්නය කියලා නියෝජ්‍ය සභාපතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2016 වසරේ පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේත්, මම හිතන්නේ පසුගිය අයවැය විවාදයේදීත් අපි කථා කරපු ප්‍රශ්නයක් ගැන - මොකද, මේ පළාත් සභාවට මූල්‍ය මූලාශ්‍ර අනුව, සමස්ත ප්‍රගතිය අනුව අපට ලැබුණු මුදලක් තිබෙනවා. මිලියන 5370 ක්. පළාත් නිශ්චිත, පළාත් සංවර්ධන, විදේශ අරමුදල් සහ උපමාන පාදක කියන ව්‍යාපෘති යටතේ. ඒ වාගේම 2016.10.31 දිනට මේ මුදල්වල ප්‍රගතිය බැලුවොත් අපි පැහැදිලිව පළාත් නිශ්චිත හැටියට සහ පළාත් සංවර්ධන හැටියට අපි දහයයි තිස් එක්වෙනිදා මේ සභාවේ කථා කළා. ඒ වාගේම දෙසැම්බර් මාසයේ අයවැයේදීත් කථා කළා. අපි පැහැදිලිව ඉල්ලීමක් කළා. මේ සියලු අමාත්‍යාංශවලින් අමාත්‍යවරුන්ට, ප්‍රගතිය අනුව මූල්‍ය ප්‍රගතිය අඩු වෙලා තිබෙනවා. මොකද, පැහැදිලිව ගිය අයවැයේදීත් ප්‍රධාන ලේකම්තුමා ඉදිරිපත් කරපු පොතේ තිබෙනවා, 2014 මූල්‍ය ප්‍රගතිය 77.5% යි. භෞතික ප්‍රගතිය 88.72% යි. ඒ වාගේම 2015 දී මූල්‍ය ප්‍රගතිය 87.46 යි මූල්‍ය ප්‍රගතිය. ඒ වාගේම භෞතික ප්‍රගතිය 92.74 යි කියලා. හැබැයි, 2016.10.31 වන කොට මූල්‍ය ප්‍රගතිය 21.70 යි. භෞතික ප්‍රගතිය 41.5 යි. ඒ නිසා අපි ඉල්ලීමක් කළා, අමාත්‍යාංශ මට්ටමින් මේ වැඩ සටහන්වලට මුදල් ඉතිරි වෙලා තිබෙනවා. මේ මුදල්වලට වැඩ සටහන් ක්‍රියාත්මක කරලා මේ මුදල් සම්පූර්ණයෙන්ම අවසන් කරලා වියදම් කරලා ඉවර කරන්නය කියලා. මොකද, ප්‍රධාන ඇමතිතුමා දන්නවා. ගරු ඔබතුමා මාර්ගයෙන් මතක් කරනවා. සීරෝ බජට් එක අනුව තමයි ගිය අවුරුද්දේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න පටන් ගත්තේ. නමුත් අවුරුද්දේ අන්තිම වෙන කොට, දොළොස් වන මාසේ 31 වැනිදා වන කොට මිලියන 502 ක් මේ බස්නාහිර පළාත් සභාවේ ඉතිරි වුණා. මිලියන 502 න් මිලියන 200 ක් තිබෙන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ. මිලියන 150 ක් තිබෙන්නේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ. මිලියන 50 ක් තිබෙන්නේ, පළාත් මාර්ග අමාත්‍යාංශයේ. මේ අමාත්‍යාංශ තුනේ විතරක් මිලියන 400 ක් ඉතිරි කළා. මේ අධ්‍යාපන ඇමතිතුමා - දැන් මෙතැන නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා කථා කළා. ශ්‍රීනාත් පෙරේරා මන්ත්‍රීතුමා මීට ඉස්සෙල්ලා මේ සභාව තුළ කථා කළා. අපි මුළු අවුරුද්දේම පාසල්වල භාගයට හදපු ගොඩනැගිලිවලට, වැසිකිළි කැසිකිළිවලට ඒ වාගේම තවත් ගොඩනැගිලිවලට අවශ්‍ය දේවල්වලට අපි මුදල් ඉල්ලුවා. මුදල් ඉල්ලුවාම මුදල් නැහැයි කිව්වා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මිලියන 150 ක් කියන්නේ ලක්ෂ 1500 ක්. අවුරුද්ද අන්තිම වෙනකල් ලක්ෂ 1500 ක් මේ පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයට වියදම් කරන්න බැරිව ගියා. ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශයට. අපි වාර ගණනාවක් යෝජනා ඉදිරිපත් කළා. මිලියන 200 ක්. ලක්ෂ 2000 ක්. ගිය අවුරුද්ද තුළ ලක්ෂ 2000 ක් වියදම් කරන්න බැරිව ගියා. ඒ වාගේම පළාත් මාර්ග අමාත්‍යාංශයේ මිලියන 50 ක්, ලක්ෂ 500 ක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පැහැදිලිව කියන්න ඕනෑ. පසුගිය අවුරුදු ගණනාවක් මේ සභාව තුළ හැම කෙනාම කථා කළා. විශාල වශයෙන් මධ්‍යම ආණ්ඩුවෙන් මුදල් අඩු වීමේ ප්‍රධාන හේතුව තමයි දහවැනි මාසේ 31 වැනිදා වන කොට මේ ප්‍රගතිය දැක්වීම. ඒ නිසා තමයි මුදල් අඩු වෙන්න ප්‍රධාන හේතුව. ඒ නිසා අපි ප්‍රධාන ඇමතිතුමාට මතක් කරනවා. මේ අවුරුද්දේ මේ වාගේම - මොකද, ගිය අවුරුද්දේ මිලියන 200, 150 මේ අමාත්‍යාංශවලින් ඉතිරි වෙන කොට මීට මුදල් ඉතිරි වුණා. ඒ මුදල්වලට මීට ඉස්සර

[ගරු මෙරිල් පෙරේරා]

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මේ සභාවට ඉදිරිපත් කළා. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, මෙය ඔබතුමාගේ අවධානයට ගන්නය කියලා අපි ඉල්ලීමක් කරනවා. 2016.12.15 වැනිදා අධ්‍යාපන අමාත්‍යාංශයේ මිලියන 18.4 ක් ලක්ෂ 184 ක් අරිනවා කලාප 11 ට පුස්තකාල -පාසල් පාදක ගුරු ධාරිතා සංවර්ධන අරමුණු කර ගත් ගුරුවරුන්ගේ භාවිතය සඳහා අධ්‍යාපන මෙවලම් Learning Material වලට අධ්‍යාපන ලේකම්තුමා අරිනවා මේ උපකරණ ගන්නය කියලා. ඒ වාගේම නොවිධිමත් අධ්‍යාපනයට දෙසැම්බර් මාසේ 15 වැනිදා මිලියන 20 ක්, ලක්ෂ 200 ක් අරිනවා උපකරණ ගන්නය කියලා. මේ බලන්න. ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය වැඩ සටහන්වලට තිබෙන මුදල්. මේ අවුරුද්දේ සල්ලි ඉතිරි වුණාම මොකද කළේ? මුදල් ටික ඇරියා උපකරණ ගන්න. ගරු ප්‍රධාන ඇමතිතුමනි, හැමදාම ගිණුම් කාරක සභාවට එන ප්‍රශ්නයක් තමයි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්නේ නැතිකම. මේ මුදල් යැව්වාම දෙසැම්බර් 15 වැනිදා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්නේ කොහොමද? බඩු ගන්න පුළුවන්කමක් තිබෙනවාද? ටෙන්ඩර් කරලා නීත්‍යානුකූලව ගන්න ගියොත් කාල සීමාව මදී. නමුත් ඇත්ත වශයෙන්ම මේක හිතාමතා - මොකද, අපි මේ ඉන්න මන්ත්‍රීවරු 104 දෙනාම ඉල්ලීම් කරනවා. ආණ්ඩු පක්ෂය, විපක්ෂය වෙන්න පුළුවන්. මේ මුදල් ඉතිරි කරනවා නම්, මිලියන 500 ක් ඉතිරි කරලා තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපට දුන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ වාගේම අනික් කාරණාව තමයි, මේ අමාත්‍යාංශවල උපදේශක කාරක සභා පැවැත්වීම. ගිය අවුරුද්දට අධ්‍යාපන අමාත්‍යාංශයේ මාස 12 ටම උපදේශක කාරක සභා පවත්වලා තිබෙන්නේ 05 යි. මේ අවුරුද්දට තවම උපදේශක කාරක සභා පවත්වලා නැහැ. ජනවාරි මාසේ උපදේශක කාරක සභාව පැවැත්වුවේ නැහැ. ඒ වාගේම මාර්ග, ප්‍රවාහන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභා හතරයි මුළු අවුරුද්දටම පවත්වලා තිබෙන්නේ. ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශක කාරක සභා හයයි. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, මේකට ප්‍රධාන හේතුව උපදේශක කාරක සභා පවත්වන්නේ නැතිව මන්ත්‍රීවරු සහභාගී කරවා ගන්නේ නැතිව, සැලසුම් හදන්නේ නැතිව වැඩ කරන්න බැහැ. මොකද, තමුන් ඇමතිවරයෙක් හැටියට තමුන්ට අවුරුද්දේ වෙන් වෙන විෂයයන්වල මුදල් ටික අවුරුද්ද තුළ වැඩ කර ගන්න බැරි නම්, ඒ අමාත්‍යවරයාගෙන් ඇති වැඩේ මොකක්ද? මේ අමාත්‍යවරු ඉන්නවා. මළ ගෙවල්වල යනවා. ජනවාරි මාසේ Sport meet වල කොඩි උස්සන්න යනවා. එහෙම නැත්නම් අගමැතිතුමා, ජනාධිපතිතුමා එන උත්සවවලට ගිහිල්ලා හිට ගෙන ඉන්න යනවා. එහෙම නැත්නම් විෂය භාර අමාත්‍යවරයා එනවා නම් තමන්ගේ දිස්ත්‍රික්කයට, අමාත්‍යාංශයට ගිහිල්ලා උත්සවවලට සහභාගී වෙනවා. ඒක නොවෙයි. තමුන්ට අවුරුද්ද පුරා වෙන් කර ගත්ත මුදල - පළාත් නිශ්චිත, පළාත් සංවර්ධන, ලෝක බැංකු ආධාර, උපමාන පාදක සංවර්ධන වෙන් කරලා තිබෙනවා නම්, අමාත්‍යාංශයේ නිලධාරීන් එකතු කර ගෙන මාසයෙන් මාසයට වැඩ ටික ක්‍රියාත්මක කරලා මේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන්නය කියන එක අපි ඔබතුමා මගින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

මේ අවුරුද්ද බලන්න. අද වන කොට මුදල් වෙන් කරලා තිබෙනවා. මාස 1 ½ ක් ගියා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා ත්‍රිකුණාමලයට ගිහිල්ලා වැඩමුළුවක් පැවැත්වුවා. වැඩමුළුව පවත්වලා තීන්දු තීරණ ගත්තා. ප්‍රධාන අමාත්‍යාශය, ප්‍රධාන සැලසුම් එකේ අනුමත කරන ව්‍යාපෘති සංඛ්‍යාව දින යන නිසා අමාත්‍යාංශ පහටම බලය විමධ්‍යගත කළා. පළාත් සංවර්ධන මුදල් අනුමත කළේ ගිය අවුරුද්දේ දෙසැම්බර් මාසේ. මේ වන තෙක් මාස 1 ½ යි, දවස් 21 ක් අදට. එක අමාත්‍යාංශයකවත් එක ව්‍යාපෘතියක් අනුමත කරලා නැහැ. මොකක්ද මේ වැඩේ? අපි පැහැදිලිව ඉල්ලීමක් කළා. ජනවාරි මාසේ සිට පටන් ගන්න කොට මුල් මාස හය වැඩ කරමුයි කියලා. එක මන්ත්‍රීවරයෙකුට අනුමත කර ගන්න විධියක් නැහැ.

ඒ නිසා ගරු ප්‍රධාන ඇමතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලා සිටිනවා. මේ වැඩ සටහන ක්‍රියාත්මක කරන්න. විශේෂයෙන් කණ්ඩායම් රැස්වීමේදී මෙතුමා කථා කළා. කණ්ඩායම් රැස්වීම් නියෝජනය කරන්න වුණේ මොකුත් නොවෙයි. කණ්ඩායම් රැස්වීමේදී අහන්න අමාත්‍යවරු නැහැ. ප්‍රශ්නයක් අහන්න අමාත්‍යවරු නැහැ. මාසයකට

දවස් දෙකයි කණ්ඩායම් රැස්වීම තිබෙන්නේ. ඒ කණ්ඩායම් රැස්වීමට සහභාගී වෙන්නේ නැහැ. දැන් සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් ඇහුවා. පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ හෝ මේ පළාත් සභාව 9.30 ට පටන් අරගෙන 1.30 වෙන කල් තිබෙනවා නම්, මේකේ වගකීමක් තිබෙනවා ඇමතිවරයෙකුට වාඩි වෙලා ඉන්න. අහපු ප්‍රශ්නයට උත්තරයක් දෙන්න. තැන් තැන්වලට ගිහිල්ලා තමන්ගේ වැඩ කර ගෙන - දවස් 31 න් 29 ක් තිබෙනවා එළියේ වැඩ කර ගන්න. මේ දවස් දෙක මෙතැන ඉඳගෙන ඉන්න බැරි නම් ඒ ඇමතිකමෙන් ඇති වැඩක් තිබෙනවාද? අද අර ජනතා විමුක්ති පෙරමුණේ නන්දන පද්මකුමාර ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්න ගණනාවක් ඇහුවා. පාසල් ප්‍රශ්න. ගියවර ළමුන් ඇතුළත් කිරීමේදී මධ්‍යම ආණ්ඩුවෙන් ප්‍රතිපත්තියක් දුන්නා ළමයි 40 ට වඩා ඇතුළත් කරන්න බැහැයි කියලා. අමාත්‍යාංශය මොකක්ද කළේ? උපදේශක කාරක සභාවේ තීන්දුවක් ගත්තාය කියලා බොරුවක් කරලා, ළමයි 40 ට වඩා ගන්න බැරි නිසා පන්ති වැඩි කරනවාය කියලා මතයක් අරගෙන ලියුම ඇරලා, ළමයි 40 ට වැඩි පන්තියට පන්තියක් නැතිව, ගුරුවරයෙක් නැතිව 40 ඉන්න සීමා සංඛ්‍යාව පන්තියටම වැඩි කරලා දැම්මා. ඒ නිසා මෙදා පාරත් අහපු ප්‍රශ්නවලට උත්තර දුන්නාට, මේ වන කොට චක්‍රලේඛ අනුව විදුහල්පතිවරු ළමයින් ඇතුළත් කරලා ඉවරයි. ක්‍රියාත්විත ලැයිස්තුවෙන් ඉතිරි ළමයින්ට සමහර පාසල්වල ඇතුළත් කරලා ඉවරයි. අද මෙතුමා ඇහුවා ක්‍රමවේදය මොකක්ද කියලා. ක්‍රමවේදය දැන් ඇතුළත් කරලා තිබෙනවා නියම විධියට. දැන් ඉතිරි ටික තිබෙන්නේ. ඉතිරි ටිකත් මේ වාගේ කාලයෙන් කාලයට - ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ඇහුවා වාගේ ගියොත් ළමයින් ඇතුළත් කරනවා.

මේ වාගේ තමුන්ගේ අමාත්‍යාශ තමුන්ට පාලනය කර ගන්න බැරි නම්, තමුන්ගේ අමාත්‍යාංශයට ලැබෙන මුදල් ටිකට තමුන්ට සැලසුම් කරලා වැඩ කරන්න බැරි නම් එය මේ අමාත්‍ය මණ්ඩලයේ දුර්වලතාවය කියලා කියන්න වෙනවා. මොකද, ආණ්ඩු පක්ෂය කියලා නොවෙයි. අපි මේක හැමදාම මේ සභාව තුළ කථා කළා. උපදේශක කාරක සභා පවත්වන්නේ නැතිව, මන්ත්‍රීවරුත් එක්ක සහභාගී වෙන්නේ නැතිව, මන්ත්‍රීවරුත් එක්ක සාකච්ඡා කරන්නේ නැතිව මේ අමාත්‍ය මණ්ඩලයට මේ ක්‍රමයට වැඩ කරන්න බැහැයි කියන එක අපි පැහැදිලිවම කියනවා.

ඒ වාගේම මේ අවුරුද්ද මුලදී අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කළා. දෙසැම්බර් මාසේ මුදල් අනුමත කළේ. මේ වන කොට තමුන්ට ව්‍යාපෘතියක් අනුමත කරලා දෙන්න පුළුවන්කමක් නැහැ එක මන්ත්‍රීවරයෙකුට. උදාහරණයක් කියන්නම්. ගරු ප්‍රධාන ඇමතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශය කලාපයට අරිනවා ලියුමක්. 2016.09.06 වැනිදා. කලාප මට්ටමින් 2017 ට යෝජනා එවන්නය කියලා. 2016.10.19 වැනිදා. මම මීගමුව කලාපය ගැන උදාහරණයක් පෙන්වන්නම්. 2016.10.19 වැනිදා යෝජනා ටික එවනවා. ගිය අවුරුද්දේ ඔක්තෝබර් මාසේ 19 වැනිදා යෝජනා ටික එවන්නේ අමාත්‍යාංශයට. එතකොට සැලසුම් අධ්‍යක්ෂ මේ වන තෙක් ගරු අමාත්‍යතුමාත් එක්ක සාකච්ඡා කරලා, දෙසැම්බර් මාසේ අයවැයෙන් මුදල් වෙන් කර ගත්තා නම්, දැන් මාස 1 ½ ක් ගිහිල්ලා, තවමත් සැලසුම් ටික ඇවිල්ලා, ඇස්තමේන්තු ටික ඇවිල්ලා මුදල් ටික අනුමත කරලා ඇරලා නැහැ. අන්න ඒ නිසා තමයි අවුරුද්ද අන්තිමට මුදල් ටික ඉතිරි වෙන්නේ. ඒ වාගේම පුහුණු ධාරිතා වැඩ සටහන්.

ඒ වාගේම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කථා කළා. මිලියන 486 ක් වෙන් වෙලා තිබෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, මිලියන 486 ක් වෙන් වෙලා තිබෙනවා. බස්නාහිර පළාතේ පුහුණු ධාරිතා වැඩ සටහන්වලට. ඒ වාගේම PSDG වලින් මිලියන 238 න් මිලියන 150 යි. මිලියන 78 ක් ඉතිරියි. ඒ වාගේම PDG වලින් පළාත් සංවර්ධනවලින් මිලියන 135 ක් ඉතිරියි. මිලියන 213 ක් ඉතිරියි දහ වැනි මාසේ 31 වැනිදා වන කොට. පුහුණු ධාරිතා කියන්නේ, මේ බස්නාහිර පළාත් සභාවේ ඉන්න පුහුණු ධාරිතා කරන වැඩ සටහන්වලට ක්‍රියාත්මක කරන මුදල්. ඒ මුදල් ටික පුහුණුවට ලබන්නේ නැතිව කොහොමද? මුදල් ටිකෙන් පළාත් සභාව ගෙනියන්නේ. අන්න ඒ නිසා අපි ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඔබතුමාට වගකීමක් තිබෙනවා. මේ අමාත්‍ය මණ්ඩලය ගිය අවුරුද්දේ - මම ඒකයි කිව්වේ. 2014, 2015, 2016 දී 21% යි මාස දහයක්. අපි වැඩමුළු තියලා තීන්දු තීරණ ගත්තාට තවමත් අමාත්‍යාංශ ක්‍රියාත්මක නොවන නිසා මේ ගැන අවධානය යොමු කරන්නය කියලා ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම හිතන්නේ, සියලුම මන්ත්‍රීතුමන්ලාගේ අවධානයට යොමු වෙන්න ඕනෑ කාරණාවක් පිළිබඳව කථා කළේ. ඒක ආණ්ඩු පක්ෂය විපක්ෂය කියලා නොවෙයි. සියලු දෙනාම මම හිතන්නේ අවධානය යොමු කරන්නේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මේ සම්බන්ධව. ඒ නිසා -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර වාඩිවෙන්න. පසුව අවස්ථාව - මීළඟට ගුණසිරි ජයනාත් ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම සඳහන් කරන්නට යන්නේ. පසුගිය සතියේ බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සඳහා වාහන ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. මම විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි. ගරු ඔබතුමා මාර්ගයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා. මේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ කාර්යාල සඳහා වාහන ලබා දීමේදී අනුගමනය කරපු ප්‍රතිපත්තිය මොකක්ද කියන එක එතුමා මඟින් දැන ගන්න කැමැතියි. විශේෂයෙන් බියගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයේ ජනගහනය එක් ලක්ෂ අසූ නව දහස් තුන්සිය විසි තුනක් වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය තුළ එක් ලක්ෂ අසූ නව දහස් තුන්සිය විසි තුනක් වූ ජනතාවට සේවාව සැපයීමේදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අනිවාර්යයෙන්ම වාහනයක් අවශ්‍යයි. බියගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට ලබා දී තිබූ වාහනය ඉතාම අබලන් තත්ත්වයේ පවතින, රාජකාරියකට යන්න බැරි, වහළය තෙමෙන ඉතාම අබලන් වාහනයක්. හැම වෙලාවේම කැඩිලා අයින් කරලා තිබෙන තත්ත්වයක් තමයි බියගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය තුළ තිබෙන්නේ.

ඒ වාගේම තමයි බියගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය තුළ බියගම නිදහස් වෙළඳ කලාපයේ 29,000 ක සේවක සංඛ්‍යාවක් ඉන්නවා. ඒ සේවකයින්ටත් මේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් සේවාවන් සපයනවා. ඒ වාගේම ලින්ඩර් කර්මාන්ත ජනපදය කියන එකෙත් තව දහ නව දාහක සේවක සංඛ්‍යාවක් ඉන්නවා. ඒ කොට්ඨාශයටත් මේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයෙන් සේවාව සපයනවා. ඒ වාගේම විසුරුණු කර්මාන්ත ශාලාවලත් ඒ වාගේම සේවකයින් ඉන්නවා. බියගම කොට්ඨාශයේ විශාල කර්මාන්ත ශාලා සංඛ්‍යාවක් තිබෙනවා. මේ සියල්ලටම. මෙහෙම ගත්තාම දෙලක්ෂ පනස් දාහකට වැඩි ජනතාවකට බියගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය තුළ අපේ සෞඛ්‍ය වෛද්‍ය සේවා නිලධාරීන් සේවාව සපයනවා. 2004 වසරේ සිට මේ දක්වා දිගින් දිගටම බියගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට වාහනයක් අවශ්‍යයි කියන කාරණාව ඉල්ලීම් කරලා තිබුණා. එහෙම තිබෙද්දී ගිය සතියේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල පහකට අලුත් වාහන බෙදන වෙලාවේ බියගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමියටත් වාහනයක් දෙන්න එන්නය කියලා, ආපහු හිස් අතින් එතුමියව යවලා තිබුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්නේ. මට දැන ගන්න තිබෙන ආකාරයට දැන් බියගම මැතිවරණ කොට්ඨාශයේ ජනතාව එක් ලක්ෂ අසූ නව දහක් වෙන කොටත් වාහනයක් ලැබෙන්නේ නැහැ. හැබැයි, අසූ දාහක් වුණු ජනතාවක් ඉන්න කොට්ඨාශයට වාහනයක් දෙනවා. මේක බරපතළ අසාධාරණයක්. 2004 සිට -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

කොහේද අසූ දාහක් ඉන්න කොට්ඨාශය?

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ දෙකක් හැටියට බෙදලා බත්තරමුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයට අයත් වෙන්නේ අසූ දාහක පමණ ජනතාවක්. බත්තරමුල්ලට දුන්නා කියන තොරතුරක් මට ලැබිලා තිබෙනවා. සත්‍ය ද කියලා මම දන්නේ නැහැ. මට තිබෙන ආරංචිය. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, කඩුවෙල කොට්ඨාශ දෙකකට බෙදලා. කොහොම වුණත් මොකක් හරි ක්‍රමවේදයක්, පැහැදිලි ක්‍රමවේදයක් අවශ්‍යයි. මේ එක් ලක්ෂ අසූ නව දාහක් වුණු බියගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයේ ජනතාවට සේවය සපයන්න 2004 වසරේ සිට දිගින් දිගටම ඉල්ලීම් කරලා තිබෙද්දී, ඒක නොසලකා හැර ඊට විශාල අඩු ජනගහනක් ඉන්න කොට්ඨාශවලට ගිය සතියේ ඒ වාහන ලබා දීම බරපතළ වරදක් කියන එක මම මේ වෙලාවේ මතක් කරනවා. ඒ නිසා මේ බියගම කොට්ඨාශයේ ජනතාවට සේවා සපයන්න ඉක්මණින් වාහනයක් ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නය කියන කාරණාව ඔබතුමා මාර්ගයෙන් මම ගරු ඇමතිතුමාගේ අවධානයට මම යොමු කරනවා. බොහොම ස්තූතියි.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කවුරු හරි අපේ ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාව නොමග යවලා තිබෙනවා. ජනගහනය ගැන කථා කරන්න ඕනෑ නැහැ. කොළඹ දිස්ත්‍රික්කයට සාපේක්ෂව අපි ජනගහනය ගැන කථා කරන්න ඕනෑ නැහැ. අපේ කොළඹ දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරුන් මටත්, ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමාටත් කථා කළා. මේ කැබ් රථ තුන කොළඹ දිස්ත්‍රික්කයට වෙන් කරපු තුනක්. සෞඛ්‍ය අධ්‍යක්ෂතුමා ගම්පහ දිස්ත්‍රික්කයේ හිටපු නිසා එයා decide කරලා තිබෙනවා එකක් ගම්පහට දෙන්න. එතුමාට decide කරන්න බැහැ. මේ කැබ් රථ තුන ගෙනාවේ කොළඹ දිස්ත්‍රික්කයට. අපේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරු, කොළඹ දිස්ත්‍රික්කයේ අය අපට ලිඛිතව දුන්නා, මේක වෙනස් කළොත් එහෙම අපි උද්ඝෝෂණයක් කරනවාය කියලා. එතකොට අපි මේකට මැදිහත් වෙලා අපි යැව්වා. කවුරු හරි අපේ ගුණසිරි ජයනාත් ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට වැරදි දෙයක් දීලා. ඒක බියගමට දෙනවාය කියලා තීන්දු කරලා තිබෙන්නේ අධ්‍යක්ෂතුමා. නමුත් මේ කැබ් තුනම කොළඹ දිස්ත්‍රික්කයට අයිතියි. දැන් තව කැබ් දෙකක් එනවා. මම හිතන්නේ, අද හෙට එනවා. ආවාම ඒක ගන්න පුළුවන් එහෙට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු සංවිධායකතුමා, එහෙම නම් ඒක ගැටළුවක් නැහැ. ඒ ගැන සෞඛ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා. ඒක සාධාරණ ආකාරයෙන් බෙදා දෙන්නය කියලා.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මේක නොසලකා හැරියා නොවෙයි. මේ කැබ් තුන ඉල්ලලා තිබෙන්නේ, කොළඹ දිස්ත්‍රික්කයට. නමුත් සාධාරණව මේක බෙදන්න හැදුවා දිස්ත්‍රික්ක තුනට. මමත් එකක් බෙදා ගන්න හැදුවේ. නමුත් මමත් ඒක අතහැරියා. ඒ මොකද, අපි සාධාරණව මේක කෙරෙන්න ඕනෑ. මහ ඇමතිතුමාත්, අපේ ගාමිණී තිලකසිරි ගරු ඇමතිතුමාත් මාව දැනුවත් කළා. නමුත් මේක සාධාරණව විසඳෙනවා. ලබන සතිය වන කොට ගම්පහට එකයි, කළුතරට එකයි අපි වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම අපට රාජිත ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් ගිලන් රථ 20 ක් විතර ලැබෙනවා. තව මාසයක් විතරය යයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කුමක් යටතේද කථා කරන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්නේ. මම බස්නාහිර -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට පුද්ගලිකව වුණු දෙයක්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම ගියා කඩේකට හාල් ගන්න. හාල් ගන්න ගියාම ආණ්ඩුවේ නිවේදනයක් තිබෙනවා, සම්බා හාල් 82 වත්, නාඩු හාල් 72 වත් - (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔය සම්බන්ධව අවස්ථාව දෙන්න බැහැ. ඔබතුමාට වෙනම කථා කරන්න දෙන්න තිබුණා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පළාත් සභාවේ මහජන නියෝජිතයෙකු හැටියට මට අයිතියක් තිබෙනවා මේ ගැන කථා කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට වුණු අසාධාරණයක් සම්බන්ධව කථා කරන්න පුළුවන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට මම අහන්න යන්නේ, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය යටතේ ආහාර බෙදා හැරීම් බලය තිබෙන්නේ, අපේ සමූපකාර ඇමතිතුමාට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සමූපකාර ඇමතිවරයාට තමයි ආහාර බෙදා හරින්න බලය තිබෙන්නේ. එතකොට දැන් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒකට අවස්ථාව දෙන්න බැහැ. වෙනම වෙලාවක් දෙන්නම්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් හාල් මිල 110 ට 120 ට යනවා.

[සභාවේ ඝෝෂා]

එතකොට මේ හාල් මිල කන්ට්‍රෝල් කරලා කියලා පාලන මිලක් දාලා තිබෙනවා. 62 යි. 82 යි කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ප්‍රසන්න සංජීව මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව. ඔබතුමා කථාව පටන් ගන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

*[නැඟී සිටියේය. ]*
*[Stood.]*

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් දාලා තිබෙනවා ලේකම්තුමා කොස් කොලයි. මේ කොස් කොළ. ක්‍රෝටන් කොළ -

[සභාවේ ඝෝෂා]

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

අයියෝ. පරණ කේස් එකක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ප්‍රසන්න සංජීව මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපි මන්ත්‍රීවරු හැටියට -

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

කන්න. කන්න. ඕක කන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඡන්ද දායකයන්ට මේ ආණ්ඩුව කන්න දෙන්නේ කොස් කොළ ද? අපේ ආහාර ඇමතිතුමා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ප්‍රසන්න සංජීව මන්ත්‍රීතුමා, කථා කරන්න. ඔබතුමාට විනාඩි 05 ක් තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉස්සෙල්ලාම ඔබතුමා බලන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන අමාත්‍යාංශවල බලතල.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට පුද්ගලිකව වුණු අසාධාරණයක් සම්බන්ධව අවස්ථාව දෙන්න පුළුවන්. ඒ ඇරෙන්න ඔය සම්බන්ධව ඔබතුමා වෙලාවක් ගන්න ඕනෑ කලින්ම.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මෙහෙම කථා කරන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ ඔබතුමාගේ නම නැහැ මෙතැන.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

හාල් කන්ට්‍රෝල් කරලා 82 ටයි 78 ටයි 72 ටයි. නමුත් ගන්න ගියාම නැහැ. ඒ නිසා අපි සමූපකාර -

[සභාවේ ඝෝෂා]

ඒ නිසා මේ එක්සත් ජාතික පක්ෂයේ ඉන්න මේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එක්සත් ජාතික පක්ෂයට සපෝට් කරපු ඒ කණ්ඩායම ඔක්කෝටම ක්‍රෝටන් කොළයි කොස් කොළයි කන්න කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අවස්ථාව.

[සභාවේ ඝෝෂා]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. අපිව එනකොට අතගාලා බලනවා. මේ කොළ ගෙනාවේ කොහොමද?

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ රටේ සිදු වුණු සුනාමි ව්‍යසනයට පසුව පසුගිය 19 වැනිදා මහා දැවැන්ත ව්‍යසනයක් අපේ බේරුවල ආසනයේ කළුතර දිස්ත්‍රික්කයේ සිදු වුණා. බේරුවලින් ආරම්භ කරපු බේරුවල බණ්ඩාරවත්ත ශාන්ත ලාසරස් දේවස්ථානයේ වාර්ෂිකව පවත්වන මේ මංගල්‍ය උත්සවය අවසානයේ හැමදාම යනවා අවුරුද්දකට සැරයක් බෝට්ටු සවාරියක්. ඒ මෑණියන්ගේ දේව පිළිමයත් රැගෙන. බේරුවලින් ආරම්භ කරපු බෝට්ටු 19 ක් පමණ ආරම්භ කරපු මෙම සවාරිය ඇත

[ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව]

මුහුදේ කළුතර දක්වා ගමන් කරද්දී කිලෝ මීටර් පහකට හයකට ආසන්නව එක බෝට්ටුවක් පෙරළුනා. මේ බෝට්ටුව පෙරලෙන්න හේතුව ඒ බෝට්ටුවේ බර නැතිකමත්, ඒ වාගේම මගීන් 50 කට වඩා වැඩි ප්‍රමාණයක් ඒ බෝට්ටුව තුළ නැගී යාමත්, ඒ බෝට්ටුව පදවපු රියදුරු මහතාගේ නොසැලකිලිකමත් හින්දා තමයි මම හිතන්නේ ඒ ව්‍යසනයට ගොදුරු වුණේ. ඒ අවස්ථාවේදී බෝට්ටුවේ 50 ක් පමණ හිටියා. අනික් බෝට්ටුවලින් ආපු කට්ටිය පැනලා තමන්ගේ ජීවිතය පරදුවට තබලා ඒ බෝට්ටුවල හිටිය ධීවරයෝ අනෙකුත් අයව බේරා ගන්න මහා පුදුමාකාර වෙහෙසක්, සටනක් දුන්නා. ඒ අවස්ථාවේදී 30 ක් පමණ ජනතාව බේරා ගත්තා. මේ වන කොට බේරුවල ආසනයේ 12 ක් පමණ සදහටම අප අතරින් වෙන් වෙලා ගිහිල්ලා තිබෙනවා. මම හිතන්නේ, මේකේදී මේ සිදුවීමේදී ඒ අවට හිටපු ධීවරයෝ සිංහල මුස්ලිම් ඒ වාගේම හමුදාව ඒ අවස්ථාවට පැමිණිලා මහත් වෙහෙසක්, මහන්සියක් ගත්තා, මේ සියලු දෙනාවම බේරා ගන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තවත් ජීවිත හතරක් පමණ තවම මේ වන කොට අතුරුදහන් වෙලා තිබෙනවා. මම හිතන්නේ, මේ සිද්ධිය මේ ධීවරයන්ට පමණක් නොවෙයි. අපේ ප්‍රදේශයේ ලංකාවේ සංචාරක කලාපයක් වන මේ ප්‍රදේශයේ බෝට්ටු ගමනා ගමනයේදී අපි නොයෙකුත් ආකාරයේ කරදරවලට මුහුණ පෑවා. නමුත් දිගින් දිගටම මේ ජනතාවට කිව්වත්, කාට කිව්වත් මම හිතන්නේ මේකට ඇහුම්කන් දෙන්නේ නැහැ. තමන් බෝට්ටුවේ ගමන් ගන්නවා නම්, විශේෂයෙන් ජනතාව බෝට්ටුවේ ගමන් ගන්නවා නම්, ඒකට අවශ්‍ය කරන ආරක්ෂක ඇඳුම පැළඳගෙන ඒ ගමනාන්තය දක්වා ගමන් කළා නම් මම හිතන්නේ, හදිසි අනතුරකට පත් වුණොත් මේ ජීවිත බේරා ගන්න පුළුවන්කම තිබෙනවා. අද මේ බෝට්ටුව පදවපු රියදුරු මහත්මයා මේ අයිතිකාර මහත්තයාටත් නොදන්වා තමයි මේ බෝට්ටුව රැගෙන ගිහිල්ලා තිබෙන්නේ. ඒ අවස්ථාවේදී අපට දැන ගන්න ලැබුණා. එතැනදී හදිසියේ ආරක්ෂක අංශය, එතැන ඉන්න navy එකේ අය මේ ගමනා ගමනයට විරුද්ධ වුණා නම්, ඒ පූජාවට ආපු සියලු දෙනාම මම හිතන්නේ වරාය හරි විනාශ කරලා දාන්න පුළුවන් තත්ත්වයටම එනවා. මොකද, මංගල්‍ය උත්සවයක් එන කොට මම හිතන්නේ නීති රීති බලන්නේ නැහැ. මේ වන කොට මම හිතන්නේ, ඒ බෝට්ටුව අයිතිකාර මහත්මයාටත් නොදන්වා මේ රියදුරු මහත්තයා බෝට්ටුව අරගෙන ගිහිල්ලා කටයුතු කරලා තිබුණා. ඒ වාගේම ආරක්ෂක අංශය හිටියා. ආරක්ෂක අංශයට මේකට විරුද්ධ වෙන්න බැහැ. හේතුව මොකක්ද? මංගල්‍ය උත්සවයක්. මේ උත්සවය වාර්ෂිකව සිදු කෙරෙනවා.

හැබැයි, මේවා සිදු කෙරෙන කොට අද මේ කරන ක්‍රමවේදය මම හිතන්නේ, ආරක්ෂාවක් නැතිව ගමන් කිරීම තුළින් අද සිංහල, මුස්ලිම්, දමිළ කියන මුළු රටම අද කම්පා වෙලා තිබෙනවා, බේරුවල ආසනයේ සිදුවීම පිළිබඳව. ඒ අවස්ථාවට මම හිතන්නේ පක්ෂ විපක්ෂ සමහර ගරු මන්ත්‍රීවරු, ඇමතිවරු ඇවිල්ලා මේ දුක, ශෝකය බෙදා ගන්නවා. මම දැක්කා, ඊයේ රාත්‍රියේ මෙය සිදු වුණු වෙලාවේ ඉඳන් මම හිතන්නේ අපේ මේ ඉෆ්තිකාර් ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. ඒ වාගේම අපේ අනෙකුත් සහෝදර ගරු මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙක් ගිහිල්ලා ඒවාට බලලා ජනතාව මහා පුදුමාකාර කනගාටුවකට පත් වෙලා ඉන්නේ. ඔවුන්ව ගිහිල්ලා බේරා ගන්න හැදුවත්, මම හිතන්නේ අවසානයේ අපට බේරා ගන්න පුළුවන්කම ලැබුණේ 30 ක්, 35 ක් වැනි ප්‍රමාණයක් තමයි. ඊයේ රාත්‍රියේ අපි දැක්කා. මුළු බේරුවල ආසනය පුරාම මම හිතන්නේ පෙරහැර වාගේ මේ මළගෙවල් ටිකට හැම දෙනාම ගමන් කරනවා. අපි බස්නාහිර පළාත් සභාව හැටියට සමස්ත රටේම ශෝකය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. මොකද, හේතුව, මෙවන් විපත් අපට කවදාවත් අහන්න සිදු නොවේවා කියලා අපි ප්‍රාර්ථනා කරන්න ඕනෑ.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලනවා. අතිගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා, එහෙම නැත්නම් මේ වගකිවයුත්තන්ගෙන් මේ බෝට්ටු, මෙවන් වූ ධීවර යාත්‍රා පිළිබඳව නොවෙයි. අනෙකුත් උත්සව පැවැත්වීම සහ අනෙකුත් විනෝද චාරිකා ගමන් කිරීමේදී අවශ්‍ය කරන නීති රාමුවක් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. එහෙම නැති වුණොත් වාර්ෂිකව අපි දකිනවා, අපේ ප්‍රදේශය තුළ නොයෙකුත් ආකාරයේ ජනතාව මේ විනෝද චාරිකා ගිහිල්ලා විනාශයට පත් වෙනවා. එහෙම වුණාට පස්සේ මම හිතන්නේ, අද අපට ඉතාමත් කනගාටුදායක සිද්ධිවලට - මොකද, අපි දැක්කා සිද්ධිය වුණු අවස්ථාවේදී ඒ විශාල ප්‍රමාණයේ බෝට්ටු

ඇවිල්ලා ඒ හැම කෙනාම තමන්ගේ ජීවිත පරදුවට තබලා තමයි මේවාට බැස්සේ. හැබැයි, ඒ ආපු ආරක්ෂක අංශය එක පාරට බහින්නේ නැහැ. මොකද හේතුව, ඒගොල්ලන්ට ඉහළින් ඕඩරයක් නොදුන්නොත් ඒගොල්ලෝ බහින්නේ නැහැ. නමුත් අපේ ප්‍රදේශයේ ඉන්න ධීවරයෝ, ඒ කොල්ලෝ ටික පැනලා, සිංහල මුස්ලිම් ධීවරයෝ ඔක්කොම පැනලා පුදුමාකාර වෙහෙසක් දරලා, සටනක් දීලා ඒ ජීවිත බේරා ගත්තා. නමුත් මම ගරු ඔබතුමාගේ මාර්ගයෙන් මතක් කරනවා, ඒ අපට අවශ්‍ය කරන කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ඒ ප්‍රදේශය තුළ තිබෙන, ඒ ආරක්ෂක අංශය, එහෙම නැත්නම් පොලීසිය, එහෙම නැත්නම් ඒ බෝට්ටුවල ගිය මිනිස්සුන්ගෙන් - මාධ්‍යයෙන් එතැන පොඩි වරදක් සිදු වුණා. සමහර අවස්ථාවලදී. මේ සිදු වීම සිදු වන අවස්ථාවේදී බෝට්ටු 19 ක් මුහුදේ තිබුණා. හැබැයි, ඒ බෝට්ටුවල ගිය එක්කෙනෙක්ගෙන්වත් ගත් ප්‍රකාශයක්වත් සමහර මාධ්‍ය ආයතන ප්‍රකාශයට පත් කළේ නැහැ. ගොඩ ඉන්න කට්ටියගෙන් තමයි ඇවිල්ලා විස්තර ගන්නේ. මම කියනවා, මාධ්‍යයට යම්කිසි දෙයක් සිදු වුණොත් ඒ සිදුවීම ඇහෙන් දැක්ක, සියැසින් දුටු හැම දෙනෙකුගෙන් අවශ්‍ය කරන ඒ විස්තර ටික හරියට අරගෙන තමයි මාධ්‍යයට ප්‍රකාශ කරන්න ඕනෑ.

හැබැයි, අපි දැක්කා ඊයේ රාත්‍රියේ නවයයි හතලිස් පහ වෙන කොට මමත් එතැන හිටියේ. ඊයේ රාත්‍රියේ ඒ පෙරළුනු බෝට්ටුව ඩෝරා දෙකකින් කෙළින් කරලා අරගෙන ආවා. නවයයි හතලිස් පහට නැවත පියර් එක ළඟට ගෙනැල්ලා බෝට්ටුව ඇදගෙන ආවා. ඇදගෙන ඇවිල්ලා ගැට ගහද්දී මම හිතන්නේ හැමෝගෙම ඇස්වලින් කඳුළු වැක් කෙරුණා. මොකද හේතුව, ඒ බෝට්ටුව - වරාය ළඟම ඉන්නවා චූටි දරුවෙක්. මම හිතන්නේ, වයසක කට්ටියට වඩා ඒ දරුවාගේ දේහය දිහා බැලුවාම තමයි මම හිතන්නේ, හැමෝගෙම ඇස්වලට කඳුළු ඉනුවේ. හේතුව මොකද, තාත්තා තමන්ගේ අනික් දරුවාව බේරලා, අම්මාවත් බේරලා, මම හිතන්නේ ඉහළට දෙන කොට බලාගෙන ඉන්දැද්දීම අනික් දරුවාව දැලේ පැටලිලා යටට ගිහිල්ලා තිබෙනවා. ඉතින් මේ වාගේ සිද්ධි දෙන කොට අපි මාධ්‍යයෙන් ඉල්ලා සිටින්නේ, ඒ අවශ්‍ය කරන මාතෘකාවට අදාළ පුද්ගලයන්ගෙන් තොරතුරු අරගෙන කටයුතු කරන්න ඕනෑ. මම දිගින් දිගටම මේ ගැන කථා කරන්නේ නැහැ. අපටත් දුකක්, වේදනාවක් කනගාටුවක් තිබෙනවා. මම හිතන්නේ, අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අපේ අමාත්‍ය මණ්ඩලය සහ අපේ බස්නාහිර පළාත් සභාව තුළ අපේ ඉන්න මන්ත්‍රීවරු සියලු දෙනාගේම, ඒ වාගේම විශේෂයෙන් අපි බේරුවල, පයාගල ඉන්න මන්ත්‍රීවරු, අපි කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරු හැටියට අපේ කනගාටුව ප්‍රකාශ කරමින්. අපි ගරු ඔබතුමා මගින් ඉල්ලා සිටිනවා. ජනාධිපතිතුමාට කියන්න, මේ පවුල්වලට අවශ්‍ය කරන වන්දියක් මොනවා හරි සහනයක් හැකි ඉක්මණින් ලබා දෙන්නය කියලා. ඒ නිසා මම ඉල්ලා සිටිනවා, ඒවාට අවශ්‍ය කරන කටයුතු ඒ පවුල්වලට ගිහිල්ලා සොයා බලලා, මේ මන්ත්‍රීවරුන්ටත් යන්න පුළුවන් නම් ගිහිල්ලා, ඒ කනගාටුව ප්‍රකාශ කරලා, ශෝකය ප්‍රකාශ කරන්න. පෞද්ගලිකව මගේ ශෝකයත්, මෙතැන ඉන්නවා බේරුවල නියෝජනය කරන මගේ සහෝදර ගරු මන්ත්‍රීතුමා. එතුමා ඇතුළු අපේ කණ්ඩායමේ ශෝකයත් මේ අවස්ථාවේ ප්‍රකාශ කරමින්, මෙවන් විපත් අපට ආපහු අහන්න, දකින්න සිදු නොවේවායි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මොහොත වන කොට ඉදිරියේ පැවැත්වීමට නියමිතව තිබෙන පළාත් පාලන ආයතන සඳහා වූ යෝජිත නව මැතිවරණ ක්‍රමය පිළිබඳව නැවත වතාවක් ඇතැම් දේශපාලන පක්ෂ විසින් ගැටළු සහගත තත්ත්වයක් මතු කරමින් තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ නව මැතිවරණ ක්‍රමයක් පිළිබඳව අවශ්‍යතාවය මතු වුණේ මීට දශකයට කලින්. ඒ පිළිබඳව විශාල සාකච්ඡාවක් සංවාදයක් ඇති වුණා. පාර්ලිමේන්තුවේ දිනේෂ් ගුණවර්ධන කොමිටිය මගින් ඒ සම්බන්ධයෙන් එකඟතාවයක් ඇති කර ගත්තා. ඒ අනුව තමයි මේ පළාත් පාලන මැතිවරණ සංශෝධන පනත ගෙන එනු ලැබුවේ. දැන් ඒ අනුව මේ ක්‍රියාදාමය ඉදිරියට ගියා. ගිහිල්ලා දැන් මේකේ අවසාන අදියරයට ඇවිල්ලා සීමා නිර්ණය කොමිටිය හරහා ඒ වාර්තාවක් සකස් කරලා, අද වන කොට මෙය ගැසට් කිරීම සඳහා රජයේ මුද්‍රණාලයට භාර දීලා තිබෙනවා. එවැනි තත්ත්වයක් තිබියදී දැන් නැවත වතාවක් මේ මුල් අදියරටම ගෙන යමින් මේ මැතිවරණ ක්‍රමය පරණ විධියටම පැවැත්විය යුතුයි කියන යෝජනාවක් ගෙන එමින් තිබෙනවා. එහෙම නම් අපට පෙනෙනවා, මේ උත්සාහය පිටුපස තිබෙන්නේ වෙන මොනවත් නොවෙයි.

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

නැවත වතාවක් මේ රටේ ජනතාව ඉල්ලා සිටි නව මැතිවරණ ක්‍රමය වෙනුවට පරණ මැතිවරණ ක්‍රමයටම යන්න දරන උත්සාහයක්. ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ. එදා එකඟතාවයක් ඇති වුණා. කොට්ඨාශ මට්ටමින් 70% කුත්, ඒ වාගේම සමානුපාත ක්‍රමයට 30% කුත් ලෙස. ඒ ඇති කර ගත් එකඟතාවය මත පදනම් වෙලා තමයි මේ ක්‍රියාදාමය ඉස්සරහාට ගියේ. දැන් මේකේ අවසාන අදියරට ඇවිල්ලා තිබෙද්දී නැවත වතාවක් මේ ප්‍රාථමික ප්‍රශ්න, ප්‍රතිපත්තිමය ප්‍රශ්න, එහෙම නැත්නම් තමන්ගේ පක්ෂයට ලැබෙන පංගුව කුමක්ද කියන ප්‍රශ්නය මතු කරමින් ආපහු මේකේ මුලට ගේන්න ඇතැම් දේශපාලන පක්ෂ ඉතාම පහත් උත්සාහයක නිරත වෙමින් තිබෙනවා. ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. එහෙම නම් දැන් මේ යෝජනා කරන්නේ, ආපහු වතාවක් පරණ ක්‍රමයට යන්න ඕනෑය කියලා. මේ රටේ ජනතාව ඉල්ලා සිටියා, නව මැතිවරණ ක්‍රමයක්. එය අපට අත්හදා බලන්න පුළුවන් වෙන්නේ, බිම් මට්ටමින්, ගම් මට්ටමින් තිබෙන මේ පළාත් පාලන මැතිවරණ ක්‍රමය ඇතුළේ. ඊළඟට තමයි අපට ඒක පළාත් සභා ක්‍රමය, පාර්ලිමේන්තු ක්‍රමය තුළින් ඒක අත්හදා බලන්න පුළුවන් වෙන්නේ. එහෙම නම් ඒ ක්‍රමය අත්හදා බැලීම සඳහා අවසාන අදියර දක්වා ඇවිල්ලා තිබෙන මොහොතක, කවුරු හරි යෝජනා කරනවා නම්, නැවත වතාවක් පරණ ක්‍රමයට යන්න ඕනෑය කියලා. ඒක මේ රටේ ජනතාවගේ අපේක්ෂාවට, ජනතාවගේ ප්‍රාර්ථනාවලට පිටුපෑමක්. ඒක ජනතාවට ද්‍රෝහි වීමක් හැටියටයි අපි දකින්නේ.

ඒ මැතිවරණ ක්‍රමය පිළිබඳව මේ රටේ විශාල විවේචනයක් තිබුණා. මොකද, ඒ මැතිවරණ ක්‍රමය ඇතුළේ අපි දැක්කා, විශාල වශයෙන් ඒක අශෝබන, අශීලාචාර තත්ත්වයක් ඇති කරන මැතිවරණ ක්‍රමයක් කියලා. ඒ නිසාම තමයි දේශපාලන පක්ෂ අතර පුළුල් එකඟතාවයක් ඇති වුණේ, මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරලා අලුත් ක්‍රමයකට යමු කියලා. එහෙම නම් ඒ ක්‍රමයේ දැන් අවසාන තැනට ඇවිල්ලා ඉන්න මොහොතක කවුරු හරි කියනවා නම් දැන් අපට මේ 70 යි 30 පිළිගන්න බැහැ. ආපහු 60 යි 40 ට යන්න ඕනෑය කියලා කියනවා නම්, ආපහු අපට මුල ඉඳලා පටන් ගන්න වෙනවා. එහෙම නම් මේ උත්සාහය පිටුපස තිබෙන්නේ, අර පරණ ක්‍රමයම නැවත රැක ගැනීමේ උත්සාහයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා මේකෙන් පැහැදිලිවම මේ රටේ ජනතාවගේ ජනවරමට පිටුපෑමක් වෙනවා. ජනතාවගේ කැමැත්තට පස්ස හැරවීමක් සිදු කරනවා. ඒ නිසා අපි කියන්නේ, මේ ක්‍රියාදාමය ඉදිරියට ගෙනියන්න ඕනෑ. අද සමහරුන්ට හරි හදිස්සියක් ඇති වෙලා තිබෙනවා. ගැමි වහරේ කියමනක් තිබෙනවා, අල බහින කල් ඉන්න පුළුවන්. තැම්බෙන කල් ඉන්න බැහැයි කියලා. දැන් මේකේ අවසාන කොටසට ඇවිල්ලා තිබෙන්නේ. දැන් මේකේ පොඩි පොඩි තාක්ෂණික ප්‍රශ්න අල්ලා ගෙන, පරිවර්තන දෝෂ පිළිබඳ ප්‍රශ්න අල්ලා ගෙන, නීතිමය පිළිබඳ දෝෂ අල්ලා ගෙන නැවත වතාවක් අපි පරණ ක්‍රමයට යමුයි කියන විශාල වැඩ පිළිවෙළක් අද ඉස්සරහාට ඇවිල්ලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ හරහා උත්සාහ කරන්නේ වෙන මොකක්වත් නොවෙයි, මේ මැතිවරණය අලුත් ක්‍රමය යටතේ පැවැත්වීම වළක්වා ගැනීම සඳහා දරන උත්සාහයයි.

ඒ වාගේම එක්තරා දේශපාලන පක්ෂයක නායකයෙක් කියලා තිබෙනවා. මේ ලෝකයේ කොහේවත් නැති විකාර මැතිවරණ ක්‍රමයක් මේ ඇති කරලා තිබෙන්නේ කියලා. එහෙම නම් අපි අහන්න කැමැතියි. මේ කොමිටිවල හිටියේ විකාර කාරයෝද? ඔළුව මක්කෑං වුණු මිනිස්සුද හිටියේ? නැහැ. මේකේ ප්‍රාමාණික විද්වතුන් හිටියේ. ඒ සියලු දෙනාගේ අදහස් විමසලා තමයි, සාකච්ඡා කරලා තමයි, එකඟතාවයකින් තමයි මේවා ඇති කර ගත්තේ. දැන් කියනවා, මේ ලෝකේ කොහේවත් නැති විකාර මැතිවරණ ක්‍රමයක්ලු මේ ගේන්න යන්නේ. ඉතින් ඒ නිසා අපි කියන්න ඕනෑ. මේවා මුලින් සාකච්ඡා කරලා - එහෙම නම් ඒ කොමිටිවල තමන්ගේ අදහස් ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ කොමිටිවල හ්ම් කියන්නේ නැතිව නිශ්ශබ්දව ඉඳලා ඊට පස්සේ එළියට ඇවිල්ලා මාධ්‍ය සංදර්ශන පවත්වනවා. ඒ නිසා මේ මැතිවරණ ක්‍රමය පැහැදිලිවම පුළුල් එකඟතාවයකින් ඇති කර ගත් දෙයක්. සමහරු කොට්ඨාශ ක්‍රමයට යන්න භයයි. ජනතාවට මුහුණ දෙන්න භයයි. ජනතාවගේ නියෝජිතයන් විධියට පත් වෙන්න භයයි. ඒ නිසා සමානුපාත ඡන්ද ක්‍රමය ඇතුළේ තමයි තමන්ගේ ගොඩ වැඩි කර ගන්න පුළුවන් කියලා හිතන්නේ. ඒ නිසා සමානුපාතික වැඩි කර ගන්න දැන් බලනවා. ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ, ජාතික හෙළ උරුමය විධියට අපි මුල ඉඳලාම කියපු ස්ථාවරය තිබුණා. පක්ෂයක් විධියට අපට මේකෙන් වන වාසිය නොවෙයි. රටට වන වාසියයි

අපි බලන්නේ. තමන්ට ලැබෙන පංගුව, කුට්ටිය දිහා බලාගෙන කටයුතු කරපු පක්ෂයක් නොවෙයි. හැමදාම මේ රටේ ජනතාවගේ අපේක්ෂාව වෙනුවෙන්, අභිලාසය වෙනුවෙනුයි අපි කටයුතු කළේ. එහෙම නැතිව තමන්ගේ පක්ෂයට ලැබෙන වාසිය දිහා බලාගෙන නොවෙයි. ඒ නිසා අපි කියන්න කැමැතියි. මේක ආපස්සට අදින්න උත්සාහ කරන්න එපා. කකුලෙන් අදින්න උත්සාහ කරන්න එපා. ඒ නිසා අපි පැහැදිලිව කියන්නේ, නව මැතිවරණ ක්‍රමය යටතේ ඉදිරි පළාත් පාලන මැතිවරණය පැවැත්විය යුතුයි. ඒ සම්බන්ධයෙන් පුළුල් එකඟතාවයක් ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක අතර ඇති වෙලා තිබෙනවා. මේ කුඩා දේශපාලන පක්ෂ කිහිපයක් - අපිත් කුඩා දේශපාලන පක්ෂයක්. අපිටත් ඕක තිබෙනවා. අපේ පංගුව ගැන. අපේ පංගුව ගැන නොවෙයි අපි හිතන්නේ, රට ගැන. රටේ ජනතාව ගැන. මේ රටේ සීලාචාර දේශපාලන සංස්කෘතියක් ගැන. ඒ සීලාචාර දේශපාලන සංස්කෘතිය වෙනුවෙන්, ඒ වෙනුවෙන් නව මැතිවරණ ක්‍රමයකුයි ඉල්ලා සිටියේ. අන්න ඒකට යුක්තිය ඉෂ්ට කරන්න. ඒක ආපස්සට හරවන්න කවුරු හරි උත්සාහ කරනවා නම්, ඒක තමයි මේ රටේ ජනතාවට කරන ද්‍රෝහිකම. ජනතාවාදීන් කිව්වාට ජනතාවට පස්ස හරවලා, අද තමන්ගේ පක්ෂයේ වුවමනාව ඉස්සරහාට ගන්නයි මේ උත්සාහ කරන්නේ. ඒ නිසා මේක ආපස්සට හරවන එකට අපි විරුද්ධයි. නව මැතිවරණ ක්‍රමයක් යටතේ පළාත් පාලන මැතිවරණය පැවැත්විය යුතුයි. දෝෂ තිබෙනවා නම් ඒ දෝෂ ටික අපි හදා ගනිමු. ඒකට කාලය තිබෙනවා. ඒවා නිසියාකාරව කරන්නේ නැතිව ආපස්සට ගෙනියන්න උත්සාහ කරන මේ උත්සාහය පරාජය කරමින්, නව මැතිවරණ ක්‍රමය ජයග්‍රහණය කරවීම සඳහා අපි ඉදිරියට යන්න ඕනැය කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඡන්දය තියන්න. අපි දෝෂ යවලා දෙන්නම්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟය රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට අවස්ථාව ලබා දෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මේ දවස්වල පවතින දැඩි නියඟය නිසා කටාන ආසන ප්‍රදේශයේ විශාල පානීය ජල හිඟයකට අපි මුහුණ දීලා තිබෙනවා. මෙහිදී කනගාටුවට කරුණ වන්නේ, මහ ඔය ආශ්‍රිතවම තමයි අපේ ප්‍රදේශය පිහිටලා තිබෙන්නේ. නමුත් එයින් මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෑම නිවසකටම හිඟයක් නැතිව සම්පූර්ණ වතුර දෙනවා. නමුත් කටානේ ජනතාවට වතුර හම්බ වෙන්නේ නැහැ. ඉතින් මම මේ සභාව මගින් සහ ගරු ඔබතුමන්ලා මගින් බලධාරීන් වෙත අවධානය යොමු කරන්න සූදානම් වෙන්නේ, මේකේ බලවත් අසාධාරණ තත්ත්වයක් තිබෙනවා. ජල මූලාශ්‍රයේ පවතින කොට්ඨාශයට ජලය නැහැ. අනික් තැන්වලට තිබෙනවා. ඉතින් අපි වහාම - අපේ ඉන්නවා, ජල සම්පාදන අමාත්‍යාංශයේ රාජ්‍ය ඇමතිවරියකුත්. නමුත් මේ ප්‍රදේශයේ බහුතර ජනතාවකට අද බවුසර් මගින් ජලය ලබා දීම සිදු කරනවා. ඒත් නිසි ආකාරයට ඒවා ලැබෙන්නේ නැහැ. පෞද්ගලිකවත් ඒ වාගේම විශාල ව්‍යාපාරිකයෝ ඇතුළු ප්‍රජාවගේත් සහයෝගය අරගෙන අපි මේ වන විට ජලය දීම සිදු කරනවා. කෙසේ වෙතත් මේ ප්‍රදේශයේ සියලුම ජනතාවට ඒ පානීය ජලය ලබා ගන්න හැකි වන පරිදි ජල සම්පාදන මණ්ඩලය මගින් ඒ ජල සැපයුම දියත් කරන්න අවශ්‍යයි කියන කාරණාව තමයි මම මෙහිදී පැහැදිලි කරන්න බලාපොරොත්තු වෙන්නේ.

ඒ වාගේම නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වන විට අපි මුළු රටක් හැටියටත්, ජල මූලාශ්‍ර ආරක්ෂා කර ගෙන ජල කළමනාකරණයක් කළ යුතුයි කියන තැනට මම හිතන්නේ අපි පත් වෙන්න ඕනෑ. අපි සභාවලට ඇවිල්ලා කොපමණ කෑ කෝ ගැහුවත්, ප්‍රශ්නයේ මූලය හඳුනාගෙන පිළිතුරක් හෙව්වේ නැත්නම් එය සාර්ථක කර ගන්න බැරි වෙනවා. මේ වන විට මම මහ ඇමතිතුමාගේත් අවධානයට යොමු කරනවා. අපේ පළාත, වැඩි ජනතා ප්‍රමාණයක් ජීවත් වන ප්‍රදේශයක් වශයෙන් මේ සියලුම ජල මූලාශ්‍ර හඳුනාගෙන මේ වෙලාවේ මෙය කරන්න බොහෝ පහසුයි. ජනතාවගේ සහයෝගයත් ලැබෙනවා. ඒ නිසා ඒ ජල සම්පාදනය කරන ගමන්ම මේ මූලාශ්‍ර රැක ගැනීමට වැඩ පිළිවෙළක් දියත් කරන්නය කියලා. විශේෂයෙන් ගරු ඇමතිතුමාගේ විෂය ක්ෂේත්‍රයේ ජලය කියන එක සඳහන් වෙලා නැහැ. නමුත් ඒ සම්පූර්ණ බලය තිබෙන්නේ මහ ඇමතිතුමාට. බස්නාහිර

[ගරු රෝස් ප්‍රනාන්දු]

පළාත සම්බන්ධයෙන් තීරණ ගන්න පුළුවන්. ඉතින් මෙහිදී මම දකිනවා, දැනට ජලය සම්පාදනය වෙන්නේ දවසකට එක සැරයක්. එහෙම නැත්නම් දවස් දෙකකට එක සැරයක් එහෙම හම්බ වෙන්නේ. සමහර පාසල් යන දරුවන් පවා ඉතා අසරණ තත්ත්වයකට පත් වෙනවා. උදෑසන ඒ පිරිසිඳු කරලා පාසලට යවා ගන්න බැරි තත්ත්වයක් තිබෙනවා. ඉතින් අපි සම්බන්ධීකරණ කමිටුව හැටියටත් යම් යම් තීන්දු තීරණ ගත්තා. නමුත් මෙයිට වඩා ඔබ්බට යන වැඩ පිළිවෙළක් අවශ්‍යයි. ඒ වාගේම අපට කිසිම ජල බවුසරයක්, අයිතිවාසිකමක් නැහැ. මේ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට. මම හිතන්නේ, ජනාධිපතිතුමා බවුසර් 25 ක් හදන්න දීලා තිබෙනවා, දිවුලපිටිය ප්‍රදේශයේ ස්ථානයකට. මම මහ ඇමතිතුමාටත් මතක් කරනවා. ජල බවුසර් ටිකක් අපට කුමන අංශයකින් හරි ලබා දීලා ඒ කටයුතුවලට අපට අවශ්‍ය දායකත්වය ලබා දෙන්නය කියලා.

ඒ වාගේම පළාත් ඇමතිතුමා, මම හිතන්නේ බවුසරයක් මඟින් ජලය සපයන්න උදව් කරලා තිබෙනවා. අපි ඒකට ස්තුති කරනවා. නමුත් එය කිසිසේත් ප්‍රමාණවත් වන තත්ත්වයක් නොවෙයි. ඒ වාගේම අපි දන්නවා මෙම ජල මූලාශ්‍ර සිඳීමට, පාරිසරික හේතුනුත් බලපාලා තිබෙනවා. ඒ කියන්නේ, ඉඩම් කැඩීම සහ වෙනත් කර්මාන්ත ඉදි කිරීම වැනි අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් අපි විශේෂයෙන් පැල සිටුවීමක්, එහෙම නැත්නම් මොනවා හරි කර්මාන්තයකට යොදා ගන්න ඉඩම කර්මාන්ත කටයුතු විශේෂයෙන් වැලි කැණීම්, බොරළු කැණීම්, මැටි කැණීම් අවසන් වුණාට පස්සේ ඇත්ත වශයෙන්ම ඒ ඉඩම් නිස්කාරනේ ඇරලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේවා නැවත වහලා ගස් සිටුවීම හරි, නැවත යථා තත්ත්වයට පත් කිරීමේ වැඩ පිළිවෙළක් දියත් වෙනවා අඩුයි. මේ සියල්ල සැලකිල්ලට ගත්තොත් අපට මේ දැනට තිබෙන කර්මාන්ත කර ගෙන යෑමේ ප්‍රශ්නත් විසඳන්නත් පුළුවන්. සමහර විට අදාළ බලධාරීන් ඒ බලපත්‍රය දෙද්දී විශාල කොන්දේසි රාශියක් දැම්මාට ඒක වෙනවාද නැද්ද කියලා සොයලා බලන්නෙත් නැහැ. ඒ නිසා කර්මාන්තකරුවාත් අද ප්‍රශ්නවලට මුහුණ දීලා තිබෙනවා. මහජනාවත් මුහුණ දීලා තිබෙනවා. මේ සියල්ලම ගැට ගැහිලා එක තැනකින් තමයි අවසන් වෙන්නේ. ඉතින් මම මහ ඇමතිතුමා හරහා සියලුම අමාත්‍යවරුන්ගේ අවධානය යොමු කරනවා. ඒ වාගේම නිලධාරීන්ගේ අවධානය යොමු කරනවා. මේ ජල මූලාශ්‍රයක ගනිමින් මේ වන විට ඇති වෙලා තිබෙන තත්ත්වයට සහයෝගය දීලා, මේ ප්‍රශ්න ඉදිරියට ඇති නොවෙන්න වග බලා ගැනීම සඳහා ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් සභාවේ සියලු දෙනාගේම අවධානය යොමු කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. අපේ සුනිල් ජයමිණි ගරු මන්ත්‍රීතුමා, තමන්ගේ අදහස් දැක්වීමකදී මා දෙසට හැරිලා චෝදනාත්මකව කළා. පිළියන්දල පොලීසියේ කාන්තාවක් පැහැර ගෙන යාම සම්බන්ධයෙන් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ. ඒක ඔබතුමාට අදාළ විධියට කථා කළේ නැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

එහෙම නම් කාටද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ නම සඳහන් කළේ නැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

එහෙම නම් ඇයි මා දෙසට හැරිලා ඒක -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔය පැත්තේ තව ගොඩක් මන්ත්‍රීවරු හිටියා නේ? ඔබතුමා නිකම් අනවශ්‍ය ප්‍රශ්න භාර ගන්න එපා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

කවුද ඒ ඇමතිවරයා?

**ගරු සුනිල් ජයමිණී - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

මගේ ප්‍රකාශය තුළ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ගැන සඳහන් කළේ නැහැ. එතුමාට යම්කිසි සිත් තැවුලක් වුණා නම් මම කනගාටු වෙනවා. මම කිව්වේ, පිළියන්දල පොලීසියේ ඇන්ට්‍රියක් විභාග නොකරපු -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

නැහැ. ඒක මොකක්ද අදාළ වෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක ඔබතුමාට අදාළ නැහැ.

**ගරු සුනිල් ජයමිණී - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

තොරතුරු දැන ගැනීමේ පනත යටතේ, තොරතුරු දැන ගන්න අපට ඒක කිසිම-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවස්ථාව දෙන්න බැහැ. ඔබතුමා -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඔබතුමා දන්නේ නැත්නම් තොරතුරු දැන ගැනීමේ පනත යටතේ වුවද පරීක්ෂණයක් සම්බන්ධයෙන් තොරතුරු දැන ගන්න බැහැ. ඒක දැන ගන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක අදාළ වෙන්නේ නැහැ. මීළඟට සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් මම අවධානය යොමු කරනවා. අපේ ලලිත් වනිගරත්න අමාත්‍යතුමාගේ යටතේ පවතින දැනට පවත්වන කුලී මණ්ඩල සම්බන්ධයෙන්. විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම උපදේශක කාරක සභාවේදීත් යම් යම් අඩුපාඩුකම් පෙන්වලා දීලා තිබෙනවා. විශේෂයෙන්ම මේ කුලී මණ්ඩලවල සැලකිය යුතු අඩුපාඩු රාශියක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කුලී මණ්ඩල පවත්වාගෙන යැමේදී, මේ අභාවාවක අත්දැකීමට අපි මුහුණ දුන්නේ, මහරගම නගර සභාවේ තිබෙනවා කුලී මණ්ඩලයක්. ඒ කුලී මණ්ඩලය ගිය සිකුරාදා පවත්වන්න ගියාට පස්සේ පවත්වා ගැනීමට හැකියාවක් නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ කුලී මණ්ඩලය පවත්වාගෙන ගියාට පස්සේ ඊට අදාළ වාතාවරණයක් කුලී මණ්ඩලය තුළ නැහැ. විශේෂයෙන්ම මහරගම නගර සභාවේ තිබුණු කුලී මණ්ඩලයේදී ගරු මහ ඇමතිවරයාගේ නමත් පටලවා ගනිමින් - ඇත්ත වශයෙන්ම මම දන්නේ නැහැ ඒ අවස්ථාව. මේ මහ ඇමතිවරයාගේ මොකක් හරි වෙන්දේසියක් තිබිලා තමයි මේ කුලී මණ්ඩලය පවත්වන්න බැරි කියලා ඉතාම නරක චිත්‍රයක් ගිහිල්ලා තිබෙනවා. මම දන්නේ නැහැ ඒ අදාළ කථාව. එතකොට ගරු මහ ඇමතිතුමනි, මේ කුලී මණ්ඩල ඒ වෙලාවට තමයි සෙට් වෙන්නේ. ගියපු ගමන් පුටුව ගේනවා. ෆෑන් එක ගේනවා. ඊට පස්සේ මේසේ උස්සගෙන එනවා. දැන් සාක්කිකාරයෙකුට රහසේ සාක්ෂියක් දෙන්න බැහැ. Partition එකක් කරලා නැහැ. ඉතින් ඉතාම අභාවාචික තත්ත්වයක්. මහරගම එදා වුණු සිද්ධියේදී ඉසුර දේවප්‍රිය ගරු මහ ඇමතිතුමා උත්සවයක් කරලා තිබෙනවා. ඒ උත්සවය නිසා තමයි මේක අද පවත්වාගෙන යන්න බැරි කියලා කථිකාවක් වෙලා, කුලී මණ්ඩලය කල් දාලා. එතකොට ගරු මහ අමැතිතුමනි, මම කියන්නේ මෙතැන තිබෙනවා පොදු අඩුපාඩුකම් රාශියක්. සාක්ෂිකරුවෙකුට සාක්ෂියක් දෙන්න පුළුවන්කමක් නැහැ. Partition එක අඩු උසකට කරලා තිබෙන්නේ. එතකොට ඒ කියන සාක්ෂිය අහගෙන ඉන්නවා, අනික් සාක්ෂිකරුවා. අඩුම තරමින් - අපි කියන්නේ නැහැ උසාවියක තිබෙන පහසුකම් ටික දෙන්නය කියලා. මොකද, සතියකට දවසයි කුලී මණ්ඩලය රැස් වෙන්නේ. නමුත් නීතිඥ මහත්මයෙකුට ගිහිල්ලා වාඩි වෙන්න තැනක් නැහැ. සාක්ෂිකාරයෙකුට ඉන්න තැනක් නැහැ. ඒ වෙලාවට, සවස 3.00 ට මේක සෙට් වෙන්නේ. සවස 4.30 විතර වෙනකල් තිබෙන කරුණු ටික ඒකරාශී කර ගන්නවා. මේක මහරගම විතරක් නොවෙයි.

[ගරු සුනිල් වටගල]

මුළු බස්නාහිර පළාත් සභාවේම තිබෙන තත්ත්වයක්. ඒ නිසා විෂය භාර ගරු අමාත්‍යතුමාගෙන් මම ඉල්ලනවා, මම උපදේශක කාරක සභාවේත් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරලා තිබෙනවා. මේ කුලී මණ්ඩල පවත්වාගෙන යාමට අදාළ යටිතල පහසුකම් ටික කරුණාකරලා නිර්මාණය කරන්න. එහෙම නැත්නම් ඒ එන පාර්ශවකරුවන්ටත් ලොකු අසාධාරණයක්. එතැන විනිශ්චය ආසනවල වාඩි වෙලා ඉන්න මහත්වරුත් ලොකු අපහසුතාවයකට පත් වෙලා තිබෙන්නේ. අදාළ කුලී මණ්ඩල ටික කල් දදා යනවා. ඉතින් ඒ නිසා ඔබතුමාගේ මාර්ගයෙන් අවධානය යොමු කරනවා. මේ සම්බන්ධයෙන් නිවැරදි කිරීමක් කරන්නය කියලා. මහරගම නගර සභාවේ එදා වුණු සිද්ධිය පිළිබඳවත් ගරු මහ ඇමතිතුමනි, විමසීමක් කරලා බලන්න. ඔබතුමාගේ නමත් එතැනට පටලැවිලා තිබෙනවා. අනවශ්‍ය ආකාරයෙන්. ඒ නිසා පොදුවේ මේ අඩුපාඩුව නිවැරදි කරන්නය කියන ඉල්ලීම මම මේ වෙලාවේ කරනවා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ අවස්ථාවේ මේ මාසේ 13 වැනිදා බදුරලිය කනිෂ්ඨ විද්‍යාලයේ වුණු කනගාටුදායක සිද්ධිය ගැන ඔබතුමාගේ මාර්ගයෙන් මේ සභාවේ අවධානය යොමු කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 13 වැනිදා උදේ බදුරලිය කනිෂ්ඨ විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ උප සභාපතිතුමා, සභාපතිතුමා හා ලේකම්තුමා ගිහිල්ලා විදුහල්පතිතුමාගෙන් ඉල්ලීමක් කළා, අතිගරු ජනාධිපතිතුමාගේ ඡායාරූපයක් කාර්යාලයේ ප්‍රදර්ශනය කරන්නය කියලා. මම හිතනවා, අපේ රට ප්‍රජාතන්ත්‍රවාදී රටක් හැටියට, රාජ්‍ය නායකයා කවුරු වුණත් රාජ්‍ය ආයතනයක ඔහුගේ ඡායාරූපයක් ප්‍රදර්ශනය කිරීම කවුරුත් සැලකිල්ලට අරගෙන කටයුතු කරන අවස්ථාවක්. එහෙම සෑම තැනකම කටයුතු කරලා තිබෙනවා. නමුත් මේ විදුහල්පතිවරයා ඒ වෙලාවේ ආදි ශිෂ්‍ය සංගමයට කියලා තිබෙන්නේ, මගේ ළඟ ෆොටෝ එකක් නැහැ. ඕගොල්ලන්ට පුළුවන් නම් ගෙනැල්ලා හයි කරන්න කියලා. ඒ අවස්ථාවේ ආදි ශිෂ්‍ය සංගමයෙන් - එතකොට ආදි ශිෂ්‍ය සංගමයේ උප සභාපතිතුමා ගිය අවුරුද්දේ හිටපු යොවුන් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා. ලේකම් සහ භාණ්ඩාගාරික තුන් දෙනා ඉඳලා තිබෙන්නේ. ඒ අය ඡායාරූපයක් ගෙනැල්ලා එල්ලද්දී විදුහල්පතිතුමා ඒකට විරුද්ධ වෙලා, ඒක එල්ලනවාට විරුද්ධව බහින් බස් වීමක් ඇති වෙලා තිබෙනවා. ඒ වෙලාවේ හිටපු සභාපතිවරයාට, ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයාට දුරකථනයෙන් කථා කරලා තිබෙනවා. කථා කරලා මේගොල්ලන්ට පාඩමක් උගන්වන්න කියලා තිබෙනවා. ඒ අවස්ථාවේ පාසල් භූමියට ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිතුමා, ඒ වාගේම ප්‍රාදේශීය සභාවේ කටයුතු කරන කිහිප දෙනෙක් ප්‍රාදේශීය සභාවේ ත්‍රී රෝද රථයෙන් සහ ඔහුගේ වාහනයෙන් ඇවිල්ලා දරුණු විධියට පහර දීමකට ලක් කළා. ඒ අවස්ථාවේ යොවුන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීතුමා, ආදි ශිෂ්‍ය සංගමයේ උප සභාපතිතුමාගේ ඇඟ සහ මුහුණට විශාල පහරවල් වැදිලා බදුරලිය රෝහලට ඇතුළත් කරලා, පසුව නාගොඩ රෝහලට ඇතුළත් කළා. ඒ අවස්ථාවේ අපි එයට මැදිහත් වෙලා නීතිමය කටයුතු කරන්න ඉල්ලීමක් කළා. ඒ අනුව පොලීසිය ඒකට කටයුතු කරලා දැනට දෙදෙනෙක් අත්අඩංගුවට අරගෙන රිමාන්ඩ් ගත කරලා තිබෙනවා. මම විශේෂයෙන්ම ස්තූතිවන්ත වෙනවා, අපේ ප්‍රධාන අමාත්‍යතුමාට. ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් සහ වාහනයක් භාවිතා කළා. ඒකට එතුමා වහාම කටයුතු කරලා ප්‍රාදේශීය සභාවේ ලේකම්ව ස්ථාන මාරුවක් කරලා, ඒ අදාළ අවස්ථාවට සහභාගී වුණු කෙනාගේ වැඩ තහනම් කරලා, නීතිමය කටයුතු කරන්න කටයුතු කළා.

නමුත් මම කනගාටු වෙනවා. පාසලේ විදුහල්පතිවරයා මේ කරපු කාර්යය ගැන සම්පූර්ණයෙන්ම වැරදිකාරයා කළේ. කිසිම විනය මාර්ගයක් අරගෙනත් නැහැ. ඔහුට විරුද්ධව කටයුත්තක් කරලත් නැහැ. අද මෙතුමා ශිෂ්‍යයින්ට දීලා තිබෙන්නේ, ඉතාම වැරදි ආදර්ශයක්. රාජ්‍ය නායකයාගේ ඡායාරූපයක් ප්‍රදර්ශනය කරන්න බැහැයි කියනවා වාගේම, පාසල් භූමියට පිටින් ගෙනැල්ලා පහර දීමට ලක් කිරීම මම හිතන්නේ, පාසලේ දරුවන්ට ලැබුණු ඉතාම අශෝභන සිද්ධියක්. මෙවැනි විධියට කටයුතු කරන විදුහල්පතිවරුන්ට විරුද්ධව මම මෙතැන ඇමතිවරයා හිටියා නම් කැමැති වෙනවා. ඇමතිවරයාත් අතිගරු ජනාධිපතිතුමාට පක්ෂ කෙනෙක් හැටියට කටයුතු කරන්නේ. ඒ වාගේම මේ විදුහල්පතිවරයාත් ඇමතිතුමාගේ ඉතාමත් හිතවත් කෙනෙක්. ඉතින් මෙවැනි සිද්ධියක් වෙලා තවම කිසි කටයුත්තක් කරලා නැහැ. නමුත් ප්‍රදේශයේ ජනතාව මේ ගැන නීතිමය කටයුත්තක් කරයි කියලා බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ළඟම පාසල, හොඳම

පාසල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න, මේ පාසලේ විශාල මුදලක් වියදම් කරලා, රජයේ මුදල් වියදම් කරන කොට මේ වාගේ විදුහල්පතිවරුන්ගෙන් ඒ වැඩ කටයුතු හරියට කෙරෙයි කියලත් විශ්වාසයක් තියන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මම ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් මේ පළාත් සභාවේ අවධානය යොමු කරනවා. මෙවැනි නීත්‍යානුකූල නොවන විධියට කටයුතු කරමින්, වණ්ඩිකම් කරමින්, පාසලේ දරුවන්ට අශෝභන විධියට හැසිරීම් දක්වන දර්ශනයන් පෙන්වමින් කටයුතු කරන මේ විදුහල්පතිවරයාට විරුද්ධව නීත්‍යානුකූලවත්, විනයානුකූලවත් කටයුතු කරලා, මේකට සාධාරණය ඉෂ්ට කරලා දෙන්නය කියලා ඉල්ලා සිටිනවා. රාජ්‍ය නායකයාගේ ඡායාරූපයක් ප්‍රදර්ශනය කිරීමට විදුහල්පතිවරයා ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව මේ අවස්ථාවේ මාගේ බලවත්, පිළිකුල් සහගත කනගාටුව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පැහැදිලි කිරීමක් තිබෙනවා. ගියවර සභාවේදී අපේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා මහරගම නගර සභාවේ සැලසුම් අනුමත කිරීමක් සම්බන්ධව කථා කළා. විශේෂඥ වෛද්‍යවරයෙකුගේ. ඔබතුමා දන්නවා, මම සාමාන්‍යයෙන් අපේ ප්‍රදේශයේ ගරු මන්ත්‍රීවරයෙක් හෝ කවුරු හරි කිව්වොත් මම ඒකට ක්ෂණිකව මැදිහත් වෙනවා. මම වහාම පහුවැනිදා ඒ ලේකම්තුමායි, කාර්මික නිලධාරීයි, වැඩ අධිකාරීයි, ඉංජිනේරුයි ඔක්කොම ගෙනාවා. මම මේ නියෝජ්‍ය සභාපතිතුමාට කියන්නේ. මම කථා කළාම ඉංජිනේරුතුමා වහාම ඒ අදාළ වෛද්‍යවරයා දුරකථනයට සම්බන්ධ කළා. ඇත්තටම නගර සභාව පැත්තෙන්, අපේ නිලධාරීන්ගේ පැත්තෙන් අඩුපාඩුවක් වෙලා නැහැ. ඒකේ සිද්ධියක් තිබෙනවා. එතුමා කිව්වා. නමුත් ඒක අපේ නගර සභාවේ සිද්ධියක් නොවන බව මම කියනවා. මම ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, ඒ පිළිබඳව මතු කිරීම ගැන.

අනික් එක දැන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගෙවල් කුලී පාලක මණ්ඩලයක් මහරගම තිබුණේ නැහැ. මම තමයි ඒක ස්ථාපිත කළේ. අනික් එක මගේ උත්සවයක් නිසා ඒක වෙනස් වෙන්න විධියක් නැහැ. මම ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. මම ඒ පිළිබඳව සොයා බලන්නම්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි ගරු ප්‍රධාන ඇමතිතුමනි. පෞද්ගලික පැහැදිලි කිරීම් අවසන් වෙනවා. මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

## ශෝක ප්‍රකාශ යෝජනාව : ගරු දයාරත්න රණේපුර මැතිතුමා

MOTION EXPRESSING CONDOLENCES :
HON. DAYARATHNE RANEPURA, MEMBER

**ගරු සුනිල් ජයමිණි -** සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රථම පළාත් සභාවට එක්සත් සමාජවාදී පෙරමුණ නියෝජනය කරමින්, ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත් වී වසර පහක පමණ කාලයක් බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවන් ඉටු කරන ලද ගරු දයාරත්න රණේපුර මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.*

*බස්නාහිර පළාතේ පළාත් සභාව එතුමාගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමාගේ අභාවය පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පළ කර සිටියි."*

ගරු සභාපතිතුමනි, 1937 අගෝස්තු මාසේ 17 වැනිදා ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ පැලියගොඩ ප්‍රදේශයේදී විදුහල්පතිවරයෙකු වූ රණේපුර දේවගේ කරෝලිස් සිරිසේන මහතාට සහ මරක්කු දේවගේ නෝනේ ප්‍රනාන්දු මහත්මියට දාව උපත ලැබූ දයාරත්න රණේපුර මැතිතුමා සහෝදර සහෝදරියන් අට දෙනෙකුගේ පවුලක සාමාජිකයෙක්. කුඩා කල සිටම ගම්පහ දිස්ත්‍රික්කයේ පැලියගොඩ ප්‍රදේශයේ ගහබඩ ප්‍රදේශය නියෝජනය කරමින් ජීවත් වුණු රණේපුර මැතිතුමා පැලියගොඩ

[ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා]

දුටුගැමුණු පාසලත්, කැලණිය ගුරුකුල විද්‍යාලයේත් අධ්‍යාපනය ලබලා අනතුරුව විද්‍යාලංකාර පිරිවෙනට ඇතුළත් වෙලා, විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අධ්‍යාපනය ලබා ගත්තා. ඉන් පසුව ගරු සභාපතිතුමනි, තම අධ්‍යාපනය නිම කිරීමෙන් පසුව දයාරත්න රණේපුර මැතිතුමා පළමුවෙන්ම තෝරා ගත්තේ ග්‍රාම සේවකවරයෙකු වශයෙන් පත්වීමක් ලබා ගනිමින් රාජ්‍ය සේවයට ඇතුළත් වීමයි. නමුත් 1963 ඉඳලා වසර තුනක පමණ කාලයක් තමයි එතුමා ග්‍රාම සේවකවරයෙකු හැටියට කටයුතු කරන්නේ. 1966 දී දේශපාලන හේතු මත එතුමා තමන්ගේ රැකියාවෙන් සමු ගන්නවා. ඉන් පසුව රණේපුර මැතිතුමා සතිය ප්‍රකාශන සමාගමේ කර්තෘවරයෙකු හැටියටත්, විශේෂයෙන්ම ජනදින පුවත්පතේ ප්‍රධාන කර්තෘවරයා හැටියටත් රැකියාවේ නිරත වෙමින් තමන්ගේ දේශපාලන ක්‍රියාවලිය සහ පුවත්පත් කලාව ආරම්භ කරනවා. 1961 දී වත්තල එඬේරමුල්ල ප්‍රදේශයේ පදිංචිව සිටි ඩී.ආර්. දිසානායක මහතාගේ සහ සෝමවතී අබේවර්ධන මහත්මියගේ දියණියක් වූ තිලකා සෝමලතා දිසානායක මෙනවිය සමඟ විවාහ වුණු රණේපුර මැතිතුමා එක් පුතෙකුගේ සහ ආදරණීය දියණියන් දෙදෙනෙකුගේ පියෙක්. තම පුතා මේ වන විට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ට නිලධාරියෙකු වන අතර, වර්තමානයේ මහනුවර දිස්ත්‍රික්කයේ අතිරේක ලේකම්වරයා ලෙස එතුමා කටයුතු කරනවා. එක් දියණියක් මියගොස් තිබෙනවා. අනික් දියණිය පෙර පාසල් පාලිකාවක් ලෙස කටයුතු කරනවා.

ගරු සභාපතිතුමනි, දයාරත්න රණේපුර මැතිතුමා පුවත්පත් කලාවට අවතීර්ණ වීමත් සමඟ පැලියගොඩ ප්‍රදේශයේ ළමා සමිතිවල, ඒ වාගේම විහාරස්ථානවල සාහිත්‍ය කටයුතුවල නිරත වෙලා, තමන්ගේ දායකත්වය තම ගම් පළාතට ලබා දෙන්න කටයුතු කරන නායකයෙක් හැටියට කටයුතු කරනවා. ඒ වාගේම එතුමා කැලණිය ගුරුකුල විද්‍යාලයේ සාහිත්‍ය සංගමයේ ලේකම්වරයා හැටියටත් කලක් කටයුතු කරනවා. ඉන් පසුව එතුමා ක්‍රියාකාරී දේශපාලනයට පිවිසෙනවා. මුලින්ම එතුමා ක්‍රියාකාරී දේශපාලනය ආරම්භ කරන්නේ, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයෙකු හැටියට. ඉන් පසුව ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය අත හැර එතුමා ලංකා සම සමාජ පක්ෂයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස දේශපාලන කටයුතු ආරම්භ කරනවා. ලංකා සම සමාජ පක්ෂයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස දේශපාලනය කරන එතුමා ලංකා සම සමාජ පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකු හැටියට වසර ගණනාවක් කටයුතු කරන අතරේ, 1962 දී දයාරත්න රණේපු මැතිතුමා ප්‍රථම වරට පැලියගොඩ නගර සභාවේ අපේක්ෂකයෙකු ලෙස ලංකා සම සමාජ පක්ෂය නියෝජනය කරමින් ඉදිරිපත් වෙනවා. 1962 දී පවත්වපු මැතිවරණයෙන් එතුමා පැලියගොඩ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙකු හැටියට තේරී පත් වෙලා, තමන්ගේ ප්‍රදේශයට මහජන නියෝජිතයෙකු හැටියට අවශ්‍ය සේවාවන් රැසක් ඉටු කරනවා. විශේෂයෙන්ම සභිකයෙකු, ඒ වාගේම උප නගරාධිපතිවරයෙකු හැටියට එතුමා කටයුතු කරන අතරතුර ප්‍රදේශයේ සමූපකාර සමිති, ඒ වාගේම මංමාවත් ගණනාවක්, ඒ වාගේම විදුලි පද්ධති ගණනාවක් එතුමා ජනතාව වෙත ලබා දෙන්නට කටයුතු කරනවා. 1988 දී නැවත වරක්, යළිත් එතුමා ඒ නගර සභාවේ උප නගරාධිපති හැටියට පත් වෙනවා. පත් වෙලා 1988 වර්ෂයේ එක්සත් සමාජවාදී පෙරමුණ නියෝජනය කරමින් ඉතාම භීෂණකාරී වාතාවරණයක් මැද්දේ තම ජීවිත අවදානමත් පැත්තකට තියලා එතුමා කැලණිය ආසනය නියෝජනය කරමින් බස්නාහිර පළාත් සභාවට තරඟ වදිනවා. එදා බස්නාහිර පළාත් සභාවට තරඟ වදින දයාරත්න රණේපුර මැතිතුමා තමන් තරඟ කළ පළමු පළාත් සභා මැතිවරණයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ප්‍රථම බස්නාහිර පළාත් සභාවට තේරී පත් වෙනවා. ඒ තේරී පත් වුණාට පස්සේ, ගම්පහ දිස්ත්‍රික්කයට තමන්ගේ දායකත්වය ඉතාම ඉහළින් ලබා දෙන කෙනෙක් බවට පත් වෙනවා. මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ දයාරත්න රණේපුර මැතිතුමා හොඳ කවියෙක්. හොඳ ලේඛකයෙක්. රාජ්‍ය සම්මාන ගණනාවකින් පිදුම් ලබලා තිබෙනවා. 2009 කිවිපති සම්මානය. 2009 ගුරුකුල රත්න විභූෂණ සම්මානය. 2007 රාජ්‍ය භූෂණ සම්මානය. එවැනි සම්මාන ගණනාවක් හිමි කරගෙන තිබෙනවා. ඒ වාගේම කලාව සහ කොළඹ යුගය පිළිබඳව, කවීන් පිළිබඳව එතුමා ග්‍රන්ථ 16 ක් එළි දක්වලා තිබෙනවා. ඒ වාගේම අපි දන්නවා දයාරත්න රණේපුර මැතිතුමා පෞද්ගලික මේ සභාවේ ඉතාම දක්ෂ මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කළා.

මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ දයාරත්න රණේපුර මැතිතුමා සිංහල කවි පෙරමුණ ආරම්භ කරන්නට,

දිවංගත සෝමවීර චන්ද්‍රසිරි මැතිතුමාත් සමග නායකත්වය අරගෙන කටයුතු කරපු ශ්‍රේෂ්ට කලාකරුවෙක් කියන එක. දයාරත්න රණේපුර මැතිතුමා 1989 පළාත් සභාවට තේරී පත් වුණාට පස්සේ ත්‍රස්තවාදයට නොබියව මුහුණ දීපු කෙනෙක්. විටෙක එතුමා එවකට පැවැති ත්‍රස්තවාදයේ ගොදුරක් බවටත් පත් වුණා. නමුත් තමන්ට වෙඩි පහර කිහිපයක් එල්ල වුණත් ජීවිතය රැක ගන්න එතුමාට වාසනාව ලැබුණා. ඒ නිසා එතුමා කලාකාරයෙක් හැටියට, විශේෂයෙන්ම කවියෙක් හැටියට කොළඹ යුගයේ තමන්ට පුළුවන් කවි කලාව පැත්තෙන් විශාල සේවයක් කරපු කෙනෙක් හැටියට මතක් කරන්න ඕනෑ. ඒ නිසා මම මීට වඩා වැඩි යමක් සඳහන් කරන්න යන්නේ නැහැ. රණේපුර මැතිතුමා පළාත් සභාව ආරම්භ කරන්න, පළාත් සභා ක්‍රමය මේ රටේ ස්ථාපිත කරන්න කැප වුණු දේශපාලන නායකයෙක්. විශේෂයෙන්ම 1988 – 1989 කාලයේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කිරීමට එරෙහිව විශාල අරගලයක් මේ රටේ පැවතුණා. ඒ අරගලයේදී ඊට එහා මතයක් දරමින් මේ පළාත් සභාව ස්ථාපිත කරන්න රණේපුර මැතිතුමා තමන්ගේ කටයුතු ටික හරියට කළා. ඒ නිසා දයාරත්න රණේපුර මැතිතුමා බස්නාහිර පළාත් සභාවට ආදර්ශයක් ලබා දීපු නායකයෙක්. මේ අවස්ථාවේදී එතුමාගේ පවුල උදවිය මේ සභාවට පැමිණ සිටිනවා. ඒ සියලු දෙනාට බස්නාහිර පළාත් සභාවේ සංවේගය පුද කරමින්, බෞද්ධ භක්තිකයෙක් හැටියට මම මේ වෙලාවේ දයාරත්න රණේපුර මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනය කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු සභාපතිතුමනි, මෙම පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරපු දයාරත්න රණේපුර මැතිතුමා වෙනුවෙන් වචන කිහිපයක් කථා කරන්න මෙය අවස්ථාවක් කර ගන්න බලාපොරොත්තු වෙනවා. දයාරත්න රණේපුර මැතිතුමා මා නියෝජනය කරන ලංකා සමසමාජ පක්ෂයේ සාමාජිකයෙක් හැටියට දීර්ඝ කාලයක් කටයුතු කළ කෙනෙක් ලෙසයි අපි එතුමාව දකින්නේ. එතුමා පක්ෂයේ සාමාජිකයෙක් හැටියට පමණක් නොවෙයි. පක්ෂය ඉතාමත් අමාරුවෙන් කටයුතු කරපු කාලවලදීත්, පක්ෂයේ මධ්‍යම කාරක සභිකයෙක් හැටියට පක්ෂයේ කටයුතුවලදී නායකත්වය ලබා දීලා කටයුතු කරපු කෙනෙක් හැටියටයි අපි එතුමා දැකලා තිබෙන්නේ. එතුමා රජයේ සේවයෙක් හැටියට තමන්ගේ ජීවිතය ආරම්භ කරලා, රජයේ සේවාවට වැඩිය මහජන සේවය වඩාත් වැදගත් ලෙස සලකපු කෙනෙක් හැටියට පෑලියගොඩ නගර සභාවේ මන්ත්‍රීවරයෙක් බවට පත් වෙලා, ඒ වාගේම පෑලියගොඩ නගර සභාවේ උප නගරාධිපතිවරයා හැටියට පත් වෙලා පෑලියගොඩ ප්‍රදේශයට, කැලණිය ප්‍රදේශයට විශාල සේවාවක් කරන්න, සමාජ සුභසාධන කටයුතු වාගේම ඒ ප්‍රදේශයේ යටිතල පහසුකම් නඟා සිටුවන්න කටයුතු කරපු මන්ත්‍රීවරයෙක් හැටියට එතුමාව විශේෂයෙන්ම සඳහන් කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වාගේම බලය බෙදීම, විමධ්‍යගත කිරීම අරමුණු කරගෙන මේ රටේ ජාතීන් අතර ඇති වී තිබෙන්නා වූ ගැටළුවලට විසඳුමක් හැටියට පළාත් සභා ක්‍රමය ස්ථාපනය කරන අවස්ථාවේදී ඒ වෙනුවෙන් පෙනී හිටින උදවියට විශාල තර්ජනයක්, ජීවිතය පිළිබඳව අනතුරක් පවතින අවස්ථාවේදීත් දයාරත්න රණේපුර මැතිතුමා පළාත් සභා ක්‍රමය ස්ථාපිත වෙන්න ඕනෑය, පළත් සභා ක්‍රමය ශක්තිමත් වෙන්න ඕනෑය කියන මතය දරපු කෙනෙක් හැටියට බලය විමධ්‍යගත කිරීමේ අරමුණු ඇතුව කටයුතු කරපු කෙනෙක් විධියට 1989 වැනි ඇත කාලයකදී පළාත් සභාව ආරම්භ කරන අවස්ථාවේදීම තමන්ගේ ජීවිතයට තිබුණු තර්ජන පවා නොතකා හරිමින් එම මැතිවරණවලට ඉදිරිපත් වෙලා, පළත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියටත් පත් වෙලා විශාල සේවාවක් මේ පළාත තුළම ඉෂ්ට කරපු කෙනෙක් හැටියට එතුමාව සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම එතුමා මේ රටේ ප්‍රසිද්ධ කවියෙක් හැටියට, තමන්ගේ දේශපාලනයටත් වඩා කවිය මූලික කර ගත්තු කෙනෙක් හැටියටයි රණේපුර මැතිතුමා කටයුතු කළේ. එතුමාගේ කවිය හැම අවස්ථාවකදීම යොදා ගන්න උත්සාහ කළේ කවිය තුළින් සමාජ සාධාරණත්වය ඇති කිරීම අරමුණු කරගෙනයි. තමන් ලියූ බොහෝ කවිවල, තමන් ලියූ බොහෝ පොත්වල ඒ අරමුණ ඉස්මතු කරමින් කටයුතු කරපු කෙනෙක් හැටියටයි එතුමාව අපි පසුගිය කාලය පුරාවටම දැන හඳුනගෙන හිටියේ. එවැනි විශාල සමාජ සේවාවන් වෙනුවෙන් පෙනී හිටපු මන්ත්‍රීවරයෙක්, මහජන නියෝජිතයෙක් හැටියට ඒ වාගේම සමාජ සේවකයෙක් හැටියට දයාරත්න රණේපුර මැතිතුමා වැනි උදවිය සමාජයට අහිමි වීම විශාල පාඩුවක් හැටියටයි අපට දකින්න පුළුවන් වෙන්නේ. විශේෂයෙන්ම ප්‍රතිපත්තීන් මත කටයුතු කරමින් මේ රටේ සමාජ සාධාරණත්වය පිළිබඳව විශ්වාසය තබා

[ගරු කීර්ති කාරියවසම්]

කටයුතු කරමින් ක්‍රියා කරන උදවිය අද දකින්න අඩුවක් තිබෙන කාල පරිච්ඡේදයකදී එවැනි අරමුණු වෙනුවෙන් තමන්ගේ මුළු ජීවිතයම යොදවපු කෙනෙක් හැටියට, තමන්ගේ මුළු ජීවිත කාලයම ඒ වෙනුවෙන් කැප කරපු කෙනෙක් හැටියට එවැනි පුද්ගලයින් තව තවත් දස දහස් ගණනින් බිහි විය යුතු අවස්ථාවක එතුමා අප අතරින් වෙන් වීම කනගාටුවට කරුණක් වෙනවා. ඒ වාගේම රටට විශාල පාඩුවක් වෙනවා කියන එකයි අපි විශ්වාස කරන්නේ. එබැවින් එතුමා වැනි උදවිය මේ සමාජය ඉදිරියට ගෙනියන්න විශේෂයෙන්ම අද අපි මුහුණ දීලා තිබෙන අර්බුදකාරී තත්ත්වයන් තුළ රට ඉදිරියට ගෙනියන්න එවැනි පුද්ගලයින්ගේ අවශ්‍යතාවය වඩාත් හොඳින් ඉස්මතු වන කාල පරිච්ඡේදයක් හැටියටයි මේ කාල පරිච්ඡේදය අපි දකින්නේ. මොකද, එතුමා සමසමාජවාදියෙක් හැටියට සමාජ සාධාරණත්වය වෙනුවෙන්, සමාජවාදය වෙනුවෙන් පෙනී හිටියා පමණක් නොවෙයි, දූෂණය, වංචාව වැනි දේට විරුද්ධව හැමදාම කටයුතු කරපු කෙනෙක් හැටියටයි එතුමා කටයුතු කරලා තිබෙන්නේ. එවැනි අය අද සමාජයට ඉතාමත් වැදගත් අවස්ථාවක, වැදගත් අවශ්‍යතාවයක් තිබෙන කාල පරිච්ඡේදයක් විධියටයි අපි දකින්නේ. එතුමා තමන්ගේ ජීවිත කාලය පුරාවටම, තමන් නියෝජනය කරපු ප්‍රදේශය වෙනුවෙන් විශාල සේවාවක් කළා වාගේම මේ රටේ තරුණ පරපුරට ඒ වාගේම අධ්‍යාපනය ලබන දරුවන් කාටත් කවිය මේ රටේ ප්‍රධාන කලාවක් බවට පත් කරන්න මූලික වෙලා කටයුතු කළා. කවි සම්මේලනවල ප්‍රධාන නිලතල දරමින් කවිය අලුත් දිශාවකට යොමු කරවමින් කොළඹ යුගයේ කවියෙක් හැටියට කවිය රටේ, සමාජයේ ප්‍රතිශෝධනයට අවශ්‍ය මඟ පෙන්වන මාර්ගයක් හැටියට යොදා ගන්න කටයුතු කරමින් එතුමා ඒ හරහාත් විශාල සේවාවක් කවිය උපයෝගි කර ගනිමින් කටයුතු කරපු කෙනෙක් හැටියට අපේ ගෞරවය එතුමාට විශේෂයෙන්ම ප්‍රදානය කරන්න කැමැතියි.

ඒ වාගේම තමන්ගේ දරුවන් වෙනුවෙන්, තමන්ගේ පවුලේ අය වෙනුවෙන්, තමන්ගේ ඥාතීන් වෙනුවෙන් ඒ සියලු දෙනා වෙනුවෙන් අවශ්‍ය යුතුකම්, වගකීම් ඉෂ්ට කරපු පියෙක් හැටියටත් එතුමාව අපි සලකන්න ඕනෑ. එවැනි කෙනෙකුගේ අභාවය සම්බන්ධයෙන් අපි ලංකා සමසමාජ පක්ෂය හැටියට බස්නාහිර පළාත් සභාව සමග අපේ ශෝකය ඒ පවුලේ සියලු දෙනාට ප්‍රකාශ කරනවා. බෞද්ධ ධර්මය විශ්වාස කරන උදවිය හැටියට එතුමාට නිවන් සුව අත් විඳීමට හේතු වාසනා වේවා කියන ප්‍රාර්ථනයත් එක්ක මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතිය.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, මෙම පළාත් සභාව නියෝජනය කරන්න ගම්පහ දිස්ත්‍රික්කයෙන් වාමාංශික දේශපාලනය අත්පොත් කරගෙන ඉතාම නිහතමානී මහජන සේවකයෙක් හැටියට අපේ ප්‍රදේශයේ කටයුතු කරපු දයාරත්න රණේපුර මැතිතුමාගේ අභාවය පිළිබඳවත්, එතුමා පිළිබඳව මතකය ස්මරණය කරන මේ අවස්ථාවේ එතුමාගේ ඥාතීන්ට විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේත් බස්නාහිර පළාත් සභාවේ විපක්ෂ මන්ත්‍රීවරු වෙනුවෙන් මගේ ශෝකයත් පළමුවෙන්ම ප්‍රකාශ කරනවා. එතුමාව මම ඉස්සෙල්ලාම දැන හඳුනා ගත්තේ ගම්පහ දිස්ත්‍රික්කයේ වත්තල මැතිවරණ කොට්ඨාශයට යාබදව තිබෙන පැලියගොඩ අපට බොහොම සම්බන්ධයි. එතුමා වාමාංශික දේශපාලනය කරන ලංකා සමසමාජ පක්ෂය නියෝජනය කරන, ඒ අත්පොත් තැබූ දේශපාලන පක්ෂයත් එක්ක කටයුතු කරලා විශේෂයෙන්ම දරුණු භීෂණය කාලයේත් තමන්ගේ ප්‍රතිපත්ති පාවා දෙන්නේ නැතුව, ඍජුව කටයුතු කරපු බොහොම සරල නිහතමානී පුද්ගලයෙක්. අංශ කිහිපයකින්ම එතුමා තමන්ගේ ජීවිතයේ වාර්තාවල් තියලා තිබෙනවා. මම හිතන්නේ, මේ පළාත් සභාව නියෝජනය කරපු අපේ ජාතික මට්ටමේ හිටපු ජාතික කවියෙක් හැටියට තමයි අපි එතුමාව දන්නේ. දයාරත්න රණේපුර මැතිතුමා කියන ඒ කවියා මොන තරම් සොඳුරු මිනිසෙක්ද කියලා අපි හොඳටම දැන හඳුන ගත්තේ එතුමාත් එක්ක විවිධ අවස්ථාවලදී දේශපාලන කටයුතුවල නියැලෙන්න සිදු වුණාම. අපට වඩා වයසින් බෙහෝ වැඩිමහල් වුණත් බාලයින් හැටියට අපත් එක්ක බොහොම සුහදව එතුමා කටයුතු කළා. විශේෂයෙන්ම කිසිම අවස්ථාවක ප්‍රාදේශීය දේශපාලනය කරන කොට තමන්ගේ ප්‍රතිවිරුද්ධ දේශපාලන මත දරන අයත් එක්ක ගැටීම් ඇති කර ගන්න එතුමා උත්සාහ කළේ නැහැ. බොහොම සුහදව තමයි ප්‍රාදේශීය ප්‍රශ්න, පාරිසරික ප්‍රශ්න, මහජනතාවගේ අවශ්‍යතාවයන් කියන එක පිළිබඳව එකමුතු වෙලා සාකච්ඡා කරලා තමයි එතුමාට බලය තිබුණු කාලයේත්, මේ පළාත් සභාව නියෝජනය කරපු කාලයේත් එතැනින් පිටත් කටයුතු කරන කොට එතුමා කටයුතු කළේ. බොහොම සරල, වාම්

දිවිපෙවෙතක් ගත කරපු ජාතික ඇඳුම ඇඳලා, බොහොම සිනාමුසු මුහුණින් කා එක්කත් සුහදව කටයුතු කරපු කලාකාරයෙක් තමයි දයාරත්න රණේපුර මැතිතුමා කියන්නේ. මම දැක්කා එතුමා මේ රටේ දරුණු භීෂණයක් තිබෙන වෙලාවේ වාමාංශික ව්‍යාපාරය අතුගාලා දමන්න, විශේෂයෙන්ම සමසමාජ පක්ෂය, කොමිනිස්ට් පක්ෂය නියෝජනය කරපු මහජන නියෝජිතයන්ට ජීවිත තර්ජන තිබුණු වෙලාවේ එතුමා තමන්ගේ ප්‍රතිපත්තිය එක බිඳකින්වත් පාවා දෙන්නේ නැතුව ඍජුව ඒ වෙනුවෙන් පෙනී හිටියා. ජීවිතයත්, මරණයත් අතර සටනක එතුමා ඒ කාලයේ නියැලිලා අවසානයේ තමන්ගේ ජීවිතය බොහොම අමාරුවෙන් බේරගෙන තමන්ගේ දේශපාලන ප්‍රතිපත්ති එතුමාගේ අවසානය දක්වාම කිසි විටෙකත් පාවා දෙන්නේ නැතුව කටයුතු කරපු නිහතමානී අවංක දේශපාලඥයෙක්.

විශේෂයෙන්ම අපි දන්නවා අද සමාජයේ වාමාංශික දේශපාලනයට මේ රටේ උරුම වෙලා තිබෙන තැන. නමුත් එදා බොහොම අමාරුවෙන් ගොඩ නඟා ගත්තු වාමාංශික ව්‍යාපාරය ශක්තිමත් කරන්න තමන්ට තිබුණු දේවල් පවා පරිත්‍යාගයෙන් කටයුතු කරපු පුද්ගලයෙක්. අද දේශපාලනයට එනකොට යාන වාහන, මිල මුදල්, මේ තිබෙන තරගකාරී මැතිවරණ රටාවත් එක්ක බොහොම අමාරුයි. හැබැයි දයාරත්න රණේපුර මැතිතුමන්ලාට මේ කිසි දෙයක් බලාපොරොත්තු වුණේ නැති විශාල පිරිසක් හිටියා. ඒ එතුමන්ලාගේ ප්‍රතිපත්ති නිසා. ඒක නිසා මම හිතන්නේ, එතුමා පළාත් සභාවේ මන්ත්‍රී ධුරය දරපු කාලේ විශේෂයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ කැලණිය සහ වත්තල කියන මැතිවරණ කොට්ඨාශ දෙකට තමන්ට පුළුවන් උපරිම ආකාරයට ඒ ප්‍රතිපාදන යොදවලා මන්ත්‍රීවරයෙක් හැටියට තමන්ට ලැබුණු ඒ අවස්ථාවෙන් ප්‍රදේශයේ සාමාන්‍ය දුක් විඳින ජනතාවට උවමනා කරන පහසුකම් ලබා දෙන්න එතුමා කටයුතු කළා.

ඒ වාගේම මම කලින් කිව්වා වාගේ එතුමා බොහොම සුහදශීලී පුද්ගලයෙක්. මට මතකයි ඒ කාලයේ ගම්පහ සංවර්ධන කමිටු රැස්වීම තියෙන කොට එතුමාත් ඒ රැස්වීමට සහභාගී වෙනවා. අපි පළාත් පාලන ආයතන නියෝජනය කරන මන්ත්‍රීවරු හැටියට, සභාපතිවරු හැටියට සහභාගී වනකොට ඒ කාලයේ ගම්පහ දිස්ත්‍රික්කයේ එක්සත් ජාතික පක්ෂයේ පථාක යෝධයෝ හිටියා. එතුමාගේ මැතිවරණ කොට්ඨාශය නියෝජනය කරන අයත් විශේෂයෙන්ම ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා, ජෝන් අමරතුංග මැතිතුමා, සුරනිමල රාජපක්ෂ මැතිතුමා වාගේ උදවියත් එක්කත් බොහොම සුහදව තමන්ගේ තිබෙන ප්‍රශ්නය සාකච්ඡා කරලා, ඒ අවශ්‍යතාවය ඉටු කර ගන්න සිනහ මුසු මුහුණින් කටයුතු කරපු පුද්ගලයෙක්. හැම වෙලාවේම මහජනයා පැත්තේ තමයි එතුමා හිට ගත්තේ. ඒ නිසා මම හිතන්නේ මේ පළාත් සභාව තුළත්, එතුමාගේ අදහස්වලින් බොහෝ පෝෂණය වෙලා තිබෙනවා. අද එතුමන්ලා ඒ දැකපු සමාජ සාධාරණත්වය මේ රටේ තිබෙන ප්‍රධාන දේශපාලන ධාරාවන් දෙක එකට එකතු වෙලා, මේ රටේ ජනතාවගේ පැත්තෙන් හිතලා, මේ රටට වෙන්න ඕනෑ සංවර්ධනය මොන විධියද කියලා තීරණය කරගෙන ප්‍රධාන දේශපාලන ධාරාවන් දෙක එකතු වෙලා ආණ්ඩුවක් කරන කොට එහි ප්‍රතිඵල දිහා බලන්න, භුක්ති විඳින්න එතුමාට වාසනාව තිබුණේ නැහැ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා. එතුමා ඒ බලාපොරොත්තු වුණු එතුමා ප්‍රාර්ථනා කරපු සමාජ සාධාරණත්වය වර්තමාන යහපාලන රජය, ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක එකතු වෙලා මේ රටේ ජනතාව වෙනුවෙන් ඒ සිහිනය සැබෑ කරන්න එතුමාගේ තිබුණු උවමනාව ඉෂ්ට වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. එතුමාට නිවන් සුව අත් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාවේ ඉතාමත් ගෞරවනීය මන්ත්‍රීවරයෙක් හැටියට සේවය කළ දයාරත්න රණේපුර මැතිතුමන් වෙනුවෙන් ශෝක යෝජනාව ඉදිරිපත් කරන මොහොතේ මම අතිශයින් සතුටු වෙනවා, ඒ සම්බන්ධයෙන් කථා කරන්න ලැබීම ගැන. මොකද, එතුමා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම රණකාමීත්වයෙන් පෝෂණය වුණු, ඕනෑම අභියෝගයකට මුහුණ දිය හැකි, සමාජ සාධාරණත්වය වෙනුවෙන් තමන්ගේ හදවතින්ම කැප වුණු, මානව දයාවෙන් හදවත පිරුණු සැබෑ මනුස්සයෙක් නිසා. ගරු සභාපතිතුමනි, දයාරත්න රණේපුර මැතිතුමන් තමන්ගේ ජීවිතය ඉතාමත් වගකීමකින් යුතුව රාජ්‍ය නිලධාරියෙක් හැටියට ආරම්භ කරලා, ග්‍රාම නිලධාරීවරයෙක් හැටියට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට සම්බන්ධ ප්‍රාදේශීය නිලධාරියෙක් හැටියට තමන්ගේ ජීවිතය ගත කරලා, බොහොම ප්‍රකට සමාජ සේවකයෙක් හැටියට තමන්ගේ සමාජ වගකීම ඉතාමත් වගකීමෙන් ඉෂ්ට කරන්න

[ගරු ජගත් අංගගේ]

සමත් වූ නිසා තමයි ඔහුට කලකදී නාගරික මන්ත්‍රීවරයෙක් හැටියට වරම් ලබන්න අවස්ථාව යෙදුණේ. එතුමා නාගරික මන්ත්‍රීවරයෙක්. පසු කාලීනව නාගරික උප සභාපතිවරයෙක් වාගේම මේ පළාත් සභාව නියෝජනය කරපු මහජන නියෝජිතයෙක් හැටියට සුවිශාල සමාජ මෙහෙවරක් මේ සමාජය වෙනුවෙන් ඉෂ්ට කරපු මහ අවංක දේශපාලන චරිතයක්. මෙන්න මේ වචනය ඉස්සරහාට දාලා කථා කරන්න පුළුවන් මිනිස්සු දුර්ලභ යුගයක එතුමා සැබවින්ම මානව හිතවාදියෙක් කියන දේ වචනයෙන් නොව ක්‍රියාවෙන් ඔප්පු කරපු මහ ශ්‍රේෂ්ට යුග පුරුෂයෙක්.

ගරු සභාපතිතුමනි, දයාරත්න රණේපුර කිවිපති සමීපවම මා හඳුනා ගත්තේ මේ සභාව නියෝජනය කරපු වජිර පැල්පිට ගරු ඇමැතිතුමාගේ කාලයේදී. කවියට මහ පුදුම ලෙංගතුකමක් තිබුණු, අපේ සභාව නියෝජනය කරපු වජිර පැල්පිට ගරු අමාත්‍යතුමා සමග එතුමා යාවජීව හිතවතෙක් හැටියට ශ්‍රී ලංකා කවි සම්මේලනයේ මහ දැවැන්ත මෙහෙවරක් ඉෂ්ට කරන්න ක්‍රියා කළ හැටි අපි දැක්කා. ඒ වාගේම කිවිපති නෙළුම්දණ්ඩේ විමලසාර නායක හිමිපාණන් වහන්සේ සමග විවිධ අවස්ථාවලදී එතුමා මේ කටයුතුවල යෙදිලා කරන මෙහෙවර මා දැක්කා. මට මතකයි මම පසු කාලීනව 2010 වර්ෂයේ මහ පැදුර කියලා විශේෂ වැඩ සටහනක් වාද්දුව ප්‍රදේශයේ ක්‍රියාත්මක කරද්දී, එහි කවි මඩුව සංවිධානය කිරීමේ වගකීම භාර ගත්තේ අපේ රණේපුර මැතිතුමා. එදා වාද්දුව පොලිස් ස්ථාන භූමියේ පවත්වපු කවි මඩුවේ විශේෂම අංගය බවට පත් වුණේ අනෙකුත් අංග අතරින් කවි මඩුව. ජනතාව තුළ මහ දැවැන්ත ආශ්වාදනීය කටයුත්තක් හැටියට බොහොම ප්‍රසාදයට - මහළු, මැදිවියේ අය මෙන්ම තරුණයොත් ඉතාමත් හොඳින් වින්දනය කරපු වැඩ සටහනක් බවට ඒ වැඩ සටහන් පත් වුණා. ඒ නිසා කාලීන වශයෙන් කොළඹ යුගයේ කවියෙක් හැටියට කවිය ජනතාව අතර ප්‍රචලිත කිරීමටත්, ඒ තුළින් සමාජ මෙහෙවරක් ඉෂ්ට කිරීමටත්, සමාජ අසාධාරණය පිළිබඳව කවිය තුළින් සමාජයට පණිවිඩයක් නිකුත් කරන්නත් මහ දක්ෂ හැකියාවක් තිබුණු, යුගයේ අවශ්‍යතාවය හඳුනා ගත්තු කවියෙකු හැටියට තමයි එතුමා ප්‍රකට වුණේ. ඒ නිසා ඔහු විසින් ඉදිරිපත් කරන ලද ග්‍රන්ථ 16 කට අධික ප්‍රමාණය තුළ මේ සමාජය තුළ විවිධ අඩුපාඩුකම්, අඩුලුහඬුකම්, නිවැරදි විය යුතු ස්ථාන පිළිබඳව පණිවිඩයක් යවන්න දැවැන්ත වෙහෙසක්, මහන්සියක් දරපු අපේ කාලයේ අපි දැන හඳුනා ගත්තු මහ ශ්‍රේෂ්ට කවියෙකු හැටියට තමයි රණේපුර මැතිතුමාගේ විශේෂත්වය වඩාත් එළි දක්වන්නේ.

ඒ වාගේම එතුමා තෝරා ගත්තු දේශපාලන පක්ෂය. එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමාගේ ශ්‍රී ලංකා කොමිනිස්ට් පක්ෂය ආරම්භයේ එතුමා තම දේශපාලන පක්ෂය හැටියට, මාවත හැටියට තෝරා ගන්නේ. මේ රටේ ජනතාවගේ සමාජ සාධාරණත්වය, සමාන අයිතිවාසිකම්, ජනතාවගේ මනුස්සත්වය පිළිබඳව තිබෙන මූලික අසාධාරණකම් පිටුදකින්න හැකි දේශපාලන මාවතක් හැටියට එතුමා තෝරා ගත්තේ ලංකා කොමිනිස්ට් පක්ෂය. පසු කාලීනව එතුමා ලංකා සමසමාජ පක්ෂ සාමාජිකයෙක් බවට පත් වෙනවා. එතුමා හැම තිස්සේම තර්කානුකූලයි. නිහඬව හිටියේ නැහැ. වැරැද්දක්, අඩුලුහුඩුකමක් දැකපු තැන හැම තිස්සේම ඒ සඳහා කථා කරන්න ඉදිරිපත් වුණු, ඒ පිළිබඳව විවේචනය කරන්න ඉදිරිපත් වුණු, බය කියන එක කිසි දවසක හඳුනන්නේ නැති මහ විරෝධාර පෞරුෂයක් ඇති චරිතයක්. සමහර අය දැක්කාම අපි හිතනවා කය කෙසඟයි. එච්චර ශක්තියක් නැහැ. ඒ වුණාට තමන්ගේ පෞරුෂය රඳා පවතින්නේ කාය ශක්තිය මත නොවෙයි කියන එක ඔප්පු කරන්න පුළුවන් චරිතයක් හැටියට තමයි රණේපුර මැතිතුමා තමන්ගේ ජීවන චාරිකාව ගත කළේ. අපි බොහෝ විට බෙහෝ පුද්ගලයන් පිළිබඳව විවිධ ගුණ වර්ණනා කරන කොට, කරන්න වෙන්නේ අතිශෝක්තියෙන්. කළ යුතු නිසා කරන්න සිද්ධ වෙනවා. නමුත් දයාරත්න රණේපුර කියන ඒ ශ්‍රේෂ්ට පුරුෂයා පිළිබඳව අපට කථා කරන්න පුළුවන් වෙන්නේ, හදවතේ ගැඹුරුම තැනින්. මොකද, හේතුව එතුමා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම තමන්ගේ කථාව සහ ක්‍රියාව අතර මහ කිට්ටුභාවයක් තිබුණා. බොහොම සමීපභාවයක්. සමහර උදවිය කථා කරන වචනය සහ ක්‍රියාව අතර තිබෙන්නේ ගව් ගණන් ඈත පරතරයක්. නමුත් දයාරත්න රණේපුර මැතිතුමා කථා කරපු වචනයත්, එතුමාගේ ක්‍රියාවත් අතර බොහොම කිට්ටු සම්බන්ධයක් තිබුණු ශ්‍රේෂ්ට නායකයෙක්. ඒ නිසා එතුමා අප අතරින් - ඉස්සර මේ සභාව තිබුණේ මෙතැන නොවෙයි. අර සච්සිරිපායේ තිබුණු සභාවේ. එතුමා, හැන්සාඩ් වාර්තා අරගෙන බැලුවොත් අපට පේනවා. කථා කරන කථාව අතරතුරේ කවියක් දෙකක් කියලා තමයි ඒ කථාව සාරවත් කළේ. බොහොම උන්නදුවෙන්, තමන්ගේ වගකීම පිළිබඳව බොහොම කැපවීමෙන් කටයුතු කළා. සාහිත්‍යධරයෙකු

හැටියට, දේශපාලඥයෙකු හැටියට, රාජ්‍ය සේවකයෙකු හැටියට තමන්ට පැවරුණු විවිධ වගකීම් පිළිබඳව හරියාකාර වගකීමෙන් යුතුව ගලපාගෙන ක්‍රියා කරපු මහ ශ්‍රේෂ්ට යුග පුරුෂයෙක්. ඒ නිසා අද එතුමා අප අතරින් සමුගෙන ගියත්, දයාරත්න රණේපුර කියන නාමය ජනතාවගේ හදවත් තුළ තැන්පත් කරලා ඉතාමත් භීෂණකාරී යුගයක මේ සභාව නියෝජනය කරමින් තමන්ගේ ජීවිතය පිළිබඳව තිබුණු අවිනිශ්චිතභාවයට එතුමා ඉතාමත් එඩිතරව මුහුණ දෙමින් තමන්ගේ දේශපාලනික, සමාජයීය වගකීම් ඉෂ්ට කරපු බස්නාහිර පළාත් සභාවේ ශ්‍රේෂ්ට ගරු මන්ත්‍රීවරයෙකු පිළිබඳව වචනයක් කථා කරන්න ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා.

ඒ වාගේම මම ප්‍රාර්ථනා කරනවා. ඔබ නැවතත් අප අතරම ඉපදේවා. මොකද, යුගය එතරම් යහපත් නැහැ. ඔබගේ රණකාමී, සමාජ සාධාරණත්වය පිළිබඳ යහපත් සංකල්ප ඇති, යහපත් ගුණ ධර්ම ඇති පුද්ගලයින්ගේ ඌණතාවයක් පවතින යුගයක ඔබ අපට අහිමි වීම මහ විශාල පාඩුවක්. ඔබතුමා ගිලන්ව හිටියත්, ග්‍රන්ථයක් ග්‍රන්ථාරූඪ කරන්න, එහෙම නැත්නම් ඒ සමාජ පණිවිඩය සමාජයට නිකුත් කරන්න ඔබ අද දවසේත් ජීවතුන් අතර සිටියා නම් මේ වන පිරිහීම් පිළිබඳව ඔබට ලස්සන, ලස්සන දේවල් දකින්න තිබුණා. හිතවත් කිවිපතිතුමනි, ඔබතුමාගේ වියෝව අප කාගේත් හදවත්වලට මහත් වේදනාවක්. කෙසේ වෙතත් සනාතන ධර්මතාවය අනුව අද ඔබ අප අතරින් සමුගෙන ගොස්. ඔබතුමා ඇදහූ ආගම අනුව ඔබතුමාට උතුම් වූ නිවනින් සැනසීම ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ පෞද්ගලික ශෝකය එතුමා වෙනුවෙන් පිරිනමමින් මා නිහඬ වෙනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් අපි ස්තූතිවන්ත වෙනවා ඔබතුමාට. 1988 පළාත් සභා ව්‍යුහයේ පළමුවැනි පළාත් සභාවේ අපේ ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ සච්සිරිපායේ සභා ශාලාවේ ඒ රැස් වුණු සභාවේ හිටපු විශිෂ්ට ගණයේ දේශපාලඥයන් අතර, ඉතාම සුවිශේෂී චරිතයක් හැටියටයි දයාරත්න රණේපුර ආදරණීය මන්ත්‍රීතුමාව හඳුන්වන්න පුළුවන් වන්නේ. ඒ විතරක් නොවෙයි, සාහිත්‍ය, කලාව, සමාජ සාධාරණත්වය වෙනුවෙන් මේ රටේ අහිංසක, තැලෙන පොඩිවෙන මිනිස්සුන්ගේ හෘදය සාක්ෂිය සභාගත කරන්න, ජනගත කරන්න, මිනිස්සු වෙනුවෙන් පෙනී හිටපු ඉතාම විශිෂ්ට ගණයේ මානව හිතවාදියෙක් හැටියටයි දයාරත්න රණේපුරයන් අපි හඳුන්වන්නේ. අපි මෙලොව බිහි නොවූ කලෙක මේ රටේ වාමාංශික දේශපාලනයේ බොහෝ සංසිද්ධි ගණනාවක් ඉතිහාසය පුරා කියවලා තිබෙනවා. දොස්තර එස්.ඒ. වික්‍රමසිංහයන් හරහා ශ්‍රී ලංකාවේ කොමිනිස්ට් පක්ෂයත් එක්ක ඉතාම ප්‍රබල තරුණ ක්‍රියාකාරිකයෙක් හැටියට දේශපාලනයට පිවිසිලා, පැලියගොඩ සුළු නරග සභාව හරහා දේශපාලන මහජන සේවාවකට පත් වුණු කෙනෙක් හැටියටයි දයාරත්න රණේපුර මැතිතුමා අපි දකින්නේ. එතුමා වර්තමානයේ ඉන්න දේශපාලඥයින්ට හොඳ ආදර්ශයක්. මම දන්නේ නැහැ කොයි තරම් දුරට මේ ආදර්ශය භාර ගන්නවාද, පිළිපදිනවාද කියලා. මොකද, වාණිජකරණය, වාණිජ පරමාර්ථ, ආත්මාර්ථකාමී බොහෝ දේවල් අද දේශපාලඥයින්ගේ ගමන් මල්ලේ පුරවාගෙන තිබෙනවා.

හැබැයි එතුමාගේ ජීවිත කාලය තුළ එතුමා නියෝජනය කරන්නට හෘදය සාක්ෂියත් එක්ක වලංගු වුණු සමාජ නියෝජනය, තැලෙන පොඩි වන සාමාන්‍ය පන්තියේ මිනිස්සු වෙනුවෙන් මම මගේ මහජන මෙහෙවර කරනවා කියන උතුම් අදහසම, එතුමා මිය යන තෙක්ම සාක්ෂාත් කරපු විශිෂ්ට ගණයේ මන්ත්‍රීවරයෙක්. මහජන නියෝජිතයෙක් විතරක් නොවෙයි. හොඳ කලාකරුවෙක්. හොඳ සාහිත්‍ය ධරයෙක්. මට ආරංචි වුණා, එතුමා සභාවට ආවාම ඒ කාලේ අයවැය ඉදිරිපත් කරන කොට, වෙනත් යෝජනාවකදී සභාව ආරම්භ කරන කවි කිවිදියෝ කිහිප දෙනෙක් බස්නාහිර පළාත් සභාව නියෝජනය කළා. එක පැත්තකින් දයාරත්න රණේපුර කවියාගෙන් ගිලිහෙන රසවත් වදන් කිහිපයක් සමාජ පණිවිඩයක් රැගත් ඉතාම ලෙංගතු ආමන්ත්‍රණයක් කවියකින් පිට වනකොට අනෙක් පැත්තෙන් තවත් කවි කිවිදියෝ කිහිප දෙනෙක් මේ සභාව නියෝජනය කළා. ඒ කාලේ මම මතක් කරන්න ඕනෑ, අපේ වීරසේන පිටිගල. එතුමා මියගියා. එතුමා නියෝජනය කළේ අගලවත්ත ආසනය. ලංකා සමසමාජ පක්ෂයේ. 1988 දී. ඒ භීෂණ සමයේ මන්ත්‍රීතුමන්ලා විසි ගණනක් මේ රටේ ජීවිතය දන් දුන්නා. මේ පළාත් සභා ක්‍රමය තුළ. ඒ විධියට අපේ ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ වජිර පැල්පිට, ඒ වාගේම ප්‍රේමතිස්ස පෙරේරා අපි ලස්සනට කවි කියන්න කියලා යෝජනා කරනවා. ඉතින් මේ විශිෂ්ට මිනිසුන් දැන් මහ වනාන්තරයක තිබෙන වටිනා ගස්

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා]

කොලන් එකින් එක, එකින් එක උදුරා කපා විනාශ කරමින් යනවා වාගේ මේ සමාජ සේවාවට ආපු විශිෂ්ට ගණයේ මිනිස්සු දැන් නැහැ. ස්වාර්ථයෙන් බැහැර වුණු, පරාර්ථය සඳහාම දේශපාලනය තෝරා ගත්තු පිරිසක් හිටියා. 88 ත් මේ පිරිස සැහෙන ප්‍රමාණයක් හිටියා. බර්නාඩ් සොයිසා, වම්ලි ගුණවර්ධන, ඒ වාගේම මතක් කරන්න ඕනෑ කොට්ටාවේ චන්ද්‍රා ගුණසේකර, මොරටුවේ විමලසිරි ද මැල් මේ විශිෂ්ට දේශපාලඥයින්ගේ හඬ දැන් නැහැ. කොල්වින් ආර් ද සිල්වා විශිෂ්ට දේශපාලඥයෙක්. අගලවත්තේ මගේ ආසනයේ. අපි එතුමාගෙන් අත්පොත් තබපු දේශපාලඥයෝ. ඒ දේශපාලන ගමනට කොතැනක හරි තිත තැබෙන තැන තමයි දැන් යන්නේ. දැන් හුඟක් අය දේශපාලනයට එන්නේ මොනවටදෝ කියලා අපට කල්පනා කරන්න වෙනවා. පූර්වාදර්ශයන්, පරමාර්දර්ශී දේශපාලන චරිත සෑම පක්ෂයකම තිබෙනවා. දැන් සුසිල් මුණසිංහ මේ පළාත් සභාවේ කිත්සිරි කහටපිටිය මැතිතුමා දන්නවා. මේ පළාත් සභාවේ ආරම්භක මහ ඇමැතිවරයා. එතුමා ආරම්භ කරපු ඒ ප්‍රවේශය අපට අදත් ආදර්ශයක්. ඉතින් සුසිල් මුණසිංහ මහ ඇමැතිවරයා යටතේ තමයි දයාරත්න රණේපුර මැතිතුමා හිටියේ. ඒ කාලේ ඔසී අබේගුණසේකර මහත්තයාත් සමාජවාදී එක්සත් පෙරමුණ නියෝජනය කළා. මට අද වාගේ මතකයි ඒ කාලේ අමු භීෂණය තුළ සමාජවාදී එක්සත් පෙරමුණේ ඔසී අබේගුණසේකර මන්ත්‍රීතුමා යටතේ තමයි ගම්පහ දිස්ත්‍රික්කයෙන් තරග කළේ. ඇති වුණු කරුණු කාරණා කෙසේ වෙතත් මම කියන්න ඕනෑ ඉතාම නිහතමානී, සාහිත්‍යයෙන් පිරුණු, මිනිස්සුන්ට ලෙංගතුකමෙන් හෘදය සාක්ෂියෙන් පිරුණු ඉතාම නිහතමානී උස්ස ගණයේ මනුස්සයෙක්.

එක පැත්තකින් හොඳ තාත්තා කෙනෙක්. එතුමාගේ පුත්‍රරත්නය ජනක රණේපුර මේ දවස්වල මම හිතන්නේ මහනුවර අතිරේක දිසාපතිවරයා හැටියට කටයුතු කරනවා. මාත් සමග විශ්ව විද්‍යාල ජීවිතයේ අධ්‍යාපනය ලැබූ මගේ හොඳ ලෙංගතු මිත්‍රයෙක්. ලෙංගතු සහෝදරයෙක්. එතුමාගේ අභාවය ආරම්භ වුණු ගමන් මම සොයාගෙන ගියා. මොකද, මට පැති දෙකක් තිබුණා. එකක් අපේ පළාත් සභාවේ අපට පරමාදර්ශී චරිතයක්. මේ රටට, සාමාන්‍ය පන්තියේ මිනින්සුන්ට සේවය කරන. තමන්ගේ ජීවිතයේ අවසාන මොහොත දක්වා ගෙදරින් එළියට අඩිය තියන්නේම පරාර්ථය සඳහා. හැබැයි පියතුමෙකුගේ වගකීම ඉෂ්ට කළ නිසාවෙන් හොඳ පුතෙක් සහ දියණිවරු දෙදෙනෙක් මේ රටට බිහි කළා. අපේ ජනක රණේපුර පුතා අතිරේක දිසාපති හැටියට මහනුවර මහ දිසාපති කාර්යාලයේ කටයුතු කරනවා. මගේ විශ්ව විද්‍යාල ජීවිතයේ බොහොම කල්‍යාණ මිත්‍රයෙක්. ඒ හේතුත් අපට බලපෑවා.

ඒ නිසාවෙන් අද මම මතක් කරන්න ඕනෑ, අපට ඉතාම උසස් පරමාදර්ශී චරිතයක් හැටියටයි මම සලකන්නේ. ඒ නිසා අද වෙලාවේ හැටියට කල්පනා කරලා, අපට හොඳ පාඩමක් උගන්වලා තියෙනවා. අද මේ සභාවල් දිහා බැලුවාම, මේ සභා දිහා කෙරෙන කථා බැලුවාම එකිනෙකා අතර පුදුමාකාර වෛරී ස්වභාවයක් තිබෙන්නේ. පරණ කමට අපි නිහඬව ඉන්නවා. කාත් එක්කවත් ප්‍රශ්න හදා ගන්න යන්නේ නැහැ. කහටපිටිය මන්ත්‍රීතුමන්ලා අපි නිහඬව ඉන්නවා. අපි නිහඬව ඉන්නවා කියලා අපට මොනතරම් බාධක ආවත් අපි හෙල්ලෙන්නෙත් නැහැ. අපටත් හොඳ පිටකොන්දක් තිබෙනවා. අපි අවිචාර ලෙස, අපි අසංවර ලෙස සභාවේ හැසිරෙන්නවත් කල්පනා කරන්නේ නැහැ. සමාජයේ කල්පනා කරන්නේ නැහැ. සමහර තැන්වල අද මිනිස්සුන්ගේ තෝරා ගැනීමත්, පුළුවන් නම් මත්ද්‍රව්‍යවලින් මේ රටේ සල්ලි එකතු කරගත්තු මිනිහෙකුට වැඩි ඡන්ද ටිකක් දෙන්න, ගණන්කාරයෙකුට වැඩි ඡන්ද ටිකක් දෙන්න එහෙම නැත්නම් ස්ත්‍රී දූෂකයෙකුට වැඩි ඡන්ද ටිකක් දෙන්න මොකක් හරි සමාජ විරෝධී ක්‍රියාවක් කළොත්, ඔහුට සමාජයේ තැනක් ලැබෙන්නා වූ දේශපාලන ක්‍රමයකුත් තිබෙනවා. එවැනි තැනක අපට පොඩි අස්වැසිල්ලක් තිබෙනවා. මොකද, ඒ අස්වැසිල්ල මේ සභාව දිහා බැලුවාම බර්නාඩ් සොයිසා, චන්ද්‍රා ගුණසේකර, ඒ වාගේම අපේ කළුතර දිස්ත්‍රික්කයේ වම්ලි ගුණවර්ධන, ඒ පරපුරේ විශිෂ්ටතම හෘදය සාක්ෂියටම එකඟව වැඩ කරපු මේ නිහතමානී කලාකරුවා, සාහිත්‍ය ධරයා, මේ මානව හිතවාදී ගුණයෙන් පිරි දයාරත්න රණේපුර ආදරණීය මන්ත්‍රීතුමා ගැන අපි වරින් වර අපේ මතකයට ගෙනැල්ලා කල්පනා කරන්න යමක් ඉතුරු කරලා ගිහිල්ලා තිබෙනවා. ජීවත් වෙලා ඉන්න කොට මේ කරන කියන දේවල් තමයි හෙට අනිද්දාත් අපට කල්පනා කරන්න වෙන්නේ. මිය ගියාම මිනිස්සුන්ගේ සිත්වල හෘදය සාක්ෂිය තුළ මතක සටහනක් තියලා යන්න පුළුවන්කම තියෙන්න ඕනෑ. ඉතින් හුඟක් අය මිය ගියාම මිනිස්සු කියන්නේ, එයා තව ටිකක් කලින් ගියා නම් හොඳයි කියලා. රණේපුර

මැතිතුමා වාගේ අය මිය ගියාම කියන්නේ, තව දවසක් හරි හිටියා නම් හොඳයි කියලා. ඒ ගුණය තමයි අපේ හෘදය සාක්ෂියේ නිරන්තරයෙන්ම ජනිත වෙන්නේ. මේ වෙලාවේ බස්නාහිර පළාත් සභාවේ වත්මනේ වගකීම් දරන අපි එතුමාගේ පවුලේ ආදරණීයන් සියලු දෙනාට එතුමා වෙනුවෙන් අපේ කෘතවේදී ගෞරවය පිරි නමනවා. ඒ වාගේම මම විශ්වාස කරනවා. අපේ ආගම දහම අනුව එතුමා යහපත් ලෙස ආපහු දවසක මේ සංසාර භවයේ එතුමාට අවස්ථාව ලැබේවා. එතුමාගේ ගුණයන්, එතුමාගේ පරමාර්දර්ශී, පූර්වාදර්ශී මේ සියලු ගුණයන් අපට අත්විඳිමින් අපේ දේශපාලනය නිවැරැදි තැනක හැඩ ගස්වා ගන්නට අපට ශක්තියක් වනු ඇතියි කියලා අපි විශ්වාස කරනවා. එතුමාගේ පවුලේ අයටත් අපි මේ වෙලාවේ අපේ ශෝකය පළ කරනවා. ඒ වාගේම අපේ කෘතවේදීත්වය පළ කරනවා. බොහොම ස්තූතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, දයාරත්න රණේපුර මැතිතුමාගේ ශෝක යෝජනාවට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. එතුමා ග්‍රාම සේවකවරයෙකු හැටියට කටයුතු කරලා, දේශපාලනය ආරම්භ කරලා, පෑලියගොඩ නගර සභාවට පත් වෙලා, 1988 පළාත් සභාවට පත් වෙලා එක්සත් සමාජවාදී පෙරමුණේ හොඳ සාමාජියෙක් හැටියට කටයුතු කළා. ජේ.ආර්. - කොබ්බෑකඩුව ජනාධිපතිවරණය මට මතකයි මම තරුණ ළමයෙක් හැටියට එදා විජය කුමාරතුංග සහෝදරයාත් එක්ක මේ රට වටේම ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාව පරාජය කරන්න විශාල කාර්යභාරයක් දරපු කෙනෙක් තමයි අපේ දයාරත්න රණේපුර මැතිතුමා. ඒ වාගේම බලය බෙදීම සම්න්ධව උතුරේ තිබුණු මේ බෙදුම්වාදී, ත්‍රස්තවාදී අරගලයේදී එතුමාට දෙතුන් වරක් මරණීය තර්ජන ආවා. වෙඩි තැබීම්. ඒවාට මුහුණ දෙන්න සිද්ධ වුණා. මොකද, එතුමා හොඳ සමාජවාදී නායකයෙක් හැටියට බලය බෙදීම සම්බන්ධව සුළු ජාතීන් වෙනුවෙන් කථා කරපු කෙනෙක් තමයි අපේ රණේපුර මැතිතුමා. ඒ වාගේම මට මතකයි එතුමා කොබ්බෑකඩුව මැතිවරණයේ රට වටේම ගියා වාගේ විජය කුමාරතුංග එක්ක අපි 104 දෙනෙක් යාපනයට ගියා. අපේ සොල්දාදුවෝ 08 දෙනා අල්ල ගත්තු වෙලාවේ ඒ අය නිදහස් කර ගැනීම සඳහාත්, මේ යුද්ධය සම්බන්ධව සාමය ඇති කිරීම සඳහාත්. ඒ වෙලාවේ රණේපුර මැතිතුමා අනුරාධපුර දක්වා කෝච්චියෙන් ගිහිල්ලා, ඒ බස් ටික ජේ.ආර්. ජයවර්ධනගේ ආණ්ඩුවෙන් ජනතාවට නොදෙන කොට එතුමා නැවත විජය කුමරතුංග එක්ක කොළඹට ඇවිල්ලා, සාකච්ඡා කරලා මේ උතුරට යන්න අවසර ගත්තු පුද්ගලයෙක් තමයි අපේ රණේපුර මැතිතුමා. එතුමා ඒ වාගේ දේශපාලන ඉතිහාසයක් තිබෙන හොඳ වැඩක් කරපු, හොඳ වැඩක් කරන්න පුළුවන්, හොඳ උගත්කමක් තිබුණු දේශපාලන නායකයෙක්. ඉස්සර මේ වාගේ බැණ ගැනීම්, පෞද්ගලික මඩ ගැසීම් නැහැ. ඒ වාගේම මේ සභාවේ හැන්සාඩ් වාර්තා බැලුවාම ඒවායේ සටහන් කරපු දේවල් තිබෙනවා. එතුමාගේ හොඳ කටයුතු සම්බන්ධයෙන්. ඒ නිසා එතුමා අපට කරපු සේවාවට, විශේෂයෙන්ම අපේ පළාත් සභාවට එතුමා කරපු සේවාවට, ඒ වාගේම 13 වැනි සංශෝධනය සම්බන්ධව මේ රටේ බලය බෙදීම පිළිබඳව විශාල අරගලයක් එතුමා කරගෙන ගියා. ඒ නිසා අපි එතුමාට, එතුමාගේ දරුවන්ට, එතුමාගේ පවුලේ අයට විශේෂයෙන්ම අපේ ගෞරවනීය ශෝකය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු සභාපතිතුමනි, ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන මහජන නියෝජිතයෙක් හැටියට විශේෂයෙන් දයාරත්න රණේපුර මැතිතුමා පිළිබඳව යමක් සඳහන් කරන්න කැමැතියි. එතුමා මේ සභාව නියෝජනය කරන කාලයේ මා මේ සභාව නියෝජනය නොකළත් ගම්පහ දිස්ත්‍රික්කයේ සුවිශේෂ සේවාවන් රැසක් සිදු කරපු මහජන නියෝජිතයෙක්ම ගෞරවය පුද කිරීම අපේ වගකීමක්, යුතුකමක් වෙනවා. විශේෂයෙන් මගේ පියා එක්කත් එතුමාගේ සම්බන්ධතාවයක් තිබුණු නිසා වචන කිහිපයක් හරි සඳහන් කිරීම, මම හිතනවා යුතුකමක් කියන එක. විශේෂයෙන්ම ශ්‍රී ලංකා කොමිනිස්ට් පක්ෂයෙන් ක්‍රියාකාරී දේශපාලනයට ප්‍රවිෂ්ට වෙලා, ශ්‍රී ලංකා සමසමාජ පක්ෂයෙන් මහජන නියෝජිතයෙක් හැටියට එතුමා 1962 වර්ෂයේ පෑලියගොඩ නගර සභාව නියෝජනය කරමින් මන්ත්‍රීවරයෙක් හැටියට පත් වෙනවා. ඊට පසුව ඒ නගර සභාවේ උප සභාපතිවරයා හැටියට පත් වෙමින් පෑලියගොඩ නගර සභාව තුළ සුවිශේෂී සේවාවන් රැසක්, මාර්ග අලුතෙන් ඉදි කිරීම් වැනි සුවිශේෂී රාජකාරී විශාල ප්‍රමාණයක් එතුමා මහජන නියෝජිතයෙක් හැටියට ඒ ප්‍රදේශයේ ජනතාවට ලබා දෙනවා. ඒ අතරතුර එතුමා 1963 වසරේ ග්‍රාම නිලධාරී

[ගරු ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක]

මහත්මයෙක් හැටියට රජයේ සේවයට එක් වෙනවා. හැබැයි අවාසනාවන්ත විධියට එතුමාගේ සමාජවාදී දේශපාලන ක්‍රියාදාමය නිසාම 63 වසරේ ග්‍රාම නිලධාරී තනතුරට පත් වෙලා 66 වසර වනකොට එතුමාව සේවයෙන් පහ කරන තත්ත්වයකට පත් වෙනවා. එතුමාගේ සමාජ දේශපාලන ක්‍රියාකාරීත්වය මත. සමාජවාදී දේශපාලනය නිසාම මහජනතාවත් එක්ක හිටපු සමාජ සේවකයෙක් හැටියට කටයුතු කරපු එතුමා, එතුමාගේ රාජ්‍ය සේවය අවුරුදු තුනක් වාගේ කෙටි කාලයක් තුළ අවසන් කරනවා. ඒ කෙසේ වෙතත් එතුමා නැවත වතාවක් මේ රටේ පළාත් සභා ක්‍රමය බිහි වෙන්නට තිබෙන පළමුවැනි මැතිවරණය 1988 බලය බෙදා හැරිය යුතුයි කියන සංකල්පය මත පිහිටාගෙන කටයුතු කරන එතුමා විශාල දුක් ගැහැට රාශියකට මුහුණ දෙමින්, අභියෝග රාශියකට මුහුණ දෙමින්, අපි අහලා තිබෙන විධියට එවකට තිබුණු රාජ්‍ය භීෂණයත්, අනෙක් දේශපාලන පක්ෂයකින් තිබුණු භීෂණයත් එක්ක භීෂණ දෙකකට මැදිහත් වෙමින්, වෙඩි කමින්, එවැනි තාඩන පීඩන මධ්‍යයේ 1988 පළමු බස්නාහිර පළාත් සභාව එතුමා නියෝජනය කරනවා. එතුමා මේ පළාත් සභාවේ අවුරුදු පහක් තුළ ඉඳිමින්, පරණ හැන්සාඩ් බැලුවාම ජේනවා ඉතා ගාම්භීර අදහස් තිබෙන, සාරවත් අදහස්වලින් පළාත් සභා ක්‍රමය ශක්තිමත් කරමින් ප්‍රදේශයේ ජනතාවට සේවය සපයන්න එතුමා දීපු ආදර්ශය බොහෝමයි.

එතුමාගේ සාරවත් කථා තුළ බොහොම ලස්සනට කවියෙන් එතුමා උදාහරණ පෙන්වමින්, හාස්‍ය මුසු කරමින් බොහෝ ආකර්ෂණීය කථා කරපු අවස්ථා අපි දැකලා තිබෙනවා. එවකට අපි මේ සභාව නියෝජනය නොකළත්, එතුමාගේ අදහස් අපි අහලා තිබෙනවා. කවියෙන් බොහොම සුන්දර ආකාරයට මේ සියල්ල විග්‍රහ කරපු මහ දක්ෂ කවියෙක් හැටියට එතුමා අපේ ප්‍රදේශවල පමණක් නොව, මුළු රටේම බොහෝ දෙනෙක් පිළිගන්න හොඳ කවියෙක් කියන කාරණාව මේ වෙලාවේ මම මතක් කරන්න කැමැතියි. අද මේ සභාව නියෝජනය කරන අපි සියලු දෙනාම කථා වෙන්නේ, එතුමාගේ පළාත් සභා ධූර කාලය අවුරුදු 05 ක් කියන කාරණාව. නමුත් ගරු සභාපතිතුමනි, එතුමා නැවත මේ පළාත් සභා මැතිවරණයට 1993 දී ඉදිරිපත් වෙනවා. එතුමා මේ පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වෙලා, මට දැනගන්න තිබුණු කරුණුව අනුව, විශේෂයෙන්ම මගේ පියාත් එතුමාත් එක්ක ඒ මැතිවරණයට ඉදිරිපත් වුණා. ඒ මැතිවරණයේ සිදු වුණු යම් අක්‍රමිකතා නිසා එතුමාට මේ පළාත් සභා නියෝජනය කරන්න හැකියාව ලැබුණේ නැහැයි කියන කාරණාව බොහොම පැහැදිලිව මම මේ වෙලාවේදී සඳහන් කරනවා. එහෙම නැතිව එතුමාගේ තිබුණු අඩුවක් නිසා නොවෙයි. එතුමාට මහජනතාව මනාපය පාවිච්චි කළා. නමුත් මැතිවරණයේ තිබුණු අක්‍රමිකතා නිසා එතුමාට මේ සභාව නියෝජනය කරන්න ලැබුණේ නැහැ. එතුමා දීර්ඝ කාලයක් මම හොඳින්ම දන්නවා, ඊට විරුද්ධව උසාවියේ නඩුවක් පැවරුවා. විශාල කාලයක් එතුමා නඩු කිව්වා. එතුමාට තිබුණු හේතු සාධකත් එක්ක. ඒ නිසා මැතිවරණය සාධාරණව පැවැත් වූවා නම් මේ සභාවේ එතුමා සමහර විටක අපෙන් හැර යන මොහොතක දක්වා එතුමා මේ පළාත් සභාව නියෝජනය කරන්න ඉඩකඩ තිබුණා කියන කාරණාව මම මේ වෙලාවේ මතක් කරනවා. විශේෂයෙන් සාහිත්‍යධරයෙක් හැටියට එතුමා අවසන් මොහොතේත් ග්‍රන්ථයක් ලියලා තිබුණා. ලෙඩ ඇඳේ ඉඳගෙන, ඉස්පිරිතාලේ ඉඳගෙනත්. ග්‍රන්ථ 16 ක් සාහිත්‍යධරයෙක් හැටියට එතුමා පළ කරලා තිබෙනවා. ඒ නිසා කවියෙන්, සාහිත්‍යයෙන් සමාජ සේවකයෙක් හැටියට මේ රටට, විශේෂයෙන් ගම්පහ දිස්ත්‍රික්කයට සුවිශාල සේවාවක් කරපු මහජන නියෝජිතයෙක් හැටියට එතුමා අපට සඳහන් කරන්න පුළුවන්.

ඒ වාගේම එතුමා දුවරු දෙන්නෙක් සහ එක පුතණුවෙක් මේ සමාජයට බිහි කරලා, ජනක රණේපුර මැතිතුමා මහනුවර දිස්ත්‍රික්කයේ අතිරේක ලේකම්වරයා හැටියට කටයුතු කරමින් සමාජයට- එතුමාගේ තාත්තාගෙන් ලැබුණු ආභාසය අනුව විශාල සමාජ සේවයක් කරන්න පුළුවන් පුතෙක් මේ රටට දායාද කිරීමත් මම හිතන්නේ ලොකු වාසනාවක් හැටියට සලකන්න පුළුවන්. ඒ නිසා විශේෂයෙන් බලය බෙදීම පිළිබඳව වාමාංශික අදහස් සම්පූර්ණයෙන් හිතේ දරා ගනිමින් සාහිත්‍යයෙන්, කවියෙන්, දේශපාලනයෙන් මේ සමාජයට මහත් වැඩදායි වැඩ කොටසක් කරපු ඒ වාගේම රෙද්ද බැනියම ඇන්ද ජාතිකත්වය අගය කරපු කිසිදු අවස්ථාවක පෞද්ගලික ලාභ ප්‍රයෝජනවලට යට නොවුණු ඍජුව තමුන්ගේ අදහස් ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක වුණු සැබෑ මහජන නියෝජිතයෙක් කියන කාරණාව සඳහන් කරමින්, මමත් ප්‍රාර්ථනා කරන්නේ, අද වාගේ යුගයකට මේ රටට මේ වාගේ කවියෝ සමාජ සේවකයෝ දේශපාලඥයෝ

අවශ්‍යයි. ඒ නිසා නැවත නැවතත් අපි අතර ඉපදෙමින් මේ සභාවන් නියෝජනය කරන්න ශක්තිය, වාසනාව උදාවේවා කියන ප්‍රාර්ථනය සමගින් මම නිහඬ වෙනවා. බොහොමත්ම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අභාවප්‍රාප්ත හිටපු ගරු මන්ත්‍රී දයාරත්න රණේපුර මැතිතුමා වෙනුවෙන් බස්නාහිර පළාත් සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙක් විපක්ෂයේ සහ ආණ්ඩු පක්ෂයේ ශෝක යෝජනාවට අදහස් කිහිපයක් ඉදිරිපත් කළා. දයාරත්න රණේපුර ගරු මන්ත්‍රීතුමා ගම්පහ දිස්ත්‍රික්කයේ, මා ජීවත්වන ප්‍රදේශයේම නාගරික මන්ත්‍රීවරයෙක් වශයෙන්, උප නගරාධිපතිවරයෙක් වශයෙන් සහ බස්නාහිර පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරයෙක් වශයෙන් තමුන්ගේ දිස්ත්‍රික්කය වෙනුවෙන් ඉතාමත් වටිනා මෙහෙවරක් කරපු මන්ත්‍රීවරයෙක් හැටියට අපි දැනගෙන සිටියා. එතුමාට අපත් එක්ක බස්නාහිර පළාත් සභාව නියෝජනය කරන්න නොලැබුණත් 1993 අර ගුණසිරි ජයනාත් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කිව්වා වාගේ කුමන්ත්‍රණයක් තුළින් පරාජය වීම නිසා එතුමාට මේ සභාව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණේ නැහැ.

නමුත් එතුමා අපි හඳුනා ගත්තේ එතුමා ගම්පහ දිස්ත්‍රික්කයේ සංවිධානය කරන කවි සමුළුවලට අපි සහභාගි වෙලා තිබෙනවා. එතුමා දක්ෂ කවියෙක්. දක්ෂ ලේඛකයෙක්. ගම්පහ දිස්ත්‍රික්ක්යට වටින පුද්ගලයෙක්. මට මතකයි. ඒ දවස්වල යම් යම් අවශ්‍යතාවයන් සඳහා පළාත් සභාවට පැමිණිලා එතුමාත් එක්ක හිටපු ඒ මැති ඇමැතිතුමන්ලා එක්ක සම්බන්ධ වෙලා එතුමා ගම්පහ දිස්ත්‍රික්කය වෙනුවෙන් විශාල සේවාවන් ලබා ගන්න ගොඩක් කටයුතු කළා. ඒ නිසා එතුමාගේ අභාවය ඇත්ත වශයෙන්ම පළාත් සභාවට, විශාල පාඩුවක්. එතුමන්ලා වාගේ අය, අර අපේ ගරු අධ්‍යාපන ඇමැතිතුමා ප්‍රකාශ කළ පරිදි එදා තිබුණු පළාත් සභාව නොවෙයි අද තිබෙන්නේ. මම ඒක කියන්න ඕනෑ. අවුරුදු 13 ක් මූලාසනයේ නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක් වශයෙන් මම ඒක දැක්කා. එදා හිටපු ගරු මන්ත්‍රීවරු දක්ෂ කථිකයෝ, දක්ෂ විවාදකයන් අපට සිටියා. අදත් ඉන්නවා. නමුත් එදා, එතුමාගේ යුගයේ ඉතාම සාරගර්භ පළාත් සභාවක් තිබුණේ. ඒ නිසා එතුමාගේ අඩුව අපට පුරවන්න බැහැ. නමුත් එතුමා කරපු සේවය ඉතාමත් අමරණීයයි. එතුමා ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් ඉතාමත්ම ශ්‍රේෂ්ට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. ඒ නිසා එතුමා වෙනුවෙන් අපේ ආණ්ඩු පක්ෂය වෙනුවෙන් අපේ ගරු අධ්‍යාපන ඇමැතිතුමා, හිටපු අමාත්‍ය ජගත් අංගගේ මැතිතුමා, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, සභානායකතුමා, උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, සමසමාජ පක්ෂය වෙනුවෙන් කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා එතුමාට ශෝකය පළ කිරීම සඳහා අදහස් ප්‍රකාශ කළා. විපක්ෂය වෙනුවෙන් සිරිකමල් පිලිෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා විපක්ෂයේ අදහස් ප්‍රකාශ කළා. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා අද අසනීපයෙන් සිටින නිසා පැමිණියේ නැහැ. එතුමා මට කලිනුත් කිව්වා, අනිවාර්යයෙන්ම එතුමාත් අදහස් ප්‍රකාශ කරනවා කියන කාරණාව පිළිබඳව. ඒ නිසා මේ අවස්ථාවේදී මේ සභා ගර්භය තුළ අපේ ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමා සම්බන්ධව සිටිනවා. එතුමා කථා නොකළත් සභාපතිවරයා වශයෙන් මම බස්නාහිර පළාත් සභාවේ මගේ ශෝකය, ඒ පවුලේ මේ අවස්ථාවට සහභාගි වී සිටින ආදරණීය බිරිඳ, දියණිය, පුතා සහ බෑණා ඇතුළු සියලු දෙනාට මම පිරිනමනවා. ඒ වාගේම බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමා ඇතුළු සියලුම අමාත්‍යවරුන්ගේත් විපක්ෂ නායකතුමා, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු සියලුම මන්ත්‍රීතුමන්ලාගේත් ශෝකය පුද කර සිටිමින්, අභාවප්‍රාප්ත දයාරත්න රණේපුර මැතිතුමාට අපි කවුරුත් ප්‍රාර්ථනා කරන උතුම් අජරාමර අමා මහ නිවන් සුව අත්වේවා! කියා ප්‍රාර්ථනා කරනවා. මම ලේකම්තුමාට උපදෙස් දෙනවා. අද ශෝකය ප්‍රකාශ කරපු ගරු මන්ත්‍රීතුමන්ලාගේ කථා ඇතුළත් නිල හැන්සාඩ් වාර්තාව ඒ පවුලේ ඥාතීන්ට යවන ලෙසට. ඒ නිසා එතුමාට නැවත වරක් නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තූතියි.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු සභාපතිතුමනි, 36(1) වගන්තිය යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් මම ඉදිරිපත් කරන්නේ මට වන අසාධාරණයක් පිළිබඳවයි. රාගම තැපැල් කාර්යාලයෙන් තමයි මේ සිදුවීම සිදු වන්නේ. මට ජනවාරි මාසයේ හත් වැනිදා තිබෙන රැස්වීමේ අපේ Agenda එකත්, ඒ වාගේම පෙබරවාරි

[ගරු ජානක සූරියබණ්ඩාර]

මාසයේ 17 වැනිදා තිබුණු රැස්වීමේ Agenda එකත් මට ලැබුණේ දෙවැනි මාසයේ 09 වැනිදා. ඒ විතරක් නොවෙයි. ඒ සමගම මම මීට පෙර ගිහිල්ලා, මට ලිපි ප්‍රමාද වීම ගැන තැපැල් ස්ථානාධිපතිතුමාත් එක්ක කථා කෙරුවා. නමුත් මගේ ලිපිත් එක්ක ලැබුණා, අතිගරු ජනාධිපතිතුමාගේ අවුරුදු සුභ පැතුම් පණිවුඩය. ඒ වාගේම හිටපු ජනාධිපතිතුමාගේ අවුරුදු සුභපැතුම් පණිවුඩය. මෙවැනි වැදගත් ලිපි ලේඛන, රජය විසින් බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරයෙක් විධියට විශේෂයෙන්ම අපට එවන වැදගත් ලිපි ලේඛන මේ පසුගිය මාස තුන හතරක සිට උත්සවය අවසන් වෙලා ලැබෙන්නේ. නමුත් මම මන්ත්‍රීවරු, ඇමැතිවරු ආශ්‍රය කරන නිසා මට පණිවිඩය ලැබිලා මම සොයාගෙන යනවා මිසක් මට ලිපි ලේඛනවලින් ලැබෙන්නේ නැහැ. දැන් ඔබතුමා අධ්‍යයනය කරන්න. මට වාර දෙකක Agenda දෙකම ලැබුණේ දෙවැනි මාසයේ 09 වැනිදා. 17 රැස්වීමත් ඉවරයි. ජනවාරි මාසයේ. පෙබරවාරි 07 වැනිදා රැස්වීමත් ඉවරයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි මම දාන ලිපි, මගේ කාර්යාලයේ උත්සව වලට එන්න, නැත්නම් මොකක් හරි රාජකාරියක් සඳහා තැපැල් කරන ලියුම් මම ජනවාරි මාසයේ තැපැල් කරපු ලියුම් හම්බන්නේ දැනුයි. ඒ නිසා මම හිතනවා, කවුරු හරි මට විරුද්ධව ඉන්න කෙනෙක් ඒ තැපැල් ස්ථානයේ ඉඳගෙන මගේ ලියුම් හංගලා, මට එන ලියුම් හංගලා, මම දාන ලියුම් හංගලා ප්‍රමාද කරලා වැඩේ ඉවර වුණාට පස්සේ, ආපසු ඒ ලියුම් ලැබෙන්න සලස්සනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

සිරිකමල්.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

සිරිකමල් ගරු මන්ත්‍රතුමාත් ඉන්නේ අපේ ආසනයේ. ඒ නිසා ඒ අයට ලියුම් ලැබෙනවා. මට ලියුම් ලැබෙන්නේ නැහැ. මෙතැන මගේ වරප්‍රසාදයක් කඩ වෙලා තිබෙනවා. මම ලිපියක් සභාගත කරනවා.[12] තැපැල්පතිතුමාට දන්වලා වහාම මේ ගැන පරීක්ෂණයක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනිවාර්යයෙන්ම අපි ඒ ගැන පරීක්ෂණයක් පවත්වනවා.

[12] හැන්සාඩ් අංශයේ තබා ඇත.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මට විතරක් ලිපි ප්‍රමාද වෙන්න, මම දාන ලිපි විතරක් ලැබෙන්නේ නැති වෙන්න ප්‍රමාද වෙන්න හේතුව මොකක්ද කියලා සොයලා හේතුව මට දන්වා සිටින ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු මන්ත්‍රීතුමා කිව්ව විධියට සිරිකමල් ගරු මන්ත්‍රීතුමා විසින් සැලසුම් ආකාරයට තමයි ඒක සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා මම ඔබතුමා මගින් අවවාදයක් කරන්න කියලා ඉල්ලා සිටිනවා, සිරිකමල් ගරු මන්ත්‍රීතුමාට. එතුමා තමයි මේ වැඩේ කරලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සිරිකමල් ගරු මන්ත්‍රීතුමා මේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා බරපතළ ප්‍රකාශයක් කළේ. ඔය සිද්ධියට ඔබතුමා සම්බන්ධද? එහෙම කරන්නේ ඇයි?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමයි, මමයි අපි දෙන්නාම ඉන්නේ එකම තැපැල් බල ප්‍රදේශයේ. අපි දෙන්නාම වත්තල ආසනය නියෝජනය කෙරුවාට අපට තැපැල් තිබෙන්නේ ජා-ඇළ මැතිවරණ කොට්ඨාශයේ, රාගම තැපැල් කාර්යාලයට. ඉතින් මේකේ පිටිපස්සේ ඉන්නේ කවුද කියලා ඔබතුමාට හිතාගන්න පුළුවන්. දැන් ගියොත් බලාගන්න පුළුවන්. අදටත් එතැන තිබෙන්නේ, අද මේ වර්තමාන රජයේ ජනාධිපතිතුමාගේවත්, අගමැතිතුමාගේවත් ෆොටෝ එකක්වත් මේ තැපැල් කාර්යාලයේ නැහැ. මම කියන්නේ ඇත්තද බොරුද කියලා ගිහින් බලන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

එහෙම නම් මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ වැඩක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොහොම වුණත් අපි මේ සිද්ධිය ගැන සොයා බලන ලෙස ලේකම්තුමාට උපදෙස් දෙනවා, මේ සම්බන්ධයෙන් තැපැල්පතිතුමාට ලියලා පරීක්ෂණයක් කරන්නය කියලා. නමුත් ගරු මහ ඇමැතිතුමා බරපතළ ප්‍රකාශයක් කළේ. එතුමා කියනවා ඔබතුමා වග කියන්න ඕනෑය කියලා.

මීළඟට ශෝක ප්‍රකාශ යෝජනා යටතේම බස්නාහිර පළාත් සභාවේ හිටපු අභාවප්‍රාප්ත ගරු මන්ත්‍රී සරත් සුමනසේකර මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කිරීමේ යෝජනාව ඉදිරිපත් කිරීමේ අවස්ථාව. එම ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට ගරු සභානායක සුනිල් ජයමිණි මැතිතුමාට ආරාධනා කරනවා.

## ශෝක ප්‍රකාශ යෝජනා‍ව : II
## ගරු සරත් සුමනසේකර මැතිතුමා
## MOTION EXPRESSING CONDOLENCES : HON. SARATH SUMANASEKARA, MEMBER

**ගරු සුනිල් ජයමිණි -** සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, "*බස්නාහිර පළාතේ පළාත් සභාවේ පස්වන පළාත් සභාවට හා හයවන පළාත් සභාවට එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරමින් කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත් වී වසර 05 කට අධික කාලයක් බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කරමින් සිටි ගරු සරත් සුමනසේකර මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.*

*බස්නාහිර පළාතේ පළාත් සභාව එතුමාගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමාගේ අභාවය පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පළ කර සිටියි*" යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

ගරු සභාපතිතුමනි, සරත් සුමනසේකර මැතිතුමා 1956 ජූලි මාසයේ 25 වැනිදා උපත ලබලා, ජයසේන සුමනසේකර මැතිතුමා එතුමාගේ පියා. නාවලගේ වයලට් සෝමලතා කුරේ මහත්මිය එතුමාගේ මව. ඒ වාගේම සහෝදර සහෝදරියන් සිව් දෙනෙක් සිටින පවුලක දරුවෙක් ලෙස අපේ සරත් සුමනසේකර මැතිතුමා මෙලොව එළිය ලබනවා. සරත් සුමනසේකර මැතිතුමා පාසල් අධ්‍යාපනය ලබන්නේ නුගේගොඩ ශාන්ත ජෝන් විද්‍යාලයේ. පාසල් අධ්‍යාපනයෙන් පසුව එතුමා අක්ෂි පරීක්ෂාව පිළිබඳව විශේෂඥයෙක් හැටියට ජෝර්ජ් ගුණරත්න සමාගමේ වසර 04 ක පමණ සේවා කාලයක් ඉටු කරනවා. ඉන් පසුව එතුමා තමාගේම පෞද්ගලික ව්‍යාපාර ආරම්භ කරමින්, 1989 සිට 2016 දක්වා ස්ටාලිං සර්විස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු ලෙසත්, 1996 සිට 2007 දක්වා ප්‍රොපටි සේල්ස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු හැටියටත් කටයුතු කරනවා. එසේ කටයුතු කරමින් සිටින අතරතුර තමයි එතුමා බොරැල්ල ප්‍රදේශයේ පදිංචිව සිටි එනස්ට් එදිරිසිංහ මහතාගේ සහ ඩිල්ෂියා එදිරිසිංහ මහත්මියගේ ආදරණීය දියණිය සුදර්ශනී මෙනවිය සමඟ 1979 ජනවාරි 18 වැනිදා විවාහ දිවියට පත් වෙන්නේ.

ඉන් පසුව ගරු සභාපතිතුමනි, සරත් සුමනසේකර මැතිතුමා ආදරණීය දියණියක, ආදරණීය පුතණුවකුගේ දයාබර පියතුමෙක් බවට පත් වෙනවා. ඉන්පසුව එතුමා සමාජ සේවයට පිවිසෙනවා. සමාජ සේවයට පිවිසිලා ජන සහන පදනම ආරම්භ කරනවා. ජන සහන පදනම ආරම්භ කරලා ඒ ජන සහන පදනම මගින් පරිගණක පාඨමාලා, පාසල් උපකරණ, පාවහන්, ස්වයං රැකියා පුහුණු අවස්ථා, ඇස් කණ්ණාඩි ලබා දීම්, නිවාස සඳහා උපකරණ ලබා දීම් එතුමාගේ මඟ පෙන්වීම යටතේ කරමින්, ඒ ජන සහන පදනමින් කඩුවෙල මැතිවරණ කොට්ඨාශයේ කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාවට අතිමහත් සේවයක් කරනවා. එතුමා ක්‍රියාකාරී දේශපාලනයට පිවිසෙන්නේ ඉන් පසුවයි. ජන සහන පදනම ආරම්භ කරමින් කඩුවෙල ප්‍රදේශයේ කටයුතු කරන අතරතුර එතුමා 2004 වර්ෂයේ පවත්වපු කඩුවෙල ප්‍රාදේශීය සභා මැතිවරණයට ඉදිරිපත් වෙනවා. කඩුවෙල ප්‍රාදේශීය සභා මැතිවරණයට ඉදිරිපත් වෙලා ප්‍රථම වරට එතුමා කඩුවෙල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට තේරී පත් වෙනවා. ඉන් පසුව පළාතේ ජනප්‍රිය දේශපාලඥයෙක් හැටියට එතුමා පත් වෙනවා. එය අපි කවුරුත් දන්නා කාරණාවක්. සරත් සුමනසේකර මැතිතුමා කාගේත් ආදරය ගෞරවය දිනාගෙන කඩුවෙල නගර සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට පත් වෙලා, ඒ පත්වීමත් සමඟ 2009 පවත්වපු පළාත් සභා මැතිවරණයට එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරමින් බස්නාහිර පළාත් සභාවට

[ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා]

තේරී පත් වෙනවා. බස්නාහිර පළාත් සභාවට 2009 තේරී පත් වෙලා ඉන් පසුව 2014 මැතිවරණයටත් එතුමා තරග වදිනවා. ඒ මැතිවරණයෙනුත් එතුමා ජයග්‍රහණය කරලා පළාත් සභාවට තේරී පත් වෙනවා. පළාත් සභාවට තේරී පත් වීමෙන් පසුව එතුමා අපේ පළාතේ මන්ත්‍රීවරුන් අතර - විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. සරත් සුමනසේකර මැතිතුමා ඉතා ජනප්‍රිය මන්ත්‍රීවරයෙක් බවට පත් වෙනවා. මොකද, එතුමා බොහෝ අවස්ථාවල මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්න පිළිබඳව, මන්ත්‍රීවරුන්ගේ ගැටලු පිළිබඳව මේ සභාව තුළත්, ඒ වාගේම එතුමා නියෝජනය කරපු කාරක සභා අවස්ථාවන් තුළත් තමන්ගේ මතය ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයෙක්. ඒ පළාත් සභා සේවය තුළ එතුමා තමන් නියෝජනය කරපු කඩුවෙල ආසනයට අතිවිශාල සේවයක් එතුමා, එතුමාගේ කාලයේදී ඉටු කරනවා. අපි දන්නවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බොහෝ කැප වෙලා කටයුතු කරපු නායකයෙක් තමයි සරත් සුමනසේකර මැතිතුමා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කටයුතුවලදී සරත් සුමනසේකර මැතිතුමා ඉතා වෙහෙස මහන්සි වෙලා තමන්ගේ ධනය, තමන්ගේ කාලය වැය කරලා ඒ පක්ෂය ඉස්සරහාට ගෙනෙන්න එතුමා කටයුතු කළා.

නමුත් අපි දන්නවා. එතුමා ඉන් පසුව දේශපාලන කටයුතුවල නිරත වන කාල සීමාව තුළ තමන්ට පුළුවන් ආකාරයට තමන්ගේ කටයුතු කරමින් විශේෂයෙන්ම ආදරණීය බිරිඳ සමඟ තමන්ගේ දරුවන් සමඟ ඉතාම සමගියෙන් ජීවත් වෙලා බොහෝ විශාල සේවයක් මේ පළාතට කරපු කෙනෙක්. සරත් සුමනසේකර මැතිතුමා කඩුවෙල ආසනයේ බොහෝ දෙනා අතර ඉතා ජනප්‍රිය කෙනෙක්. සරත් සුමනසේකර මැතිතුමා හදිසියේ අසනීප තත්ත්වයට පත් වෙනවා. ඒ පත්වීම සමඟ එතුමා තමන්ගේ ජීවිතය කෙටි කරගන්න එතුමාට සිද්ධ වෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම පළාත් සභාවේ අපි ළඟින් ඇසුරු කරපු මන්ත්‍රීවරයෙක්. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් අතර ඉතාම ජනප්‍රිය මන්ත්‍රීවරයෙක් බවට පත් වෙලා සිටියා. ඒ වාගේම පක්ෂයේ නායකයින් අතරත් ඉතා ජනප්‍රිය දේශපාලඥයෙක් බවට පත් වෙලා සිටියා කියන එකත් මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. එසේ මතක් කරමින් සරත් සුමනසේකර මැතිතුමා කරපු සේවය යළි යළිත් අගය කරමින්, සරත් සුමනසේකර මැතිතුමාට අප කවුරුත් බෞද්ධයන් හැටියට ප්‍රාර්ථනය කරන ශාන්ත අමා මහ නිර්වාණ සම්පත්තිය ලැබේවා! කියා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීවරුනි. ශෝක යෝජනා දෙකක් අද දවසේ මේ සභාවේ සාකච්ඡාවට භාජනය වුණා. නමුත් මෑත ඉතිහාසයේ ශෝක යෝජනා පැවැත් වූ සංඛ්‍යාව බැලුවායින් පස්සේ සරත් සුමනසේකර කියන අපේ හිතවතා, අපේ මන්ත්‍රීතුමාගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු නියෝජ්‍ය සභාපතිතුමා පොඩ්ඩක් සමාවන්න. මේ ශෝක යෝජනා පැවැත්වෙන අවස්ථාවේදී ගරු මන්ත්‍රීවරු තමන්ගේ ආසනවලට ගියා නම් හොඳයි. එතකොට අනවශ්‍ය සාකච්ඡාවල යෙදෙන්නෙත් නැහැ. ශෝක ප්‍රකාශයට අවධානය එතකොට යොමු වෙනවා.

**ගරු යසපාල කෝරළගේ -** නියෝජ්‍ය සභාපතිතුමා
Hon . Yasapala Koralage - Deputy Chairman

මන්ත්‍රීතුමා වෙනුවෙන් අද මේ අවස්ථාවේ ශෝක යෝජනාව පැවැත්වෙන වෙලාවේ මේකේ මහා විශාල වෙනස්කමක් තිබෙනවා. වෙනසක්. මොකද, අපිත් එක්ක මේ සභාවේ ඉඳලා අපිත් එක්ක මේ සභාවේ සියලු දේවල් එකිනෙකාට බෙදාගෙන අපි අතර ඉතාමත්ම ජනප්‍රිය තලයේ හිටපු අපි අතර විශාල සහෝදරත්වයකින්, ප්‍රේමයකින් හිටපු මන්ත්‍රීවරයෙක් පිළිබඳවයි අද මේ ශෝක යෝජනාව ගෙනෙන්නේ. විශේෂත්වයක් තිබුණා. අපි හැමෝම කළුතරින්, එහෙම නැත්නම් ගම්පහින් වෙනත් පළාත්වලින් ආපු මන්ත්‍රීවරු වාගේ නොවෙයි. මේ සභාවට කිට්ටුම තැන හිටපු මන්ත්‍රීවරයා තමයි සරත් සුමනසේකර මන්ත්‍රීතුමා. ඒක නිසා අනික් අයට වඩා වෙනම කැප කිරීමක්, මේ සම්බන්ධව වෙනම අවධානයක් යොමු කිරීමක් අනික් අයත් එක්ක විවිධ සම්බන්ධ ජාලයක් ඇති කරගත්තු මන්ත්‍රීවරයෙක් තමයි සරත් සුමනසේකර මන්ත්‍රීතුමා. එම නිසා එතුමාගේ අභාවය පිළිබඳව මම හිතනවා, මේ සභාවේ ඉන්න ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ ඉන්න මන්ත්‍රීතුමන්ලා 104 දෙනාම, එදා තමන්ගේ නෙතින් කඳුලක් හෙළුවා.

හැම කෙනාම. මොකද, මේ සභාවේ කිසිම මන්ත්‍රීවරයෙක් සරත් සුමනසේකර මන්ත්‍රීතුමාත් එක්ක අමනාපයෙන් සිටියේ නැහැ. මත ගැටුමකින්වත් පෞද්ගලිකවත් කිසිම කෙනෙක් අමනාපයෙන් සිටියේ නැති මන්ත්‍රීවරයෙක් තමයි සරත් සුමනසේකර මන්ත්‍රීතුමා. ඒ නිසා එතුමා විශාල කැප කිරීමක් කරලා අපත් එක්ක සිටියා. මේ පිළිබඳව දිගින් දිගටම කථා කරන්න අපේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ අවස්ථාවේ බලාගෙන සිටිනවා. ගරු සරත් සුමනසේකර ගරු මන්ත්‍රීතුමාගේ භාර්යාව, ඒ දරුවන් ඇතුළු ඒ සියලු දෙනා අපි ඒ නිවසට ගිය අවස්ථාවලදී අපේ මන්ත්‍රීවරුන් වෙනුවෙන් කැප කිරීම් කළා. මොකද, මේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා ඒ නිවසට ගිහින් තිබෙනවා. ඒ ගෙදරින් තේ එකක් බීලා තිබෙනවා. මේවා අපි බොහොම සංවේදීවයි මතක් කරන්නේ. එහෙමනම් මම දිගින් දිගට කථා කරන්නේ නැහැ. කාලවේලාව නොමැති නිසා. මම අවසාන වශයෙන් අපේ හිතවතා, අපේ ගරු මන්ත්‍රීතුමාට එතුමා බලාපොරොත්තු වන තැනකින් නිවන් සුව අත්වේවායි! කියා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. මෙම කාලය ලබා දීම පිළිබඳව ගරු සභාපතිතුමාට බොහොමත්ම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපති යසපාල කෝරළගේ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාව නියෝජනය කරපු අපේ හිතවත් සහෝදර මන්ත්‍රීවරයෙක් මීට ටික දිනකට පෙර අපෙන් වෙන් වෙලා ගියා. කඩුවෙල ආසනය නියෝජනය කරමින් බස්නාහිර පළාත් සභාව දෙවතාවක් නියෝජනය කරපු සරත් සුමනසේකර මැතිතුමා. එතුමා පිළිබඳව අපි මේ ශෝක ප්‍රකාශය, ප්‍රකාශ කරන අවස්ථාවේදී අපේ අදහසක් ප්‍රකාශ කිරීම මම හිතන්නේ, ඉතාමත් වටිනා දෙයක්. සරත් සුමනසේකර මැතිතුමා කඩුවෙල ආසනය නියෝජනය කරමින්, කඩුවෙල මහ නගර සභාවේ මන්ත්‍රීවරයෙක්, ඒ වාගේම බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක්, ඒ වාගේම කඩුවෙල ආසනයට විතරක් නොවෙයි. මුළු කොළඹ දිස්ත්‍රික්කයටම ඉතා විශාල සේවයක් කරපු මහජන නියෝජිතයෙක් වශයෙන් අපට එතුමාව හඳුන්වන්න පුළුවන්. එතුමා එතුමාගේ පෞද්ගලික ධනය, කාලය කැප කරලා මුළු කොළඹ දිස්ත්‍රික්කය පුරාම ඉතා විශාල සමාජ සේවයක් කරපු මහජන නියෝජිතයෙක්. එතුමා කඩුවෙල නගර සභාවට, බස්නාහිර පළාත් සභාවට ඒ කැප වුණු කාලය තුළ එතුමාගේ සම්පූර්ණ ජීවිතයේ වැඩි හරියක් ගත කළේ ඒ සමාජ සේවය වෙනුවෙන්. ඒ සමාජ සේවය වෙනුවෙන්, එතුමා හැම ප්‍රදේශයකම තමන්ගේ සේවාව නොපිරිහෙලා ඉටු කරපු මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම බස්නාහිර පළාත් සභාව තුළදී අපට හමු වෙන ඉතාමත්ම ළෙංගතු, සහෝදර බැඳීමකින් යුතු මන්ත්‍රීවරයෙක් වශයෙන් අපට හඳුන්වන්න පුළුවන්.

අපේ නියෝජ්‍ය සභාපතිතුමා කිව්වා වාගේ, එතුමාගේ අභාවය දැන ගත් මොහොතේම අපි හැම මන්ත්‍රීවරයෙකුටම දරා ගන්න බැරි ශෝකයක් ඇති වුණා. එතුමා බස්නාහිර පළාත් සභාවේදී අපට මොනම දෙයකදී හමු වුණත් එතුමා හැම මන්ත්‍රීවරයෙකු සමඟම ඉතාමත් ළෙංගතු සම්බන්ධතාවයක් තිබුණා. එතුමා කිසිම දෙයක් හිතේ තියා ගෙන, තව කෙනෙකුට ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය වපුරපු මන්ත්‍රීවරයෙක් නොවෙයි. එතුමා එතුමාට කරන්න පුළුවන් මොන උදව්වක්ද? මොන දෙයක්ද ඒ දේ ඉතා ළෙංගතුව කළා. ඒ මන්ත්‍රීවරු අතර ඉතාම සහෝදරත්වයක් එතුමා පවත්වාගෙන ගියා. ඒ බැඳීම, එතුමාගේ නැති අඩුපාඩුව අද බස්නාහිර පළාත් සභාවේ අපට තිබෙනවා. බස්නාහිර පළාත් සභාව නියෝජනය කරමින් අපි කොහේ හරි ගියා නම්, ඒ හැම අවස්ථාවකදීම අපට සරත් සුමනසේකර මන්ත්‍රීතුමාව අදත් මතක් වෙනවා. විදේශ ගමනක්, එහෙම නැත්නම් වැඩමුළුවකට, රැස්වීමකට ගියාම, ඒ හැම අවස්ථාවකදීම අදටත් සරත් සුමනසේකර ගරු මන්ත්‍රීතුමාව මතක් වෙනවා. මොකද, එතුමා අමතක නොවන චරිතයක් බවට පත් වෙලා තිබුණා. එතුමා ඒ හැම අවස්ථාවකදීම ඉතා විනෝදශීලීව, සංග්‍රහශීලීව කටයුතු කළා. ඔබතුමා කිව්වා වාගේ, අපි එතුමාගේ නිවසට ගිහිල්ලා තිබෙනවා. සංග්‍රහ භුක්ති විඳලා තිබෙනවා. එතුමා ඒ වාගේ ආකාරයෙන් කටයුතු කළා. ඒ වාගේම එතුමා දේශපාලන ව්‍යාපාරය තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් එතුමාට කරන්න

[ගරු ජනක වැලිවත්ත]

පුළුවන් උපරිම කැප වීම කරපු මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම පසුගිය ආණ්ඩු පරාජයෙන් පස්සේ මහින්ද රාජපක්ෂ මැතිතුමාව නැවත ජයග්‍රහණය කරා ගෙනෙන වැඩ පිළිවෙළ තුළ එතුමා හිටියා. එතුමා ඒ සඳහා අවශ්‍ය කරන මග පෙන්වීම කළා. ඒ සඳහා අවශ්‍ය කරන එකමුතු කිරීම කළා. මට මතකයි, එක අවස්ථාවක එතුමාගේ නිවසට අපි සියලු දෙනාව කැඳවලා, හිටපු ජනාධිපතිතුමාව ගෙනැල්ලා එතැන සාකච්ඡා කරලා, ඒ වැඩ පිළිවෙළ පිළිබඳව එදා එතුමා ඉදිරියෙන්ම හිටියා. ඒ නිසා සරත් සුමනසේකර මැතිතුමා හදිසියේ, අපි කවුරුත් බලාපොරොත්තු නොවුණු විධියට අපෙන් වෙන් වීම අපට පමණක් නොවෙයි, එතුමාගේ පවුලේ උදවියට පමණක් නොවෙයි, මුළු මහත් සමාජයටම වුණු පාඩුවක් හැටියට හඳුන්වමින්, මේ අවස්ථාවේ තවත් මන්ත්‍රීවරුන් අදහස් පළ කරන්න සිටින නිසා එතුමාගේ පවුලේ ආදරණීය භාර්යාව, දුව, පුතා ඇතුළු සියලුම දෙනාට අපගේ ශෝකය ප්‍රකාශ කරනවා. මම එතුමාට නැවත වරක් මේ සමාජ සේවය කරන්න අවස්ථාව ලැබිලා අවසානයේදී එතුමා බලාපොරොත්තු වන අජරාමර නිවන් සුව අත්වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සරත් සුමනසේකර මැතිතුමා ගැන අපි එක්සත් ජාතික පක්ෂයත්, විපක්ෂ වෙනුවෙනුත් ශෝකය ප්‍රකාශ කරන්න ඕනෑය කියලා මම අදහස් කළා. මොකද, විශේෂයෙන්ම අපේ ගරු විපක්ෂ නායකතුමා අසනීපයෙන් සිටින බැවිනුත්, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් අසනීප වෙලා මෙම සභාවට නොපැමිණීම නිසත් මම හිතුවා අපට විශේෂ වගකීමක්, යුතුකමක් තිබෙනවා අපේ සහෝදරයෙකු වෙනුවෙන් යම්කිසි ශෝකයක් ප්‍රකාශ කරන්න. සරත් සුමනසේකර මැතිතුමාත් එක්ක මට දීර්ඝ කාලීනව දේශපාලන සම්බන්ධතාවයක් හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් සම්බන්ධ වෙන්නත් අවස්ථාවක් ලැබුණේ නැහැ. මම සරත් සුමනසේකර මැතිතුමාව ආශ්‍රය කරන්න ගත්තා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සභා කටයුතු කාරක සභාවේදී. එතැනදී මම එතුමාව බොහොම ළඟින් ඇසුරු කළා. පළාත් සභා මන්ත්‍රීවරයෙකු විධියට අපි සාමාන්‍ය විධියට ඇසුරු කළත් මට දැන ගන්න ලැබුණේ, එතුමා බොහොම නිහතමානී, බොහොම අහිංසක, අසරණ හදවතක් තිබෙන පුද්ගලයෙක් බවයි. එතුමාට මට දැන ගන්නට ලැබුණු විධියට එතුමාට එහෙම ඉන්න අවශ්‍ය පුද්ගලයෙකුත් නොවෙයි. එතුමාට ලංකාවේ ඉන්නවා නම් බොහොම ප්‍රභූවරයෙක්, කෝටිපතියෙක් ජීවත් වන ආකාරයෙන් ජීවත් වෙන්නත් පුළුවන් චරිතයක් එතුමා. නමුත් එතුමා බොහොම නිහතමානීව ජීවත් වුණා. අද මම විශ්වාස කරනවා. එතුමා මේ රටේ පවතින, අද මේ අපිත් එක්ක ඉන්න දේශපාලඥයින්ට හොඳ ආදර්ශවත් චරිතයක් බවට පරිවර්තනය වුණාය කියලා. මොකද අර කියමනක් තිබෙනවා, පිරුණු කළේ දිය නොසැලේ කියලා. එතුමා ඒ වාගේ චරිතයක් කියලා මම විශ්වාස කරනවා. එතුමාත් එක්ක වැඩ කටයුතු කරන කොට අපි සභා කටයුතු කාරක සභාවේදී ගරු සභාපතිතුමාත්, සභා ලේකම් කාර්යාලයේ නිලධාරී මහත්වරුන්ට වුණත් කිසිම ප්‍රශ්නයක් වුණේ නැහැ. බොහොම නිදහසේ අපිත් එක්ක එකට එකතු වෙන්න, එක මතයකට එන්න බොහොම පැහැදිලි කණ්ඩායමක් වශයෙන් එතුමා මේ සභා කටයුතු කාරක සභාවේ සම්බන්ධ වෙලා වැඩ කරන කොට අපිත් එක්ක සම්බන්ධ වෙලා වැඩ කටයුතු කරන්න උදව් උපකාර කළා. මම විශේෂයෙන් ඒක මතක් කරන්න ඕනෑ. මට අද වාගේ මැවිලා පේනවා. එතුමා බොහොම නිදහස් චරිතයක්. ඇඳුමක් ඇන්දත් බොහොම නිදහස් විධියට ඇඳගෙන, බොහොම සිනහාමුසු මුහුණින් ඇවිල්ලා අපිත් එක්ක කථා කරලා ඒ ප්‍රශ්න, තර්ක විතර්ක කරලා ඒවා විසඳාගෙන යන චරිතයක්. එහෙම නම් මම පැහැදිලි බෞද්ධයකු වශයෙන් විශ්වාස කරනවා. සරත් සුමනසේකර මැතිතුමා දිනුම්. මොකද, එතුමා ඉක්මනට ඒ අසනීපය වැළඳුනා. පිළිකා රෝගය. බොහොම ඉක්මනට එතුමා ජීවිතයත් අවසන් කළා. මොකද, සමහර අය පිළිකා රෝගය වැළඳිලා ගොඩක් කල් විඳවමින් ඉඳලා තමයි නැති වෙන්නේ. එහෙම නම් එතුමා අප අතරින් වෙන් වුණා. අපි එතුමාට ප්‍රාර්ථනා කරමු නැවත මෙවන් අකල් මරණයකට ගොදුරු නොවේවායි කියලා. මම සමස්ත එක්සත් ජාතික පක්ෂයත්, සමස්ත විපක්ෂය වෙනුවෙනුත් මගේ ශෝකය ප්‍රකාශ කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් දීර්ඝ කාලයක් දේශපාලන ජීවිතයට

**0329**

පිවිසිලා කඩුවෙල මැතිවරණ කොට්ඨාශය පමණක් නොවෙයි, කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් විශාල වැඩ කොටසක් කරන්න බලාපොරොත්තුවෙන් සිටි අපේ හිතවත් සරත් සුමනසේකර මැතිතුමා අපි කවුරුවත් නොහිතපු වෙලාවක අප අතරින් වෙන් වුණා. සරත් සුමනසේකර මහත්මයා කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරමින්, කඩුවෙල මැතිවරණ කොට්ඨාශය තමයි එතුමාගේ දේශපාලනයේ ආරම්භය. කඩුවෙල මහ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙක් හැටියට එතුමා තමන්ගේ මැතිවරණ බල ප්‍රදේශයට යම්කිසි සේවාවක් ඉෂ්ට කරපු නිසා තමයි පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වුණු පළමුවැනි අවස්ථාවේදීම විශාල ඡන්ද සංඛ්‍යාවක් අරගෙන කඩුවෙල මැතිවරණ කොට්ඨාශයෙන් බස්නාහිර පළාත් සභාවට තේරුණේ. ඒ පළාත් සභාවේ අවුරුදු පහක් එතුමා ජනතා සේවයට පත් වෙලා, ඊළඟ පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වුණු වෙලාවේ එතුමාට ජයග්‍රහණය කරන්නට මනාප ප්‍රමාණයක් අඩු වුණා. එතුමා තමන්ගේ පෞද්ගලික ව්‍යාපාර කටයුතු කර ගෙන ඉන්න වෙලාවේ මේ පළාත් සභාවේ මන්ත්‍රීවරු දෙදෙනෙකුගේ පුරප්පාඩු හදිසියේ ඇති වුණා. ඒ පුරප්පාඩු දෙකටම නැවත වතාවක් පළාත් සභා මන්ත්‍රීවරුන් හැටියට අතිගරු ජනාධිපතිතුමා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මන්ත්‍රීවරු දෙදෙනෙක් කොළඹ දිස්ත්‍රික්කයෙන් පත් කළා. ඒ එක්කෙනෙක් තමයි අපේ සරත් සුමනසේකර මැතිතුමා. අනික් කෙනා තමයි මොරටුව ප්‍රදේශය නියෝජනය කරන වර්තමාන පළාත් සභා මන්ත්‍රී මොරිස් විජේරත්න මැතිතුමා. අතිගරු ජනාධිපතිතුමා ඒ පත්වීම කළා.

පසුගිය කාල පරිච්ඡේදය තුළ එතුමාට ලොකු ගමනක් යන්න තිබුණා. අපි හිතපු නැති වෙලාවක එතුමා අවසන් ගමන් ගියා. මගේ මැතිවරණ කොට්ඨාශයට අල්ලපු මැතිවරණ කොට්ඨාශය තමයි කඩුවෙල. එතුමාගේ පළාත් සභා ප්‍රතිපාදනවලට අමතරව එතුමාගේ පෞද්ගලික මුදල් මගේ මැතිවරණ කොට්ඨාශය වන හෝමාගම මැතිවරණ කොට්ඨාශය වෙනුවෙනුත් එතුමා වැය කරලා තිබෙනවා. අපේ ආසනයේ හුඟක් සමිති සමාගම්, ක්‍රීඩා සමාජ පෞද්ගලිකව මුදලක් ලබා ගන්න යන්නේ සරත් සුමනසේකර මැතිතුමා ළඟට. ඒක හැම දේශපාලඥයෙකුටම කරන්න පුළුවන් දෙයක් නොවෙයි. නමුත් ඒක සරත් සුමනසේකර මහත්තයා කළා. පළාත් සභාවට ලැබෙන ප්‍රතිපාදන පමණක් නොවෙයි. තමන්ගේ

**0330**

පෞද්ගලික ධනය තමන්ගේ මැතිවරණ කොට්ඨාශයටත් එහා ගිහිල්ලා, වෙනත් මැතිවරණ කොට්ඨාශයක ජනතාව වෙනුවෙන් වැය කරන්න කටයුතු කළා. ඒ නිසා අපි දැන ගෙන හිටියා මගේ හෝමාගම මැතිවරණ කොට්ඨාශයේ වුණත් විවිධ සංවිධාන, පෞද්ගලිකවම මුදලක් ගන්න ඕනෑ වුණාම ගිහිල්ලා හමු වෙන්නේ සරත් සුමනසේකර මැතිතුමාව. එතුමා ඒක ඉෂ්ට කළා. ඒ නිසා පසුගිය කාල පරිච්ඡේදය තුළ සරත් සුමනසේකර මැතිතුමා දේශපාලන වශයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කළා. ඉතාමත්ම දක්ෂ මන්ත්‍රීවරයෙක් හැටියටත්, ඒ වාගේම හොඳ සමාජ සේවකයෙකු හැටියටත් ඒ ප්‍රදේශය තුළ කෙටි කාලයක් තුළ ඉතාමත්ම ජනප්‍රියත්වයට පත් වුණා. ඒ නිසා එතුමාගේ දේශපාලන ජීවිත කාලය තුළ යමක් ඉදිරියට කරන්න තිබුණු මොහොතක්. ඒ වාගේම තමන්ගේ දරුවන්, තමන්ගේ භාර්යාව, මොන තරම් බලාපොරොත්තු රාශියක් තියාගෙන ජීවත් වුණාද? කිසිම කෙනෙක් නොහිතපු වෙලාවක එතුමාට මෙළොවින් යන්න සිද්ධ වුණා. ඒ නිසා ඒ වෙලාවේදී අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අපි සියලුම දෙනා එතුමා වෙනුවෙන් ශෝක වුණා. කනගාටු වුණා. යමක් කරන්න දෙයක් තිබුණා නම්, අපි ඒ දේවල් කළා. ඒ නිසා දීර්ඝ කාලයක අපේ මිතුදමක් තිබුණු සරත් සුමනසේකර මැතිතුමා දේශපාලන වශයෙනුත්, කිසිම වෙලාවක වැරදි වැඩකට අත යොමු කරන්නේ නැතිව, තමන්ගේ අතින් ඉෂ්ට වෙන්න තිබුණු, දේශපාලන වශයෙන් ජනතාවට ඉෂ්ට වෙන්න තිබුණු සියලුම යුතුකම් ටික කෙටි කලක් තුළ ඉෂ්ට කළා. ආදරණීය භාර්යාව, ආදරණීය දරුවන් දෙපළක් මෙළොවට බිහි කරලා, එතුමා ඒ අතිනුත් සමාජයට තමන් නැති වුණත් අද ඒ ගමන යන්නට දරුවන් දෙදෙනෙක් බිහි කරලා මේ සමාජයට දායාද කළා.

ඒ නිසා අපි හැම කෙනෙක්ම මොන තැනක හිටියත් ගරු සභාපතිතුමනි, මොන තනතුරු තිබුණත්, මොන තරම් මිල මුදල් තිබුණත් අපි හැම කෙනෙකුටම හිතා ගන්න සිද්ධ වෙලා තිබෙනවා, අපටත් මේ ගමන යන්න සිද්ධ වෙනවා කියලා. ඒ නිසා අපි ජීවත් වන කාලය තුළ දේශපාලනය කළත්, සමාජ සේවය කළත්, ආගමික වතාවත් කළත් ඒ හැම දෙයක්ම ජනතාවගේ අවශ්‍යතාවයන් මත ඉෂ්ට කරපු පුද්ගලයෙකු තමයි සරත් සුමනසේකර මැතිතුමා. ඒ නිසා මම දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නේ නැහැ. මම එතුමාව බොහොම හිතවත් මිත්‍රයෙකු හැටියට ළඟින්

ඇසුරු කළා. ඒ නිසා අපි සියලුම දෙනාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් අපි එතුමාට අජරාමර නිවන් සුව අත්වේවායි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ආසනය නියෝජනය කරමින් බස්නාහිර පළාත් සභාවට තේරී පත් වෙලා අපිත් එක්ක බොහොම ළඟින් ඇසුරු කරපු අපේ සරත් සුමනසේකර ගරු මන්ත්‍රීතුමා පිළිබඳවත්, ඒ වාගේම තවත් හිටපු පළාත් සභා මන්ත්‍රීවරයෙකු පිළිබඳවත් ශෝකය පළ කරන අවස්ථාවක අපේ ආදරණීය හිතවත් සරත් සුමනසේකර මැතිතුමා පිළිබඳව අපි වචනයක් කථා කරන්න ඕනෑ. අපි නවක මන්ත්‍රීවරුන් හැටියට එක විටකදී සරත් සුමනසේකර මැතිතුමා අපට පියෙක්. මිතුරෙක්. සහෝදරයෙක්. එහෙම අවස්ථාවල අපි බොහොම ළඟින් ඇසුරු කර ගෙන සිටින කාල වකවානුව තුළදී සදහටම අප අතරින් වෙන් වෙලා යන්න ඔහුට සිදු වුණා.

මම හිතන්නේ, මීට පෙර කථා කරපු හැම දෙනාම ගරු අමාත්‍යවරු, ඒ වාගේම මන්ත්‍රීවරු එතුමා පිළිබඳව වඩා දන්නා අය. අපි කෙටි කලක් තුළදී බොහොම ළඟින් ඇසුරු කරන කොට එතුමාගේ බලාපොරොත්තුව තිබුණේ, හැම තිස්සේම කථා කළේ - සල්ලිකාර ලොකු ලොකු මුදලාලිලා ගැන එහෙම නැත්නම් ව්‍යාපාරිකයෝ ගැන කථා කරන කොට අපි දන්නවා, කොහොමද ඔහු ජීවත් වුණු හැටි කියලා. ඔහු මුදල් තිබුණත්, නොතිබුණත් තම පවුල් සංස්ථාව තුළ ආදරණීය බිරිඳ, ඒ දරුවන් දෙදෙනාගේ අධ්‍යාපනය සාර්ථකව ඉටු කරලා දරුවෝ රැකියා කරන ආකාරය පිළිබඳව අපිත් එක්ක එහා පැත්තේ වාඩි වෙලා බොහොම විනෝදයෙන් කථා කර කර හිටියා. අපට මතකයි, අපි කිහිප විටකදීම එතුමාගේ නිවසට ගිහිල්ලා සම්බන්ධ වෙලා, විනෝද වෙලා අපි ඔහුත් එක්ක කාලය ගත කළා. හැබැයි, මම හිතන්නේ මේ සියල්ලම අත හැරලා දාලා ආදරණීය බිරිඳව, දරුවන්ව, සහෝදර සහෝදරියන්, ඥාතීන්, අපි යාළුවෝ ඔක්කොම අත හැරලා මම හිතන්නේ, අපේ ආදරණීය සරත් සුමනසේකර ගරු මන්ත්‍රීතුමාට යන්න සිද්ධ වුණා. මම හිතන්නේ, අද කොහේ හරි හොඳ තැනක ඉපදිලා, ආදරණීය ඒ පවුල දිහා බලාගෙන අවශ්‍ය කරන ශක්තිය නිර්මාණය කරන්න කොහේ හරි ඉපදිලා ඇතියි කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. එවන් වූ හොඳ මිතුරෙක්, හොඳ සහෝදරයෙක් එක විටකදී පියෙකු වශයෙන් කටයුතු කළ අපේ ආදරණීය සරත් සුමනසේකර මැතිතුමාට ඉපදෙන ඉපදෙන ආත්මයක් තුළ ඒ ආදරණීය බිරිඳට තම ස්වාමියා වශයෙනුත්, ඒ දරුවන්ට තම පියා වශයෙනුත් මම හිතන්නේ කොහේ හරි ඉපදේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම අපේ පළාත් සභාවේ ශෝකයත්, මගේ පෞද්ගලික ශෝකයත් අපේ ආදරණීය සුමනසේකර මැතිතුමාගේ පවුලේ උදවිය වෙත පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම සරත් සුමනසේකර මැතිතුමාගේ හදිසි අභාවය පිළිබඳව ශෝක ප්‍රකාශය ඉදිරිපත් කරන මොහොතේ, අපෙත් යුතුකමක් තිබෙනවා, එතුමාව ඇසුරු කරපු මිත්‍රයන් විධියට, පළාත් සභා මන්ත්‍රීවරු විධියට අපෙත් අදහස් කිහිපයක් ගොනු කරන්න. විශේෂයෙන්ම මට අද වාගේ මතක් වෙනවා. එතුමා මිය යන්න දින කිහිපයකට පෙර එතුමාව මට හමු වෙන්නේ ඕස්ට්‍රේලියානු වීසා කාර්යාලයේදී. එතුමාත්, එතුමාගේ ආදරණීය බිරිඳත් නිතරම තමන්ගේ දියණිය බලන්න ඕස්ට්‍රේලියාවට යනවා. එතුමා කිව්වා, මම ගිහිල්ලා ටික දවසකින් එනවා. මට එහේ සීතලේ ඉන්න බැහැ. වයිෆ් නම් මාසයක් දෙකක් ඉඳලා එයි කියලා. මම හිතන්නේ එතුමා වීසා ගත්තාට එතුමාට යන්න හම්බ වුණේ නැහැ. ඉතාම කෙටි දින කිහිපයකින් එතුමා අපි සියලු දෙනාවම අත හැරලා ගියා. මම හිතන්නේ, එතුමාවත් දැන ගෙන හිටියේ නැහැ එතුමාට ඒ තරම් ඉක්මණින් ජීවිතයෙන් සමු ගන්න වෙයි කියලා. මේක තමයි ජීවතය. මේක තමයි අපේ දෛවය. මේක තමයි ලෝක අනාත්‍යතාවය. බුද්ධ ධර්මයේ අපි කථා කරන සියලු දේ. ඒ නිසා අද සරත් සුමනසේකර කියන ඒ දේශපාලඥයා, ව්‍යාපාරිකයා, අපේ මිත්‍රයා අද එතුමාගේ දරුවන්ට, එතුමාගේ ආදරණීය බිරිඳට වාගේම සමාජයට, දේශපාලන අධිකාරියට, අපි සියලුම දෙනාටම අහිමි වුණු මොහොතක්. ගොඩක් අය කියනවා, මේ දේශපාලනයේදී මනාප තරඟය තුළ. එතුමාට ඒ මනාප තරඟය තුළ කපටිකම තිබුණේ නැහැ. ඒ මනාප තරඟය තුළ

සමහර දේශපාලඥයෝ එතුමාව ග්‍රහණය කර ගත්තා. මම දන්නවා, එතුමාගේ විකට් එකේ ගිහිල්ලා බැට් කළා. ඊට පස්සේ එතුමා අමාරුවේ වැටුණු අවස්ථා තිබුණා. ඒ නිසා මේ මනාප දැක්කාම තමන්ගේ කාලය, දීපය, දේශය, කුලය, මව පහම අමතක වෙනවා. එහෙම සමාජ ක්‍රමයක සරත් සුමනසේකර මැතිතුමා මේ සියලු අටලෝදහම්වලට මුහුණ දීලා, මේ මැතිවරණයට ඉදිරිපත් වුණා. මනාප මැතිවරණ ක්‍රමය තුළ එතුමාට ලැබිය යුතු ස්ථානය පසුගිය මැතිවරණයේදී අහිමි වුණා. ඒ නිසා එතුමා යම් ආකාරයකින් ජීවිතයේ කලකිරීමක් සිතාගෙන සිටියා. තමන් උදව් කරපු අය, තමන් ළඟින් හිටපු අය, තමන්ට ඕනෑ මොහොතේදී අත හැරලා යන ආකාරය ගැන. ඒක එතුමාට විතරක් නොවෙයි. අපි සියලු දෙනාටම උරුම වුණු දෙයක්. නමුත් එතුමාට ඒ සියල්ලට වඩා උඩින් ගිය හොඳ පවුල් ඒකකයක් තිබුණා. ආදරණීය බිරිඳක්, දරුවෝ දෙපළක් හිටියා. ඒ නිසා එතුමාට ජීවිතයේ ඒ දිහා බලලා සතුට වෙන්න පුළුවන්කම ලැබුණා. ඒ වාගේම එතුමා ජීවිතයේ බොහෝ අභියෝග ජය ගත්තා. බොහොම අමාරුවෙන් ජීවිතය ජය ගත්තා. ඒ වාගේම මිය යන කොට එතුමා හොඳ ස්ථාවරයක හිටියා. ඒ නිසා එතුමා තුළ තිබුණු මනුස්සකම, වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම එතුමාට සුහද හදක් තිබුණා. එතුමා ඒ හදවතෙන් හැමෝටම ආදරය කළා. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව එතුමා හැමෝම එක්ක සුහදශීලීව හිටියා. නමුත් මේ ඔක්කොටම උඩින් අපි කවුරුත් නොසිතන විධියට එතුමාගේ ජීවතයේ අවසන් ගමන් යාම ඊට උඩින් තිබුණා. ඒ නිසා අද ඒ සියලුම දේවල් අතහැරලා එතුමා මේ සමාජයෙන් නික්මිලා ගියත්, එතුමා ඉතිරි කර ගිය ඒ මතකය, එතුමා ඉතිරි කර ගිය දේශපාලන මතකය සහ මිත්‍රත්වය සදාකාලිකව අප තුළ මතකයේ රැඳේවි කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා අපි හැමෝටම ආදරය කළ, අපිත් ආදරය කළ ඒ ගෞරවනීය දේශපාඥයා සරත් සුමනසේකර මැතිතුමාගේ පවුලේ සියලු දෙනාටම අපේ සාතිශය සංවේගය ප්‍රකාශ කරමින්, සරත් සුමනසේකර මැතිතුමාට අමා මහ නිවන් සැප ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

### ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපත් සමඟ ජීවත් වුණු සරත් සුමනසේකර හිටපු ගරු මන්ත්‍රීතුමාගේ ශෝක පණිවුඩයේදී මට අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වශයෙන් කෙටියෙන්ම කියනවා නම්, සුන්දර, අවංක, නිහතමානී, නිර්ලෝභී, හිත හොඳ, ජනතා හිතවාදී පුත්‍රයෙක්. මම හිතන්නේ, මෙහෙම කෙනෙක් දේශපාලනයේ සොයන්න අමාරුයි. මම හිතන්නේ, මමත් එහෙම නැතිව ඇති. ඒ මම මේ කියපු වචන ටික මේ කවුරුත් දන්නවා, සරත් සුමනසේකර මැතිතුමා ළඟ තිබෙනවා. හිත හොඳ, නිහතමානී, නිර්ලෝභී, අවංක. ඒ වචන හැමෝටම කියන්න බැහැ. ඒ වචන අපට කටක් ඇරලා කියන්න පුළුවන් සුන්දර මිනිහෙක් තමයි සරත් අයියා. අපි ගොඩක් ආශ්‍රය කළේ නැහැ. වසර ගණනක් අපි එකට හිටියා. මම දැක්ක දෙයක් තමයි. කවුරුත් මුදලට පෙරේතයි. නමුත් සරත් අයියා, සරත් සුමනසේකර ගරු මන්ත්‍රීතුමාට කවදාවත් ඒ පෙරේත කියන වචනය තිබුණේ නැහැ. ඕනෑම තැනක බිලක් ගෙවන්න ඉස්සර වුණේ සරත් අයියා. ඒ වාගේ සුන්දර මිනිස්සු අපි අතරින් නැති වීම මේ පළාත් සභාවට ලොකු පාඩුවක්. එතුමාගේ බිරිඳටත්, දුවා දරුවන්ටත් අපගේ පුද්ගලික ශෝකයත්, පළාත් සභාවේ ශෝකයත් ප්‍රකාශ කරමින් ඒ සුන්දර සරත් අයියාට එතුමා අදහපු ආගම අනුව, මමත් අදහන ආගම අනුව සසර අවසානයේ නිවන් සුව අත් වේවායි මම ප්‍රාර්ථනා කරනවා.

### ගරු සලෝචන ගමගේ
Hon. Salochana Gamage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ හිතවත් සරත් සුමනසේකර ගරු මන්ත්‍රීතුමාගේ අභාවය වෙනුවෙන් ශෝක ප්‍රකාශ යෝජනාව අවස්ථාවේදී ශෝකය පළ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අපත් සමඟ පළාත් සභාවට එකම දවසක පත් වුණු, මාත් සමඟ තරඟ කරන කොට එතුමාගේත් මගෙත් නොම්මර දෙක ළඟින් තිබුණේ. ඒ වාගේම පළාත් සභාවේ එතුමාත් මමත් ළඟ ළඟම ආවේ. දහවැනියා සහ එකොළොස්වැනියා වශයෙන්. දීර්ඝ කාලයක් අපිත් එක්ක මිත්‍රයෙක් වශයෙන් ආශ්‍රය කළා. මම හිතන්නේ, එතුමාගේ තිබුණු නිහතමානීකම, අවංකත්වය මේ සියල්ල කැටි කර ගත්, ඉතාමත් කලාතුරකින් බිහි වන චරිතයක්. මම හිතන්නේ, එතුමා මේ ලංකාවේ බිහි වුණු අවංක දේශපාලඥයින්ගේ ලැයිස්තුවේ මේ අවංකයන් අතරේ ප්‍රමුඛස්ථානයේ වැජඹෙන චරිතයක් බවට එතුමා පත් වුණා. සත පහක්වත් හොරකම් කළේ නැති මන්ත්‍රීවරයෙක්

වශයෙන් හඳුන්වන්න පුළුවන්. ඒ සත පහක් හොරකම් කළේ නැති අතළොස්සක් මන්ත්‍රීවරු ගොඩේ එතුමා ඉහළින්ම ඉන්නවා. ඒ නිසා එතුමා අපට ආඩම්බරයක්. අපිත් එක්ක නිතරම, ඉතාමත් කුළුපගව ආශ්‍රය කරපු, අපත් සමඟ විදේශ ගමන් ගිය, අනෙක් වැඩ මුළුවට සහභාගී වුණු, එකම උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් හිටපු ඉතාමත් නැණ නුවනින් හෙබි මන්ත්‍රීවරයෙක්. එතුමාට භාෂා කිහිපයක් කථා කරන්න හැකියාව තිබුණා. ඒවා ප්‍රයෝජනයට අරගෙන රටට සේවයක් කරපු, ඒ වාගේම මේ ලංකාවේ ඒ ලැබෙන මුදලින් පමණක් නොවෙයි. විදේශ රටවල සම්බන්ධතා හරහා එතුමා විශාල මුදල් ප්‍රමාණයක් අරගෙන කඩුවෙලත්, කොළඹ දිස්ත්‍රික්කයේත් ජනතාව වෙනුවෙන් දිස්ත්‍රික්කයේ දූදරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් විශාල මුදලක් වෙන් කරලා, ඒ අධ්‍යාපන කටයුතු සඳහා විශාල මුදල් සම්භාරයක් ලබාදීලා එතුමා ඒ දරුවන්ගේ ඥානස පාදන්න උත්සාහ කළා. අඛණ්ඩව එතුමා මන්ත්‍රීවරයෙකු වෙන්න කලින් සිටම විශාල මුදල් ප්‍රමාණයක් තමන්ගේ හිතවතුන් හරහා ලබා ගෙන මේ රටට සේවය කළා. එතුමා විදේශගත වුණාමත් එතුමාට මිත්‍රයන් රාශියක් හිටියා. ලංකාවේ පමණක් නොවෙයි. විදේශගත වුණත් එතුමාගේ මිත්‍රයෝ එතුමාව සොයා ගෙන ආවා. එතුමාට විදේශ රටවල් එක්ක ලොකු සම්බන්ධතාවයක් තිබුණා. හැම රටකම ගියාම එතුමාව ආදරයෙන් පිළිගන්න මිත්‍රයෝ හිටියා. ලංකාවේ වාගේම. මේ ලෝකය පුරා එතුමා ආශ්‍රය කරපු සුහද කොටසක් හිටියා. ඒ අයගේ ප්‍රයෝජන ලංකාවට ලබා දුන්නා. එතුමාගේ භාෂාව ප්‍රයෝජනවත් වුණා. එතුමා විශේෂයෙන්ම තමන්ගේ රට වාගේම පවුල ගැනත් හිතලා, තමන්ගේ දරුවන්ට අධ්‍යාපනය ලබා දීලා, එක දරුවෙකු ගුවන් නියමුවෙක් බවට පත් කළා.

ඒ නිසා ළමුන්ගේ අධ්‍යාපනය සඳහා විශේෂ කැප වීමක් එතුමා කළා. ඒ වාගේම හැම සමාජ සේවයටම එතුමා මුදල් වියදම් කළා. මේ පළාත් සභාවේ පමණක් නොවෙයි තමන්ගේ සාක්කුවෙන් ඒ මුදල් වියදම් කරලා එතුමා සතුටට පත් වුණා. එතුමාගේ සතුට තිබුණේ අන් අයගේ සතුටයි. තමන්ගේ සතුට නොවෙයි. කවුරුහරි ඇවිල්ලා එතුමා හමු වෙලා සතුටු වෙලා යනවා නම්, ඒ අයට සතුටක් ලබා දෙන්න පුළුවන් නම්, ඒක තමයි එතුමාගේ සතුට. ඒ නිසා මෙවැනි දේශපාලඥයෝ බිහි වෙන්නේ ඉතාමත් කලාතුරකින්. එතුමා අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමා පරාජය වුණාට පස්සේ ඒකාබද්ධ විපක්ෂය ගොඩනගන්න ඉතාමත් දැවැන්ත මෙහෙවරක් කළා. එතුමා තමයි නායකත්වය දුන්නේ. එතුමාගේ නිවසට ගෙන්වලා මහින්ද රාජපක්ෂ මැතිතුමාවත්, ඒකාබද්ධ විපක්ෂය නිර්මාණය කිරීම සඳහා සියලු මන්ත්‍රීවරු ගෙනැල්ලා එතුමා තමයි බත බුලතින් සංග්‍රහ කරලා, ඒ සියලු වියපැහැදම් දරලා, මේ ඒකාබද්ධ විපක්ෂය ගොඩ නැඟීමට මේ රට වෙනුවෙන් කවුරු හරි ඉන්න ඕනෑය කියන ස්ථාවරයේ, ඒකීය ලංකාව රැක ගන්න ඕනෑය කියන ස්ථාවරයේ ඉඳිමින් රට ගොඩ ගැනීම සඳහා මහින්ද රාජපක්ෂ මැතිතුමාත් සමඟ අත්වැල් බැඳගෙන, ඒ නායකත්වය සපයලා අද ඒකාබද්ධ විපක්ෂය මේ තත්ත්වයට ගෙන ඒමේ පුරෝගාමියෙකු හැටියට සරත් සුමනසේකර මැතිතුමා කටයුතු කළා. ඒ සඳහා නායකත්වය දුන්නා. ඒ සඳහා මුදල් වියදම් කළා. පළමු වන රැස්වීම නුගේගොඩ තියන වෙලාවේ විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරලා තමයි මේ රැස්වීම්වල සියලු යටිතල පහසුකම් සපයන්න එතුමා කටයුතු කළේ. තමන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා නොවෙයි. මේ රට ගැන හිතලා, මේ ජාතිය ගොඩ ගැනීම සඳහා එතුමාට කරන්න පුළුවන් සියලු යුතුකම් කළා.

ඒ වාගේම මම මතක් කරන්න ඕනෑ. එතුමාගේ විශාල වත්කම් තිබුණා. මම එතුමාගේ වත්තට ගියා. ගියාම සිංහල, දෙමළ භේදයෙන් තොරව මිනිස්සු දුවගෙන එනවා. විශේෂයෙන්ම දෙමළ ජනතාව දුවගෙන ආවා. අපි ගියාම ඒ අය හිතුවේ සරත් සුමනසේකර මහත්තයා ආවා කියලා. එතුමා ගියාම ඒ සියලු දෙනාටම හොඳට සලකලා, අතේ තිබෙන සල්ලි සියල්ල බෙදලා, කන්න බොන්න දීලා තමයි එතුමා ඇවිල්ලා තිබුණේ. ඒ නිසා අපි ගියාමත් ඒ ද්‍රවිඩ ජනතාව හිතුවේ එතුමා ඇවිල්ලා කියලා. අනේ ආඩවනේ කියලා එතුමා නැති වුණාම, ඒ මිනිස්සු ශෝක වුණා. ඒ මිනිස්සු ඇත්තටම දුක් වුණා. ඒ තමන්ගේ වත්තේ හිටපු සේවකයන්ටත් ඒ තරම් සලකලා තිබුණා. තමන්ගේ පොළොවට වාගේම, තමන්ගේ ඡන්ද දායකයන්ට වාගේම තමන්ගේ සේවකයන්ටත් හොඳට සලකලා, ඉතාමත් හොඳ ජීවිතයක් ගත කරලා, ඉතාමත් කෙටි කාලයකින් වුණත්, මේ ජීවිතය අංග සම්පූර්ණ ජීවිතයක්. සමාජයට කරන්න පුළුවන් මෙහෙවර කරලා, තමන්ගේ පවුලට කරන්න ඕනෑ මෙහෙරව කරලා, ශාසනික වශයෙන් කරන්න ඕනෑ මෙහෙවර කරලා ඒ තමන්ගේ දේවල් තමන්ගේ ධනය

පරිත්‍යාග කරලා ඒ කටයුතු කරලා ඉතාමත් අවාසනාවන්ත ලෙස අපෙන් වෙන් වුණත්, එතුමා කරපු පිංකම් රාශියක් තිබෙනවා. මේ සියලු පින් එක්කහු වෙලා එතුමාට අමා මහා නිවන් සුව අත්වේවායි ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම එතුමාගේ පුත්‍ර රත්නයට මේ දේශපාලනයට ඇවිල්ලා තාත්තා ගිය මග යන්න කියන ආරාධනය කරමින් මහජන එක්සත් පෙරමුණේ ශෝකයත්, ඒ වාගේම මගේ පෞද්ගලික ශෝකයත් පළ කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අභාවප්‍රාප්ත සරත් සුමනසේකර ගෞරවනීය මන්ත්‍රීතුමා පිළිබඳව, ඔහු වෙනුවෙන් ශෝකය පළ කරන මොහොතේ වචනයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. මා පළමුව මේ ගරු සභාවේ නියෝජනය කරමින් ඔහු වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කළ ගරු මන්ත්‍රීවරු සියලු දෙනාම ඒ කී වචනවලට මම සාක්ෂියක් දරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තරුණ වියේ, දහකාර වියේ මනුෂ්‍යයින්ට මරණය කියන එකක් පිළිබඳව දැනෙන්නේ නැහැ. එසේ නොදැනෙන මිනිස්සුන් අතර කවදා හෝ දවසක මරණයට මුහුණ දිය යුතුයි කියලා සිතූ මිනිස්සුන්ගේ අභාවප්‍රාප්ත වීම් පිළිබඳව තමයි අපි අද කථා කරන්නේ. ඔහුගේ චර්යාවන්, ගති පැවතුම්, ඔහු සිතූ පැතූ ආකාරය, ඔහු ක්‍රියා කරපු ආකාරය පිළිබඳව හිතන කොට සරත් සුමනසේකර කියන දයාබර මිත්‍රයා මරණය පිළිබඳව හොඳින් දැන ගෙන සිටියා කියලා මම විශ්වාස කරනවා. බෞද්ධයෙකු හැටියට කෙනෙකුගේ චර්යා ධර්ම පද්ධතිය මෙහෙයවන්නේ ඔහු බොහෝ විට උපයන මුදල, තමන් සතුව කවදාවත් අහිමි වන දෙයක් හැටියට නොසලකා ජීවත් වීම බොහෝ විට මරණය පිළිබඳව නොදන්නා මිනිස්සුන්ගේ ගති ලක්ෂණයක්. තවත් මිනිහෙකුට ක්‍රෝධ කරන, වෛර කරන, ඔහුගේ විනාශය ප්‍රාර්ථනා කරන, මම පමණක් මේ සමාජයේ ජීවත් වීම ප්‍රමාණවත් කියලා හිතන මිනිස්සුන් අතර සරත් සුමනසේකර කියන අපේ මිත්‍රයා දේවත්වයට පත් වුණු මනුෂ්‍යයෙක්. ඒ නිසා අද දවසේ ඔහුගේ වෙන්ව යාම පිළිබඳව මේ ගරු සභාවේ කොතැනක කවුරුන් කථා කළත්, ඔහු පිළිබඳව හදවතේ උපන් වේදනාවකින් ශෝකයකින් මිස වෙනත් කිසිම වෛරයකින් කථා කරන්න කිසිදු අවස්ථාවක් සලසා නොදුන් ශ්‍රේෂ්ට මනුෂ්‍යයෙක් තමයි සරත් සුමනසේකර කියලා අපි හඳුන්වන්නේ. ඔහුගේ දයාබර බිරිඳ සුදර්ශනී සොයුරිය, දයාබර දියණිය සහ පුතණුවන් මේ සියලු දෙනාම අවංකවම ඔහුගේ ජීවිතය පිළිබඳව මහා දැවැන්ත අත්දැකීම් තිබෙන අය. ඔහු ජීවත් වුණේ මොන විධියට ද, ඔහු අපට සැලකුවේ මොන ආකාරයට ද, ඔහු ප්‍රාර්ථනා කරන ලෝකය කුමක්ද කියන එක පිළිබඳව ඒ හැම දෙනාම සාක්ෂි දරන අයයි.

පසුගිය දවස්වල ඔහුගේ හිතේ වේදනාවක් තිබුණා. ඒ තමන්ගේ රට ගැන. රට කොයි දිසාවට ද ගමන් කරන්නේ? එය නිවැරදි කිරීම සඳහා මට කළ හැකි කාර්යභාරය කුමක්ද? මා ඒ වෙනුවෙන් කළ යුත්තේ කුමක්ද? කියන එක පිළිබඳව ඔහු නිතරම විමසුවා. මට සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා ඔහුගේ වත්තට ගියා කියලා කිව්වාම, මතක් වුණේ දවසක් මම අර එහා පැත්තේ වාඩි වෙලා කල්පනා කරමින් ඉන්න කොට මගේ ළඟට ඇවිල්ලා ඇයි හිතේ කනස්සල්ලෙන් වාගේ කියලා විමසලා, මම මගේ පෞද්ගලික ජීවිතයේ පොඩි ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම මට කිව්වා, අපේ වත්තට යමු ලබන සුමානේ, ටිකක් නිවී හැනහිල්ලේ දවසක් දෙකක් ඉඳලා එන්න. එතකොට හිතේ තිබෙන ඔය වේදනාව අඩු වෙයි කියලා. එහෙම තවත් කෙනෙකුගේ වේදනාව දකින්න පුළුවන්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මනුෂ්‍යයෙකුගේ වේදනාව මනින්න ඒකක නැහැ. කිසිදු මනුෂ්‍යයෙකුට ඇති වන වේදනාවක් තවත් කෙනෙකුට ඒකක මට්ටමින් දකින්න බැහැ. නමුත් සමහර බොහොම සංවේදී මිනිස්සුන්ට තවත් කෙනෙකුගේ වේදනාව මැන ගන්න ප්‍රමාණවත් මානුෂිකත්වයක් තිබෙනවා. එහෙම ඒක පිහිටන්නේ මනුෂ්‍යයෙකුට බොහොම කලාතුරකින්. තවත් කෙනෙකුගේ වේදනාවෙන් යම් කොටහක්, මෙන්න මේ ආකාරයෙන් මට මේ ප්‍රශ්නය මතු වුණා නම් මේ වේදනාව මට මෙපමණ ප්‍රමාණයක් වෙයි කියලා ගණනය කර ගන්න පුළුවන් මනුෂ්‍යයෙක් තමයි සරත් සුමනසේකර කියන්නේ. ඒ නිසා ඔහු සැබවින්ම මනුෂ්‍යත්වයට මහා උත්තරීතර සංකල්පයක් තුළ වූ, මනුෂ්‍යත්වයට බොහෙම ළඟ සාක්ෂි දරන මනුස්ස ජීවිතයක්. හැමෝටම එහෙම සරත් සුමනසේකරලා වෙන්න බැහැ. හැමෝටම සරත් සුමනසේකරලා වෙන්න උත්සාහ කළත් බැහැ. ජන්මයෙන් පිහිටලත් නැහැ. ජානවල පිහිටලත් නැති මිනිස්සු තමයි වැඩිපුරම ඉන්නේ. ඒ නිසා

සරත් සුමනසේකර කියලා කියන්නේ, අපේ කාලයේ අපට මුණ ගැසුනු ඉතාමත් දේවත්වයට සමීප ගති පැවතුම් තිබුණු මනුස්සයෙක්. ඔහුගේ වියෝව අපට බොහොම දැන් කථා කළත් මේ මනසට මැවිලා පේනවා ඔහුගේ සිනහබර මුහුණ. කථා කරපු ආදරණීය වචන. ඒ ළෙංගතුකම. හදවතේ පැත්තක් කිළිටි වෙලා, පැත්තක් පවිත්‍රව තිබෙනවා. කිළිටි පැත්ත වහගෙන පවිත්‍රත්වය හදවත පුරා තිබෙන විධියට මවාගෙන කථා කරපු වචන එකක්වත් තිබුණේ නැහැ. ඒ නිසා දයාබර මිතුර, ඔබ අප අතර ජීවත් වුණු කාලයේ අතිශයින්ම අපේ හදවත් තුළ අමරණීයව පවතිනවා. ඔබ අද අප අතරින් වියෝ වුණා. ප්‍රාර්ථනා කරන්නේ නැහැ නිවන් දොරටුව විවර වෙන්නය කියලා. නැවතත් අපි මේ භව ගමනේ බොහොම ඈත ගමනක් යන්න තිබෙන පුද්ගලයෝ. තවත් භවයකදී මුණ ගැසේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. අවසානයේ බුදුන්ගේ සනාථන ධර්මතාවය අනුව ඔබට නිවන් සුව ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. ආදරණීය බිරිඳ සුදර්ශනී සොයුරිය සහ ආදරණීය දියණියටත්, පුතාටත් අපගේ හෘදයාංගම ශෝකය පළ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දිනයේ සුවිශේෂී පුද්ගලයෙකු හැටියට අපි දැක්ක සරත් සුමනසේකර මැතිතුමා මේ ප්‍රදේශයට, මේ සභාවට විතරක් නොවෙයි මේ රටටම සුවිශේෂී පුද්ගලයෙක් බව ඔප්පු වුණා. මේ එහා පැත්තේ පුටුවේ එතුමා දෙවැනි වතාවට පත් වෙලා ඇවිල්ලා මේ පුටුවේ හිටියේ. අපට ඉතාමත් සමීප යහළුවෙක්, සහෝදරයෙක් හැටියට කටයුතු කරපු සරත් සුමනසේකර මැතිතුමා ගැන අපට කථා කරන්න මෙපමණ ඉක්මණට ලැබෙයි කියලා අපි විශ්වාස කළේ නැහැ. මොනම විධියකටවත් අපි හැර යාමේ ගමන ඔහුගේ මේ තරම් ඉක්මන් වෙයි කියලා අපට කොතැනකවත් ඒකට ඉඩක් තියලා තිබුණේ නැහැ. අපට ඒක දැන ගන්න තිබුණේ නැහැ. නමුත් එතුමා ජීවත් වුණු කාලය තුළ මේ සමාජයේ, අපේ ආගමේ හැටියට පුදුමාකාර පිංකම්, එහෙම නැත්නම් කැපවීම්, මනුෂ්‍යයන්ට සැලකීම් ආදිය තුළ ඔහු උපරිම සේවය කළා කියලයි අපි දකින්නේ. විශේෂයෙන්ම අපට මතකයි. අවසාන කාලයේ එතුමා ලංකා රෝහලේ ප්‍රතිකාර ලබන කොට එතුමා මිය යන්න දින කිහිපයකට ඉස්සෙල්ලා අපි එතුමාව බලන්න ගියාම, එතුමා සමහර විට දැන ගෙන ඉන්න ඇති. නමුත් එතුමා කිව්වා, දැන් මට හොඳයි. කිසි ප්‍රශ්නයක් නැහැ කියලා. එතුමාට ඇත්ත වශයෙන්ම ලංකාවේ විතරක් නොවෙයි, එතුමාගේ සාර්ථක ව්‍යාපාර දිවිය තුළ එතුමාට මේ රටෙන් බැහැරව වුණත් ගිහිල්ලා ඒ ප්‍රතිකාර ලබන්න කිසිම මිල මුදල් බාධාවක් එතුමාට තිබුණේ නැහැ. අපි දන්නවා. එතුමා ඒක දැන ගෙන වෙන්න ඇති සමහර විට ඒ මිය යාමත් එක්ක අපට පෙන්වන්නේ නැති වුණත්, එතුමා කිසිම බිය ගතියක් නැතිව, ඒ දෛවයට මුහුණ දෙන බව ඇත්තටම අපට පෙන්නුවාදෝ කියලා අපට හිතෙනවා. ඒ වෙලාවේ අපත් සමග කථා කරපු ආකාරයත් එක්ක. කෙසේ වෙතත් එතුමා කරපු සේවය අපේ මේ කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු වාගේම බොහෝ අය කථා කළා. කාලයත් එක්ක අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා වාගේම එතුමා ගැන කථා කරන්න ඇත්තටම අපට මේ සභාව තුළ ශෝක යෝජනා ගෙනෙන විශාල ප්‍රමාණයක් කථා කළේ සභාවෙන් ගිහිල්ලා අවුරුදු ගණන් වෙනම සිටිද්දී. නමුත් එතුමා අපිත් එක්ක සභාවේ ඉඳලා ගැටිලා, වැඩි වයසක් නැතිව අපට කථා කරන්න ලැබුණු එක ඇත්තටම අපට කනගාටුවක් හැටියට අපි දකිනවා.

විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. අපේ ආණ්ඩු පක්ෂයේ සුභ සාධක සමිතිය තුළ එතුමා අපේ මන්ත්‍රීවරු ටික ගොනු කරලා, භාණ්ඩාගාරික හැටියට ඒක පටන් ගත්තා විතරයි. ඇත්තටම ඒකේ ප්‍රතිලාභයවත් එතුමාගේ මරණයට අපට දෙන්න පුළුවන් වුණේ නැහැ. එතුමා මේ සේරම එකතු කරලා හොඳ ගමනක් යන්න සභාව තුළ වාගේම මේ රටේ යම්කිසි විශේෂයෙන්ම අපි මතක් කළා වාගේ අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ එක්වෙලා, මේ එකඟතාවයත් එක්ක මේ රට ඉදිරියට ගෙනියන වැඩ පිළිවෙළ තුළ වාගේම නොයෙක් කාර්යයන්වලදී අපට ලොකු සේවාවක්, ශක්තියක් දුන්නා. මිල මුදලෙන් විතරක් නොවෙයි. ඒ වාගේම එතුමා සාර්ථක දේශපාලඥයෙක් වුණා වාගේම සාර්ථක පියෙකු වුණා. ඒ වාගේම සාර්ථක ස්වාමි පුරුෂයෙක් වුණා. අපි දැක්කා, ඒ දරුවන්ට මේ සමාජයේ ඉන්න ඕනෑ තැන්, ඒ කරන්න ඕනෑ වෘත්තීන් හෝ වේවා, ඒ ඉගෙනුම් කටයුතු වේවා, ඒවා සාර්ථකව කරලා දීලා, ඒ අයට ඒ යන මග පහදලා දුන්නා, එතුමා ජීවත් වුණු මේ කෙටි කාලය තුළ. ඒ වාගේම සාර්ථක ව්‍යාපාරිකයකු හැටියට ඒ ව්‍යාපාරය ගොඩ නගලා,

දැවැන්ත ව්‍යාපාරයක් බවට පත් කරලා ඒක සාර්ථකව කර ගන්න ඒ ඉන්න අයට ශක්තිය දෙන්න පුළුවන් වට පිටාවක් එතුමා ගොඩ නගලා තිබුණා. ඒ නිසා මම අවසාන වශයෙන් ඉල්ලා සිටින්නේ, අපේ ශෝකය ඒ භාර්යාවට, ඒ දූවා දරුවන්ට මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා වාගේම ජීවිතයේ සංසාරයේදී මේ වාගේ අඩු වයසින් අකල් මරණයකට ගොදුරු නොවේවා. ඒ වාගේම නැවතත් මේ ජීවිතයේ නිර්වාණය කරා යන මොහොත තුළ නැවතත් අප අතරම ඉපදිලා මේ ජනතා මෙහෙවර, මේ ශක්තිය ලබා දෙන්න ඔහුට හැකි වී අවසානයේ ඔහු පතන බෝධියකින් නිර්වාණ සුවය අත් වේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තූතියි.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සරත් කුමාර සුමනසේකර මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කරන අවස්ථාවේ ඇත්තෙන්ම මුලින්ම ශෝක කථාව ඉල්ලා සිටියත්, අද පළාත් සභාවේ මන්ත්‍රීවරු විශාල උනන්දුවකින් සරත් කුමාර සුමනසේකර මැතිතුමාගේ ඒ ශෝක යෝජනාව වෙනුවෙන් ක්‍රියාකාරීව දායක වීම තුළින්ම අපට පැහැදිලි වෙනවා, සරත් සුමනසේකර මැතිතුමා පළාත් සභාව තුළ කුමන ආකාරයකින් කටයුතු කළාද කියන එක. එය අපට අද මේ ශෝක යෝජනාව ගේන කොට පැහැදිලි වෙනවා. ඇත්තෙන්ම කඩුවෙල ආසනයේ මාත් සමඟ දීර්ඝ කාලයක් දේශපාලනය කරපු නායකයෙක් හැටියට සරත් කුමාර සුමනසේකර මැතිතුමා ළඟින්ම ආශ්‍රය කළ පුද්ගලයෙකු හැටියට මා එතුමා වෙනුවෙන් මේ අවස්ථාවේ ශෝක යෝජනාවේදී කථාවක් පැවැත්වීමට ලැබීම පිළිබඳව මම ඇත්තෙන්ම ගෞරව කරනවා. සරත් සුමනසේකර මේ ලෝකයට උපත ලබන්නේ 1957 ජූනි මාසේ 25 වැනිදා. පවුලේ සාමාජිකයින් හතර දෙනෙකුගෙන් යුත් පවුලේ තුන්වන සාමාජිකයා හැටියට උපත ලබන සරත් සුමනසේකර මූලික අධ්‍යාපනය ලබන්නේ ශාන්ත ජෝන් විද්‍යාලයෙන්. අ.පො.ස. (උ.පෙළ) දක්වා අධ්‍යාපනය ලැබීමෙන් අනතුරුව 1978 ජනවාරි මාසේ 18 වැනිදා ඒ ආදරණීය බිරිඳ සුදර්ශනී සුමනසේකර මැතිනිය සමඟ විවාහ දිවියට පත් වීමෙන් අනතුරුව ඔහුට දාව දූවෙක් සහ පුතෙක් ෂෙහාන් සුමනසේකර පුතාත්, ඒ වාගේම ශෂිනි සුමනසේකර දියණියත් ඔහුට දාව මේ ලෝකයට ඉපදෙනවා. ඉන් අනතුරුව මොහු ව්‍යාපාරික ක්ෂේත්‍රයේ



ව්‍යාපාරිකයෙකු හැටියට අක්ෂි ක්ෂේත්‍රය තුළ තමන්ගේ මූලිකම ව්‍යාපාරික කටයුතු ආරම්භ කරනවා. ඉන් අනතුරුව මොහු වෙළඳ නාවික ක්ෂේත්‍රය තුළ තමන්ගේ ව්‍යාපාර කටයුතු ප්‍රචලිත කරමින් තමයි මූලිකවම සමාජ මෙහෙවරට දායක වෙන්නේ. ඇත්තෙන්ම සරත් සුමනසේකර සහෘදයා මේ දේශපාලනයට ගෙන එන්න මූලිකවම උත්සාහ දැරුවේ ඔහුගේ පුද්ගලික අවශ්‍යතාවයක් මත නොවෙයි. අද දේශපාලනයට බිහි වන බොහෝ දේශපාලඥයින් තමන්ගේ අවශ්‍යතා මත දේශපාලනයට පිවිසුනත් සරත් සුමනසේකර මහතා දේශපාලනයට ගෙන එන්නේ, ඒ ප්‍රදේශයේ ජනතාවයි. එතුමා දේශපාලනයට එන්න ඉස්සෙල්ලා තමන්ගේ පෞද්ගලික ධන පරිත්‍යාගයන් තුළින් ඒ ප්‍රදේශයේ ජනතාවට මහඟු මෙහෙවරක් ඉෂ්ට කළා. මට මතකයි, දේශපාලනයට මොහු ඉස්සෙල්ලාම ප්‍රවිෂ්ට වෙන්නේ 2006 වර්ෂයේ කඩුවෙල ප්‍රාදේශීය සභාවට තරඟ කරලා. ඒ අවස්ථාවේ ඔහු කඩුවෙල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකු වශයෙන් පත් වෙන්නේ තුන්වන ස්ථානයට පත් වීමෙන්.

ඇත්තෙන්ම එතුමා මුලින්ම දේශපාලනයට පිවිසෙන කොටත් එතුමාට විශාල ජන ප්‍රසාදයක් කඩුවෙල ආසනය තුළ තිබුණා. ඒ වාගේම මොහු දේශපාලනයට පත් වීමෙන් අනතුරුව ඔහු සරත් සුමනසේකර පදනම පිහිටුවලා එදා ඉඳන්ම අපට මතකයි සරත් සුමනසේකර සහෘදයා තමන්ගේ පෞද්ගලික ධන පරිත්‍යාගයන් තුළින් තමයි දේශපාලන කටයුතු වැඩියෙන්ම කළේ. මම හිතන්නේ, මේ මන්ත්‍රී ප්‍රතිපාදන එනකල් කවදාවත් බලාගෙන හිටපු පළාත් සභා මන්ත්‍රීවරයෙක් නොවෙයි සරත් කුමාර සුමනසේකර කියන්නේ, එතුමා හැමදාම පාසල් දූවා දරුවන් වෙනුවෙන්, තමන්ගේ දූවා දරුවන්ට අධ්‍යාපනය වෙනුවෙන් මුදල් වැය කරනවා වාගේම තමන්ගේ පුද්ගලික ධනය විශාල ලෙස වියදම් කරලා කඩුවෙල ආසනයේ පමණක් නොවෙයි. කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටතත් තමන්ට යම්කිසි උදව්වක් අහිංසක දුප්පත් දූවා දරුවන් වෙනුවෙන් කරන්න පුළුවන්කම තිබුණා නම් එදා ඉදිරිපත් වෙලා සරත් සුමනසේකර ඒ හැකි සෑම කාර්යභාරයක්ම ඉෂ්ට කරපු දේශපාලඥයෙක්.

ඇත්තෙන්ම මම එතුමාව දකින්නේ දේශපාලඥයෙක් විධියට වඩා මනුස්සයෙක් හැටියට. සරත් සුමනසේකර යම්කිසි උදව්වක් උපකාරයක් කළා නම් ඡන්දයක්

[ගරු ප්‍රදීප් උඳුගොඩ]

බලාපොරොත්තුවෙන් කරපු නායකයෙක්, දේශපාලඥයෙක් නොවෙයි. ඔහු හැමදාම දැක්කේ මනුස්සකම. මනුස්සයෝ වෙනුවෙන් ඒ කළ යුතු කාර්යභාරය සරත් සුමනසේකර 100% ක්ම මනුස්සයෙකු හැටියට අනික් මිනිස්සුන්ට උදව් කරන්න උදව් උපකාර කරපු පුද්ගලයෙකු හැටියට තමයි අපි දකින්නේ. ඇත්තෙන්ම සරත් සුමනසේකර පදනම මගින් පරිගණක පාඨමාලා, ඒ වාගේම පාසල් උපකරණ ලබා දීම, ඒ වාගේම නිවාස ආධාර, ස්වයං රැකියා පාඨමාලා, ඒ ස්වයං රැකියා පාඨමාලා කිරීමෙන් අනතුරුව ඔවුන්ට ස්වයං රැකියාවක් හැටියට තමන්ගේ ජීවනෝපාය ගෙනියන්නට පුළුවන් ආකාරයේ උපකරණ මේ ආදී සැම දෙයක්ම මේ සරත් සුමනසේකර ඔහු ජීවත්ව ඉන්න කාලය තුළ ලබා දුන්නා. ඇත්තෙන්ම මොහු දේශපාලනයේ ගත කරපු කාලය වාගේම මොහු ක්‍රිකට් ක්‍රීඩාවට ඉතාමත් ඇල්මක් දක්වපු දේශපාලඥයෙක්. මොහු තමන්ගේ ජීවිත කාලය තුළ ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් ලංකන් ක්‍රිකට් සමාජයේ සභාපති ධූරයත්, ඒ වාගේම ලංකා ලයන්ස් ක්‍රීඩා සමාජයේ සභාපති ධූරයත් මොහු දරමින් ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් විශාල කාර්යභාරයක් සරත් සුමනසේකර සහෘදයා මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් ඉෂ්ට කළා.

ඒ වාගේම තමයි අපට මතකයි. 2009 වර්ෂයේ පළාත් සභා මැතිවරණය සඳහා ඉදිරිපත් වන කොට කඩුවෙල ආසනයෙන් පළාත් සභා මන්ත්‍රීවරු හතර දෙනෙකුට අවස්ථාව ලැබුණා, මේ පළාත් සභාවට ප්‍රවිෂ්ට වෙන්න. ඒ අවස්ථාවේ සරත් සුමනසේකරත්, මමත් අපි එකම වේදිකාවේ එකට දේශපාලනය කරපු මිතුරන් දෙදෙනෙක්. එතුමාත් මමත් 2009 වර්ෂයේ ප්‍රථම වරට මේ පළාත් සභාවට එන කොට අපි දෙදෙනාම කඩුවෙල ආසනයේ එකම දේශපාලන වේදිකාවක හිටපු සහෘදයෙකු හැටියට තමයි මම සරත් සුමනසේකර මැතිතුමාව දකින්නේ. නමුත් එතුමා එදා අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් තමන්ගේ අනන්‍යතාවය රැක ගෙන පක්ෂ මාරු කරන යුගයක එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උන්නතිය, අනාගතය වෙනුවෙන් විශාල කාර්යභාරයක් තමන්ගේ මිල මුදල්, ධනය, ශ්‍රමය හැම දේම කැප කරලා පක්ෂය ගොඩ නගන්නට කැප වුණු නායකයෙක් හැටියට තමයි මම සරත් සුමනසේකර දකින්නේ. එතුමා හැමදාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උන්නතිය වෙනුවෙන්, අභිවෘද්ධිය වෙනුවෙන් ඉතාමත් කැප කිරීම් කළා. මට මතකයි. අපේ සහෝදර පළාත් සභා මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළ විධියට එදා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා 2015 දී පරාජයට පත් වීමෙන් අනතුරුව වුණත්, එතුමා එදා සිට වැඩ කරපු නායකයා හැටියට, එතුමා පරාජය වුණු අවස්ථාවේ තමන්ගේ නිවසට මහින්ද රාජපක්ෂ මැතිතුමාව ගෙන්වලා, අනෙකුත් නායකයින් ගෙන්වලා, නැවත වතාවක් ඔහුගේ ජයග්‍රහණය වෙනුවෙන් ඒ කළ යුතු කාර්යභාරය මැනවින් ඉෂ්ට කරපු නායකයෙක් හැටියට තමයි මම සරත් කුමාර සුමනසේකර මැතිතුමාව දකින්නේ.

ඇත්තෙන්ම අපේ ලිලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ පරිදි මේ ඉතාමත් නුදුරු කාල සීමාවේ අපේ ආණ්ඩු පක්ෂයේ සුභ සාධන සමිතියක් පිහිටෙව්වා. එතුමා තමයි මේ ආණ්ඩු පක්ෂයේ සුභ සාධක සමිතියේ භාණ්ඩාගාරික ධූරයට පත් වුණේ. මම හිතන්නේ, ඇත්තටම ඒ චෙක්පතත් තවම එතුමාගේ නිවසේ තමයි ඇත්තේ. එතුමාට පුළුවන්කමක් ලැබුණේ නැහැ තමන්ගේ ප්‍රතිලාභයවත් ලබාගන්න පුළුවන් කාල සීමාවක් නොසිට එතුමා හදිසියේ අප අතරින් වෙන් වුණා. ඇත්තෙන්ම එතුමා ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් වාගේම විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සමඟත් ඉතාමත් සුහදත්වයෙන්, ඉතාමත් නිදහසේ තමන්ගේ දේශපාලන ගමන ගත කරපු පුද්ගලයෙකු හැටියට තමයි මම සරත් සුමනසේකර දකින්නේ.

ඒ වාගේම අපට මතකයි. අපේ අධ්‍යාපන ව්‍යුහ කමිටු තුළදී දුවා දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් ගත යුතු නිවැරදි තීන්දු තීරණ ගැනීමේදී සරත් සුමනසේකර මැතිතුමා ඒ අධ්‍යාපනය වෙනුවෙන් ඒ කළ යුතු කාර්යභාරය සෑම ව්‍යුහ කමිටුවකටම පැමිණිලා ඒ කළ යුතු කාර්යභාරය සරත් සුමනසේකර මැතිතුමා ඉෂ්ට කළා. ඇත්තෙන්ම ඔහු වෙනුවෙන් කථා කරන්න ගියොත් ළඟින්ම ආශ්‍රය කරපු පළාත් සභා මන්ත්‍රීවරයා විධියට මට මේ සඳහා සෑහෙන වේලාවක් ගත වන නිසා ඇත්තෙන්ම මම මෙය අවස්ථාවක් කර ගන්නවා පවුලේ සියලුම දෙනාට ආදරණීය බිරිඳ, ඒ වාගේම ඔහුගේ පුත්‍රයා අපේ ෂෙහාන් සහෝදරයා, ඒ වාගේම දියණිය නම් මෙතැන අද සහභාගී වෙලා නැහැ. දියණිය විදේශගත වෙලා ඉන්නේ. ඒ සියලුම දෙනාට පළාත් සභාව හැටියට අපගේ ශෝකය ප්‍රකාශ කරමින්, අපි හැමෝම තමන්ගේ ජීවිතය අවසානයේ බලාපොරොත්තු වන අජරාමර නිවන් සුව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ දීර්ඝ කාලීන මිතුරෙකු හැටියට සරත් සුමනසේකර මැතිතුමා අපේ පළාත් සභාවේ ඉඳලා අප අතරින් වෙන් වෙලා එතුමාගේ ශෝකය පළ කිරීමේ යෝජනාවට කථා කරන්න ලැබීම සම්බන්ධව - සරත් සුමනසේකර මැතිතුමායි මමයි පාසල් වියේ හොඳ මිත්‍රයෝ දෙන්නෙක්. අපි දෙන්නා එකට ඉගෙන ගෙන එතුමාගේ අයියයි, පවුලේ තුන් දෙනත් එක්කම මමත් ඉගෙන ගත් කෙනෙක්. එතුමා ඒ පාසල් වියේ සිටම අපේ හොඳ මිතුරෙකු හැටියට ඇවිල්ලා, ඊට පස්සේ විවාහ වෙලා හොඳ දූ දරුවෝ එයාගේ විවාහ මංගල්‍යයටත් මම ගිය කෙනෙක්. සුමනසේකර මැතිතුමාගේ විවාහ ජීවිතය සාර්ථකව ගත කරලා එතුමා දේශපාලනයට පිවිසිලා, දේශපාලන වශයෙන් එතුමා ප්‍රදේශයට විශාල සේවාවක් කරපු කෙනෙක්. පොඩි මිනිහාගේ දුක සැප හොඳට දන්න කෙනෙක්. එතුමා ඒ පොඩි මිනිහා එක්ක ජීවත් වුණු කෙනෙක්. එතුමාට ඕනෑම වෙලාවක ගෙදරට කෙනෙක් ගිහිල්ලා දන්සැලකට, දාන ගෙයකට, මඟුල් ගෙයකට, අවුරුදු උත්සවයකට, තොවිල් ගෙයකට, බණ ගෙයකට ඉල්ලුවොත් එතුමා පර්ස් එකෙන් ඇදලා ගාණක් දීලා තමයි එවන්නේ. එතුමා ගෙදර ඉඳලා නැහැයි කියපු කෙනෙක් නොවෙයි. සමහර දේශපාලඥයින් ඡන්ද කාලයට එනවා. වැඩ කරනවා. වේදිකාවලට යනවා. කැන්වසින් යනවා. දිනනවා. ඊට පස්සේ ගෙදර ඉඳලා නැහැයි කියනවා. එතුමා එහෙම කියපු කෙනෙක් නොවෙයි. එතුමා ජනතාව එක්ක, සමාජය එක්ක, දුප්පත් මිනිහා එක්ක, පොඩි මිනිහා එක්ක, ලොකු මිනිහා එක්ක, ව්‍යාපාර ක්ෂේත්‍රයේ එතුමා සෑම ක්ෂේත්‍රයකම ඉදිරියෙන් හිටපු කෙනෙක්.

ඒ වාගේම එතුමා මාත් එක්ක විදේශ ගමනක් ගියා. ඒ විදේශ සංචාරය ගිය වෙලාවේ එතුමා යන කොට මට මතකයි එතුමාගේ යාළුවෝ ඔක්කොම එයාර්පෝට් එකට ඇවිල්ලා, ඒ ස්ථානවලට ගෙනිහිල්ලා, ඒ රට අපට බලන්න ඕනෑ විධියට ඒ යාළුවෝ ඒ සංවිධාන කරලා ඒ අවස්ථාවක් ලබා දුන්නා අපේ සරත් සුමනසේකර මැතිතුමාට. ඒ වාගේම එතුමා අසනීපයෙන් ඉන්න වෙලාවේ මමයි හිටපු ජනාධිපතිතුමායි මැලේසියාවේ හිටියේ. මැලේසියාවේ ඉඳලා ඇවිල්ලා අපි එයාර්පෝට් එකේ ඉඳලා කෙළින්ම සරත් සුමනසේකර මැතිතුමාව බලන්න ආවා. ඒ වෙලාවේ එතුමා හිටියේ, ඒ වෙලාවේත් එතුමා හිතුවේ නැහැ එතුමා මිය යයි කියලා. එතුමා හිනා වෙලා කථා කරලා මහින්ද රාජපක්ෂ මැතිතුමා එක්ක අපි ඉදිරි කටයුතු වැඩ කරන්නේ කොහොමද? මේ යහපාලන ආණ්ඩුව පෙරළන්නේ කොහොමද? කියලා තමයි එතුමා එතැනදීත් කථා කළේ. ඒ අනුව තමයි අපේ පළාත් සභා මන්ත්‍රීවරු එක තැනකට ගෙන්වලා කෑම වේලක් දීලා, ඒ ගෙදරදී අපට ඒ අයිතිය ලබා දීලා එතුමා කරන්න ඕනෑ යුතුකම් සියල්ලක් කළා.

ඒ වාගේම ජනාධිපති මැතිවරණය වෙලාවේ රට වටේම එතුමාත්, එතුමාගේ පුත්‍ර රත්නයයි නාමල් රාජපක්ෂ මැතිතුමායි මුළු රට වටේ සෑම වේදිකාවකටම ගියා. ඒ වේදිකාවලට යන කොට සරත් සුමනසේකර මැතිතුමායි, එතුමාගේ පුතාවයි අපට නිතරම ජනාධිපතිතුමා එක්ක යන කොට හම්බ වුණා. එතුමා විශාල ධනයක් වියදම් කළා. අද ඒ නිසා තමයි එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ආණ්ඩු පක්ෂයේ පනස් ගණනක් පත් වෙන්න පුළුවන්කමක් ලැබුණේ. ඒ සටන සරත් සුමනසේකර මැතිතුමා කරපු නිසා තමයි ඊළඟ පළාත් සභා දෙකේදීම මේකට එන්න පුළුවන් වුණේ. එදා කඩුවෙල ප්‍රාදේශීය සභාවට තරඟ කරන වෙලාවේ - මමත් ඉසුර දේවප්‍රිය අපේ මහ ඇමතිතුමාත් 1991 මහරගම ප්‍රාදේශීය සභාවෙන් ආවේ. අපි එනකොට එතුමා දේශපාලනයේ හිටියේ නැහැ. එතුමා ඊට පස්සේ මැතිවරණයෙන් තමයි ආවේ. එතකොට ඒ ඇවිල්ලා එතුමා අපේ බුද්ධදාස මැතිතුමා එක්ක බොහොම කිට්ටුවෙන් වැඩ කළා. නමුත් ඒ මිත්‍රත්වය කොපමණද කිව්වොත් අන්තිමට බුද්ධදාස මැතිතුමා එයාව පරාජය කරන්න කටයුතු කළා. මේ වාගේ ඊර්ෂ්‍යා වෛර දේශපාලනයක් තමයි තිබෙන්නේ. සරත් සුමනසේකර මැතිතුමාගේ හිත අමනාප වුණා. ඒකෙන් තමයි එතුමා රෝග තත්ත්වයට පත් වුණේ. ඒ රෝගී තත්ත්වයට පත් වුණාට පස්සේ එතුමා ඒවා ගණන් ගත්තේ නැහැ. තමන්ගේ දරුවන්ගේ අනාගතය, තමන්ගේ භාර්යාවගේ අනාගතය, ඒ ගෙවල් දොරවල් හදලා, ඒගොල්ලන් විවාහ කරලා දීලා ඒ සරත් සුමනසේකර මැතිතුමාගේ පවුලේ අයට වෙන්න ඕනෑ යුතුකම් සියල්ලක්ම ඉටු කරපු අපේ සහෝදරයෙක් තමයි සරත් සුමනසේකර මැතිතුමා. ඒ නිසා මම මීට වඩා කාලය ගන්න යන්නේ නැහැ. අපේ නෝනා මහත්මියගේත් හොඳ මිතුරෙක් එතුමා. මගේ විවාහයටත් එතුමා ආවා. මම එතුමාගේ විවාහයටත් ගියා. ඒ නිසා එතුමාට අපේ පවුලේ ශෝකයත්, ඒ වාගේම අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ශෝකයත් මේ අවස්ථාවේ පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

# රීති අංක 30 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 30

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"අද දින සභාවේ වැඩ කටයුතු අවසන් වන තෙක් සභාවේ කාලය දීර්ඝ කළ යුතු යැයි"* යෝජනා කරනවා.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සරත් සුමනසේකර මැතිතුමා පිළිබඳව ශෝක යෝජනාව ඉදිරිපත් කරන වෙලාවේ අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් අපේ පළාත් සභාව දෙවතාවක් නියෝජනය කරපු, ඉතාම ශ්‍රේෂ්ට ගතිගුණ තිබුණු, ඉතාම හොඳ මහජන නියෝජිතයෙක් කියන කාරණාව සෑම අදහස් දක්වපු අපේ ගරු මන්ත්‍රීතුමන්ලා සඳහන් කළා. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ඇත්තටම ඉතාම හොඳ මනුස්සයෙක්. ඉතාම හොඳ මානුෂික හැඟීම් තිබුණු, ගතිගුණ තිබුණු මේ සභාව නියෝජනය කරන සෑම මන්ත්‍රීවරයෙකු එක්කම කිසිදු ගැටළුවක් ඇති නොවුණු, බොහොම හොඳ සිනහවකින් සංග්‍රහ කරමින් හැම කෙනෙක් එක්ම ඇසුරු කරපු ඉතාම හොඳ මහත්මයෙක් කියන එක ප්‍රථමයෙන් සඳහන් කරන්න කැමැතියි. විශේෂයෙන් එතුමා මහජන නියෝජිතයෙකු හැටියට පත් වුණාට පසු අපි ඔය කඩුවෙල පාරේ එනකොට දකිනවා, සරත් සුමනසේකර පදනම කියලා ස්ටිකර් කරලා තිබෙන වාහනයකුත්, ඒ වාගේම ආයතනයකුත්. ඒ එතුමාගේ කාලය තුළ සරත් සුමනසේකර පදනම හරහා විශාල සේවාවන් රැසක් ප්‍රදේශයේ ජනතාවට එතුමා අත් කරලා දුන්නා. අපේ ප්‍රදීප් උඳුගොඩ ගරු මන්ත්‍රීතුමාත් සඳහන් කළා වාගේ, පළාත් සභා ප්‍රතිපාදන ලැබෙන තෙක් ඉන්නේ නැතිව, එතුමාගේ පෞද්ගලික ධනය එතුමාට හිටියා විශාල මිත්‍රයෝ සංඛ්‍යාවක්. පිටරටවල. ඒ අය හරහා සමාජයේ බොහෝ ස්ථාන කරා යමින් විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ එතුමා සමාජයේ තිබුණු පීඩනයන් ඉවත් කරන්න, විශාල දායකත්වයක් මේ සරත් සුමනසේකර පදනම හරහා කරපු බව අපි හොඳටම දැක්කා. විශේෂයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් දරුවන්ගේ අධ්‍යාපනයේ සංවර්ධනය සඳහා සරත් සුමනසේකර පදනම හරහා සුවිශාල සේවාවන් රාශියක් එතුමාගේ මේ කාලය තුළ එතුමා සිද්ධ කළා.

ඇත්තටම එතුමාගේ වියෝව අපි කාටත් අදහා ගන්න බැරි, ඉතාම සුළු කාල පරිච්ඡේදයක් තුළ සිදු වුණු සිද්ධියක්. එතුමා මේ සභාවට මේ වාගේ එක් දිනක සභාවට පැමිණිලා එදාම රෝහල්ගත වෙලා තිබුණා. මම හිතන්නේ, එතුමා ඒ සභාවට පැමිණි දවසේ යම් අසනීප තත්ත්වයක් අපි දැක්කා. නමුත් මෙවැනි අවාසනාවන්ත සිද්ධියක් වෙයි කියලා කාටවත් අදහාගන්න බැරි තත්ත්වයක තමයි එතුමා හිටියේ. මොකද, අසනීප තිබුණත් එතුමා ඒවා හිතේ දරාගෙන බොහොම සුහදශීලී, අර වෙනදා දකින සිනහවෙන් සංග්‍රහ කරමින් අපිත් එක්ක කථාබහ කරලා තමයි මේ සභාවෙන් එතුමා නික්මුණේ. නමුත් කනගාටුව ඒ නික්මවීම සඳහටම ජීවතයෙන් සමු ගන්න තත්ත්වයකට පත් වෙලා තිබුණා. මම හිතන්නේ, අර හැම දෙනාම කිව්වා වාගේ අපි හැම කෙනාටම බොහොම ගැඹුරින් දැනුනු කනගාටුදායක සිද්ධියක්. එතුමා ඒ තරමටම මේ සභාව නියෝජනය කළ හැම කෙනෙකු එක්කම බොහොම හොඳ සුහදත්වයකින් කටයුතු කරපු මහජන නියෝජිතයෙක්.

ඒ වාගේම තමයි මම එතුමාගේ දැක්ක තව සුවිශේෂී ලක්ෂණයක්. කිසි විටෙක වරදාන, වරප්‍රසාද වෙනුවෙන් එතුමාගේ හිස නැමුවේ නැහැ. ඒකේ හොඳම අවස්ථාව තමයි එතුමා මේ සභාවේ හිටපු අපේ එක ඇමතිවරයෙකු එක්ක යම් ගැටළුවක් මතු වුණා. ඒ අවස්ථාවේදී එතුමාගේ අමාත්‍යාංශයේ ඡන්දය විමසන අවස්ථාවේ ඊට සභාවට සහභාගී වුණේ නැහැයි කියලා ඔහුට පළාත් සභාවේ ඒ අමාත්‍යාංශය හරහා පළාත් සභාවේ ප්‍රතිපාදන ලබා නොදෙන තීරණයකට ගියා. හැබැයි, එතුමා ඒකට සැලුනේ නැහැ. එතුමා නැමුණෙත් නැහැ. එතුමා හිටපු ඍජු ප්‍රතිපත්තියේ ඒ ආකාරයටම ආරක්ෂා කර ගෙන එතුමාගේ වැඩ කටයුතු කර ගෙන ගියා. එහෙම නිර්භීත අදහස් තිබුණු, ඒ වාගේම යම් දර්ශනයක් මත කටයුතු කරපු, බොහොම හොඳ සමාජශීලී මහජන නියෝජිතයෙක් කියන එක අපි සඳහන් කරන්න කැමැතියි.

ඒ වාගේම තමයි, යම් වැඩ සටහනක් පළාත් සභාව හරහා ක්‍රියාත්මක කරද්දී, එක්කෝ මන්ත්‍රීවරු පෞද්ගලිකව වෙන්න පුළුවන්. පොදුවේ පළාත් සභාව හැටියට වෙන්න පුළුවන්. එතුමාගෙන් ලබා දෙන දායකත්වය ඉතාමත් ඉහළින් දීපු මහජන නියෝජිතයෙක්. ඉතාම නිර්ලෝභීව, තව කෙනෙක් කරයි කියලා බලාගෙන ඉන්නේ නැතිව, ඔහු අනික් අය වෙනුවෙන් බොහෝ සෙයින් කටයුතු කරපු කෙනෙක්.

ඒ වාගේම තමයි ආණ්ඩු පක්ෂයේ සුභ සාධක සංගමය ඇති කිරීමේදීත් එතුමා මුල් වුණු කෙනෙක්. එතුමා අපේ ආණ්ඩු පක්ෂයේ සුබ සාධක සංගමයේ පළමුවැනි භාණ්ඩාගාරිකවරයා. හැබැයි, එහෙම වෙලා ලොකු කාලයක් කටයුතු කරන්න වුණේ නැහැ. එවැනි අදහස් ආවෙත් එතුමාගේ අදහසක් අනුව තමයි. බොහෝ සෙයින් ඒ සුභ සාධක සංගමය ආරම්භ කරන්න, ක්‍රියාත්මක වෙන්න හේතු පාදක වුණෙත් එතුමාගේ අදහසක් අනුවයි කියන කාරණාව මම මේ වෙලාවේ මතක් කරනවා. මම මීට වඩා දීර්ඝව මේ වෙලාවේ අදහස් ප්‍රකාශ කරන්නේ නැහැ.

මැත භාගයේ දකින්න තිබෙන මහජන නියෝජිතයන් අතර ඉතාම හොඳ මිත්‍රශීලී, අනුන්ගේ දුකක් හොඳින් අවබෝධ කර ගත්, හොඳ හදවතක් තිබුණු, සමාජශීලී, සමාජයට වැඩදායී අදහස් වෙනුවෙන් පෙනී සිටි හොඳ මහජන නියෝජිතයෙක් කියන කාරණාව මතක් කරමින්, මම පෙර සඳහන් කළා වාගේම නැවතත් මතක් කරන්නේ. සඳහන් කරන්නේ. ප්‍රාර්ථනා කරන්නේ. සරත් සුමනසේකර මැතිතුමා නැවත වතාවක් අප අතර ඉපිද අපිත් එක්ක නැවතත් මහජන සේවාව කරන්න පුළුවන් වාසනාව උදා වේවායි ප්‍රාර්ථනා කරමින් පවුලේ භාර්යාව සහ පුතා සහ දියණිය ඇතුළු ඒ ඥාතීන්ට සාතිශය සංවේගය පළ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ අපේ සරත් සුමනසේකර මැතිතුමා අපට මුණ ගැහෙන්නේ පස් වන පළාත් සභා මැතිවරණයේදී. විශේෂයෙන්ම කඩුවෙල නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙකු හැටියට ඉඳලා ඔහු පසුව බස්නාහිර පළාතේ පළාත් සභාවට තරඟ කරලා ජයග්‍රහණය කරනවා. මම හිතන්නේ, එතුමා දේශපාලනයේ පළාත් සභාවට එන්න ප්‍රථමත්, විශේෂයෙන්ම කඩුවෙල ආසනය කේන්ද්‍ර කර ගෙන ආගමික, සමාජයීය කටයුතුවලදී තම පෞද්ගලික ධනය පරිත්‍යාග කරමින් මහජනතාවට සේවය කරපු අපේ කාලයේ බිහි වුණු මහජන නියෝජිතයෙකු හැටියට තමයි මම සරත් සුමනසේකර මැතිතුමාව දකින්නේ. විශේෂයෙන්ම එතුමාගේ මැණියන් අපේ කෝට්ටේ ප්‍රදේශයේ ජන්ම ලාභය ලබපු කෙනෙක්. ඒ වාගේම එතුමාත් පාසල් කාලයේත්, තරුණ කාලයේත් කෝට්ටේ ප්‍රදේශයේ ගත කරපු කෙනෙක්. මට මතකයි. ඔහු තරඟ කරපු පළාත් සභා මැතිවරණ දෙකේදීම ඔහු කඩුවෙල වාගේම කෝට්ටේ ප්‍රදේශයේත් මැතිවරණ කටයුතුවලදී ක්‍රියාශීලීව කටයුතු කළා. අවස්ථා කිහිපයකදීම මට එතුමාව මුණ ගැසුණා. මොකද, එතුමාගේ නෑයින් සහ මිත්‍රයින් විශාල ප්‍රමාණයක් ඒ කෝට්ටේ සහ නාවල ප්‍රදේශයේ ජීවත් වෙන්නේ. එතකොට අපි ඔහු දැන ගත් දවසේ සිට ඔහු අපේ ඉතාමත්ම කිට්ටුවන්ත මිත්‍රයෙකු හැටියට අපිත් එක්ක කටයුතු කළා. සාමාන්‍යයෙන් දේශපාලනයේදී මහජන නියෝජිතයන් අතර විවිධ අර්බුද ගොඩ නැගෙනවා. දේශපාලන කුහකකම්, ඊර්ෂ්‍යාකම්, කුඩුකේඩුකම් ගොඩ නැගෙනවා. නමුත් අපි සරත් සුමනසේකර මැතිතුමා තුළින් එවැනි තත්ත්වයක් දැක්කේ නැහැ. අර අපේ ආණ්ඩු පක්ෂයේ සංවිධායක ගුණසිරි ජයනාත් මන්ත්‍රීතුමා කිව්වා වාගේ තමන්ට අහිමි වන දේ ගැන හඬා වැලපුනේ නැහැ. ඒවා ඉල්ලලා පස්සෙන් ගියේ නැහැ. ඒ වෙනුවෙන් කාගේවත් සහාය පැතුවේ නැහැ. කොන්ද කෙළින් තියාගෙන තමන් මහන්සි වෙලා උපයා ගත් ධනයෙන් වැඩි කොටසක් මහජනයා වෙනුවෙන් කැප කරපු දේශපාලඥයෙක්. මම හිතන්නේ පළාත් සභා පිහිටුවලා අවුරුදු තිහක් සම්පූර්ණ වන මේ ඉතිහාසය තුළ එතුමා ඒ ඉතිහාසයට එකතු වන බව අපි මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම එතුමාට හය වැනි පළාත් සභාවට ජයග්‍රහණය කරලා එන්න බැරි වුණත් එතුමා පසුව අපේ පළාත් සභාවට එකතු වුණා. විශේෂයෙන්ම වර්තමාන ජනාධිපතිතුමාගේ ආශිර්වාදය ලබමින් එතුමා නැවත වතාවක් මේ පළාත් සභාවට මන්ත්‍රීවරයෙකු හැටියට පත් වෙනවා. එතකොට එතුමා පත් වෙලා ඉතා කෙටි කාලයක් තුළ විශේෂයෙන්ම අපගේ පස් වන පළාත් සභාවට වඩා එතුමා ඒ කෙටි කාලය තුළ විශාල ජනප්‍රිය පුද්ගලයෙකු බවට පත් වෙනවා. අපේ ප්‍රදීප් උඩුගොඩ ගරු මන්ත්‍රීතුමා ඇතුළු අපේ තරුණ මන්ත්‍රීවරුත් එක්ක එකතු වෙලා එතුමා - (බාධා කිරීම්) අපි කියන කොට එහෙමනේ කියන්නේ? වයසයි කියලා කියනවාද? සරත් අයියාටත් අපි එහෙම කියනවාද? සරත් මන්ත්‍රීතුමාත් හිටියේ කොල්ලෙක් වාගේ. එතුමා අපේ තරුණ අයත් එක්ක ඔය ජනක වැලිවත්ත, සලෝචන ගමගේ, මහේෂ් අල්මේදා ඒ වාගේ තරුණ අයත් එක්ක හිටියේ. එතුමා අපට වඩා දීර්ඝ ආයුෂක් ලබලා තිබුණත් එතුමා තරුණ මන්ත්‍රීවරුත් එක්ක තමයි කටයුතු කළේ. නේද? මම හිතන්නේ, අපේ අනුරාධ මන්ත්‍රීතුමාටත් ඒ අත්දැකීම් ඇති. එතුමා හුහක් වෙලාවට තරුණ

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

මන්ත්‍රීවරුන් එක්ක තමයි හිටියේ. අවසාන අවදියේ, එතුමා රෝගාබාධයට පත් වෙන්න ඉස්සෙල්ලා එතුමා සභාවට ආවාම අපේ මේ තරුණ මන්ත්‍රීවරු එතුමාව වට කර ගෙන හිටියේ. මී මැස්සෝ ටික වාගේ. එහෙම කාලයක් තිබුණා. එතුමා අපේ පළාත් සභාවට තිබුණු, විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයට තිබුණු ප්‍රධාන අඩුපාඩුවක්, අපේ සංවිධායකතුමා කිව්වා වාගේ, ප්‍රදීප් මන්ත්‍රීතුමාත් එකක් එකතු වෙලා අපේ සුභ සාධක සමිතිය පිහිටුවලා, අපේ අභිංසක පළාත් සභා මන්ත්‍රීවරුන් වෙනුවෙන් යමක් කරන්න ඕනෑය කියලා එතුමා මූලිකත්වය ගත්ත කෙනෙක්. නමුත් එතුමා හදිසියේ අසනීප වූ නිසා එතුමාගේ බලාපොරොත්තුවක් ඉෂ්ට කරලා දෙන්න බැරි වුණා. ඒ නිසා මම හිතන්නේ, එතුමා වාගේ කෙනෙකුගේ අභාවය මම හිතන්නේ, ඒ භාර්යාවට දරුවන්ට වාගේම මම හිතන්නේ විශේෂයෙන්ම කඩුවෙල, කෝට්ටේ වාගේම මේ කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාවට වුණු බලවත් පාඩුවක් හැටියට තමයි මම දකින්නේ.

ඒ වාගේම මම ප්‍රධාන ඇමතිවරයා හැටියට පත් වුණාට පස්සේ එතුමා බොහොම සතුටට පත් වෙලා හැම වෙලාවේම මේ සභාවේ කටයුතු පවත්වාගෙන යෑමේදී මට විශාල දායකත්වයක් ලබා දුන්න කෙනෙක්. ඒ නිසා අනපේක්ෂිත ලෙස එතුමාගේ අභාවය සිද්ධ වන කොට මම මේ රටේ හිටියේ නැහැ. විදේශගත වෙලයි හිටියේ. නමුත් මගේ පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය, ඒ වාගේම අපේ ප්‍රදීප් උඳුගොඩ ගරු මන්ත්‍රීතුමා ප්‍රමුඛ අපේ මන්ත්‍රීවරු මූලික වෙලා, විශේෂයෙන්ම ඒ පවුලේ සාමාජිකයොත් එක්ක එකතු වෙලා විශේෂයෙන්ම ඒ අවමංගල්‍ය කටයුතුවලදී උපරිම සහයෝගය ලබා දෙමින් මම හිතන්නේ, එතුමාට ගෞරවයක් වන විධියට එතුමාගේ අවමංගල්‍ය කටයුතුවලදී පවුලේ සාමාජිකයන් එක්ක එකතු වෙලා ඒ කටයුතු ඉෂ්ට සිද්ධ කරලා තිබුණා. අපි මේ සමාජය තුළ, මේ විශ්වයට අපි එකතු වෙලා ඒ විශ්වයේ විවිධ ක්‍රියාකාරකම්වලට දායක වෙලා අපි කාටත් සදාතනික උරුමය වන මරණය නමැති යථාර්ථය වැළඳ ගනිමින් ඔහු අපගෙන් අද සමු අරගෙන තිබෙනවා. ඒ නිසා අපේ රටේ තිබෙන ශ්‍රේෂ්ටතම පළාත් සභාවේ පළාත් සභා මන්ත්‍රීවරයෙකු හැටියට කටයුතු කරමින් තමන්ගේ ජීවිතය අවසාන යුගයේ ගෙවන්න ලැබීමත් මම හිතන්නේ එතුමා ජීවිතයේ ලබපු භාග්‍යයක් හැටියට මම දකින්නට කැමැතියි. ඒ නිසා ව්‍යාපාරික ක්ෂේත්‍රය ජය ගෙන, ඒ වාගේම දේශපාලන ක්ෂේත්‍රය ජය ගත් අපේ සහෝදර හිටපු පළාත් සභා මන්ත්‍රී සරත් සුමනසේකර මැතිතුමාට අපි කවුරුත් අදහන ආගම ධර්මයට අනුව සදා නිසංසල වූ සුවය ප්‍රාර්ථනා කරමින් බස්නාහිර පළාතේ පළාත් සභාවේ සාතිශය ශෝකය එකතු කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ කථාවෙන් පස්සේ සරත් සුමනසේකර මැතිතුමාගේ ශෝක යෝජනාව අවසන් කරන්නයි හැදුවේ. සරත් සුමනසේකර ගරු මන්ත්‍රීතුමාගේ මන්ත්‍රී ධූරය අහිමි වීමත් එක්කම ඒ මන්ත්‍රී ධූරය හිමි වුණේ අවිස්සාවේල්ල ප්‍රදේශයට. සීතාවක ප්‍රදේශයට. සුමිත් සොයිසා ගරු මන්ත්‍රීතුමාට. එතුමා නොසිටියත් එතුමා නියෝජනය කරමින් පැමිණි අපේ යුතුකමක් තිබෙනවා, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට ඒ සම්බන්ධව සුමිත් සොයිසා ගරු මන්ත්‍රීතුමාවත් සිහි කරලාම පොඩි ශෝක ප්‍රකාශක් කරන්න. ඒ නිසා ඒ අවස්ථාව ලබා දෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අපේ දේශපාලඥයෙක්, ඒ වාගේම ව්‍යාපාරිකයෙකුට වැඩිය ඉතාම කල්‍යාණ මිත්‍රයෙක් වුණු සරත් සුමනසේකර මැතිතුමා වෙන්ව ගිහිල්ලා, එතුමා වෙනුවෙන් ශෝක යෝජනාව සාකච්ඡා කරන වෙලාවේ අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. සරත් සුමනසේකර මැතිතුමා ඇත්තටම ඉතාම හොඳ මිත්‍රයෙක්. ඉතාම සමීප මිත්‍රයෙක්. මිත්‍රයින්ට ඉතාම සමීප මිත්‍රයෙක්. සරත් සුමනසේකර මැතිතුමා දේශපාලනයට ආවේ තරමක් ප්‍රමාද වෙලා. එතුමා දීර්ඝ කාලයක් ක්‍රීඩා කටයුතුවල, ව්‍යාපාරික කටයුතුවල තමන්ගේ පුද්ගලික කාරණාවල ඉඳලා ඔහුගේ ජීවිතයේ අවසාන කාලයට එන කොට තමයි 2006 විතර තමයි දේශපාලනයට එන්නේ. හැබැයි, සරත් සුමනසේකර මැතිතුමා දේශපාලනට එන්න බලපාන්න ඇති කාරණය විධියට අපි දකින්නේ, එතුමා උපදින්නේ 1956 අවුරුද්දේ. 1956 කියලා කියන්නේ ලාංකීය දේශපාලනයේ ඉතාමත් වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරපු වර්ෂයක්. ලංකාව දේශපාලනික වශයෙන්, සමාජීය වශයෙන්, සංස්කෘතිකමය වශයෙන් දැවැන්ත පෙරළියකට භාජනය වන, මහා

දේශපාලන විප්ලවය වෙන්නේ 1956 දී. 1956 ජූනි මාසේ 25 වැනිදා තමයි එතුමා උපදින්නේ. මම හිතන්නේ, තව මාසයක් එතුමා ජීවත් වුණා නම් අවුරුදු 60 ක උපන්දිනය සමරන්නට එතුමාට පුළුවන්කම තිබුණා. 1956 හැට වන සංවත්සරයට සහභාගී වෙන්න එතුමාට තිබුණා. හැබැයි, එතුමා ඊට කලින් අපි හැමෝගෙන්ම වෙන් වෙලා ගියා. 1956 ජූලි 25 වැනිදා නාවල ඉපදුනු සරත් සුමනසේකර මැතිතුමා ශාන්ත ජෝන් විද්‍යාලයේදී මම හිතන්නේ එතුමාගේ දේශපාලන ජීවිතයේ මුල් අත් පොත් තබනවා. නායකත්වය පිළිබඳ අත්දැකීම. ශාන්ත ජෝන් විද්‍යාලයේ බොහොම දක්ෂ ශිෂ්‍යයෙකු විධියට ඉඳලා එතුමා සමාජයට බහින්නේ සමාජය පිළිබඳ දැවැන්ත අත්දැකීම් ඇති කෙනෙකු විධියට. ඒ නිසාම එතුමාට පුළුවන් වෙනවා සමාජය ඇතුළේ තමන්ගේ පෞරුෂය, තමන්ගේ දේශපාලන පෞරුෂය නොවෙයි, තමන්ගේ ව්‍යාපාරික පෞරුෂය බොහොම හොඳට ගොඩ නගා ගන්න. ව්‍යාපාරිකයෙකු විධියට අති සාර්ථක තත්ත්වයට පත් වන කෙනෙකු විධියට තමයි අපි සරත් සුමනසේකර මැතිතුමා හඳුනා ගන්නේ. බොහෝ අය අපි දන්නවා ලංකාවේ දේශපාලනයට එන්නේ සල්ලි හම්බ කරන්න. හැබැයි, සරත් සුමනසේකර මැතිතුමා එතැනින් හාත්පසින් වෙනස් චරිතයක් තමයි රඟපෑවේ. එතුමා හරි හම්බ කර ගෙන තිබුණු සල්ලි තමන්ගේ දේශපාලනය වෙනුවෙන් විනාශ කර ගන්න එක තමයි තමන්ගේ දේශපාලන කාල පරිච්ඡේදය පුරාම සිද්ධ කර ගත්තේ. ඒක මිනිහෙකුගේ විශේෂයෙන් වර්තමානයේ ලංකාවේ ඉන්න දේශපාලඥයින්ගෙන් දකින්න නොලැබෙන ලක්ෂණයක් විධියට තමයි අපි දකින්නේ. එතුමා විශාල ධන ස්කන්ධයකට හිමිකම් කියපු කෙනෙක්. එතුමාට විශාල භෞතික සම්පත් ප්‍රමාණයක් තිබුණා. ඒ සල්ලිත් එක්ක බොහොම සුඛිත මුදිත ජීවිතයක් ගත කරන්න පුළුවන්කම තිබුණා. නමුත් මිනිස්සුන්ගෙන් බැණුම අහන, හොඳක් කළාට කවදාවත් හොඳක් අහන්න ලැබෙන්නේ නැති මේ දේශපාලනයට එතුමා ඇතුළත් වුණා.

2006 අවුරුද්දේ එතුමා කඩුවෙල නගර සභාවේ මැතිවරණයට තරඟ කළා. ඒ මැතිවරණයේදී ඉතාම ඉහළ ජයග්‍රහණයක් එතුමාට ලැබුණා. ඒ තරඟා තමයි එතුමාට පළාත් සභාවට තරඟ කරන්න අවස්ථාව උදා වෙන්නේ. එතුමා 2009 දී පළාත් සභාවට තරඟ කරලා පස් වන පළාත් සභාවට තේරී පත් වෙනවා. තේරී පත් වෙලා පළාත් සභාව තුළ බොහොම ක්‍රියාකාරී මන්ත්‍රීවරයකු විධියට එතුමාගේ සහයෝගය දෙනවා. අවාසනාවට හය වන පළාත් සභාවට එතුමාට එන්න බැරි වෙනවා. හැබැයි, එතුමා මායිමේ නතර වෙලා පස්සේ කාලයක පළාත් සභාවට නැවත එනවා. ආපහු පළාත් සභාවට ආවාම එතුමාගේ එදා තිබුණු ක්‍රියාකාරීත්වය අපි සියලු දෙනාටම දකින්න ලැබුණා. ඉතින් සරත් සුමනසේකර මැතිතුමා ක්‍රියාකාරීව තමන්ගේ දායකත්වය, තමන් එපමණ කල් හිටපු ව්‍යාපාරික ක්ෂේත්‍රයේ දාන්න ඕනෑ කාලය අඩු කරලා, දේශපාලනය වෙනුවෙන් ඒ කාලය යොදවලා, එතුමා දේශපාලනයේ ක්‍රියාකාරී වෙලා කටයුතු කළා. මම හිතන්නේ, සරත් සුමනසේකර මැතිතුමා දේශපාලනයේ කටයුතු කළාට මම නම් පෞද්ගලිකව විශ්වාස කරනවා, සරත් සුමනසේකර මැතිතුමාට දේශපාලනය ගැලපෙන්නේ නැහැයි කියලා. ඒකට ප්‍රධානම කාරණය තමයි ඒ තරම් හිත හොඳ, නිහතමානී මනුස්සයෙකුට ලංකාවේ වර්තමාන දේශපාලනය ගැලපෙන්නේ නැහැ. එතුමාගෙන් බොහෝ අය ප්‍රයෝජන ගත්තා. එතුමා පාවිච්චි කරලා ඡන්දවලට ආපු බොහෝ අය කඩුවෙල ආසනයේ ඉන්නවා. කඩුවෙල ආසනයේ එතුමාව පාවිච්චි කරපු දේශපාලඥයෝ රාශියක් ඉන්නවා. හැබැයි, සමහර තීරණාත්මක මොහොතවල්වලදී එතුමාව අමතක කළා. එතුමා අන්තිම කාලයේ දේශපාලනය කෙරෙහි යම් කළකිරීමක හිටියා. ඒ හැසිරීම් එක්ක. නමුත් සරත් සුමනසේකර මැතිතුමා තමන්ගේ කැප වීම දේශපාලනය වෙනුවෙන් අඩු කරන්න කල්පනා කළේ නැහැ. එතුමාට බොහෝ බාධක තිබෙද්දී, බොහෝ හිරිහැර කරද්දී, කරදර කරද්දී බොහොම උපේක්ෂා සහගතව මේ සියල්ල ඉවසා ගෙන සරත් සුමනසේකර මැතිතුමා තමන්ගේ සමාජ මෙහෙවර කළා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සරත් සුමනසේකර මැතිතුමා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සමාජ සේවකයෙක්. එතුමා දැවැන්ත සමාජ සේවකයෙක්. මම හිතන්නේ අසනීප තිබුණු මිනිස්සුන්ට දීපු මුදල් ගණන එකතු කළොත් තව ගොඩනැගිලි ගණනාවක් සරත් සුමනසේකර මැතිතුමාට හදන්න පුළුවන්කම තිබුණා. බොහෝ අයට උපකරණ දුන්නා. අධ්‍යාපනය හදාරන දරුවන්ට Educational materials, කම්පියුටර් එක, ලැප්ටොප් එක, මේවායේ මුදල බලන්නේ නැතිව සරත් සුමනසේකර මැතිතුමා අරන් දුන්නා. මම හිතන්නේ එතුමා අරන් දීපු ඒ භාණ්ඩත් එක්ක ජීවිත ආලෝක කර ගත් දරුවෝ රාශියක්

[ගරු මහේෂ් අල්මේදා]

අද කඩුවෙල ආසනයෙත්, කොළඹ දිස්ත්‍රික්කය ඇතුළේත් ඉන්නවා. සමහර වෙලාවට කන්නාඩි තොග පිටින් සරත් සුමනසේකර මැතිතුමා තමන්ගේ අතේ තිබුණු මුදල්වලින් බෙදුවා. ඒ නිසා සරත් සුමනසේකර මැතිතුමා දේශපාලනයෙන් තමන්ගේ සාක්කුවට සල්ලි දා ගත්ත කෙනෙක් නොවෙයි. තමන්ගේ සාක්කුවේ සල්ලි දේශපාලනය වෙනුවෙන් වැය කරලා, තමන්ගේ ගොඩ අඩු කර ගත්ත දේශපාලඥයෙක් විධියට තමයි අපි සියලු දෙනාට හඳුන්වන්න පුළුවන්කම තිබෙන්නේ. කොහොම වුණත් සරත් සුමනසේකර මැතිතුමා ඉතාම නිහතමානී, ඉතාම හිත හොඳ, ඉතාම යහපත් ගුණධර්ම තිබුණු බොහොම හොඳ මහත්මයෙක් විධියට තමන්ගේ දේශපාලනයේ හැසිරුණා. අපි දන්නවා. ලාංකීය දේශපාලනයේ බොහෝ අයට නරක නමක් ඇඳෙන්නේ නැතිව දේශපාලනයෙන් විශ්‍රාම ගන්න ලැබෙන්නේ නැහැ. හැමෝටම කියනවා හොරකමක් කළා කියලා. හැමෝටම කියනවා වැරදි වැඩක් කළා කියලා. හැමෝටම කියනවා නීති විරෝධී වැඩක් කළාය කියලා. හැබැයි, සරත් සුමනසේකර මැතිතුමාට මේ එක චෝදනාවක්වත් කරන්න පුළුවන්කම තිබුණේ නැහැ. එතුමා චෝදනාවකට ලක් වෙන විධියට හැසිරුණේ නැහැ. ඒ නිසා සරත් සුමනසේකර මැතිතුමා දේශපාලන ජීවිතයේ ඉන්න කාලයේදීම එතුමාගේ ජීවිතය හමාර කර ගත්තේ දේශපාලඥයෙකු විධියට පුංචි මඩක්වත් තමන්ගේ දේශපාලන චරිතයට එකතු කර ගන්නේ නැතිව.

ඒක සුවිශේෂී ලක්ෂණයක්. ඒක වැදගත් කාරණයක්. මිනිහෙකුට පුළුවන් නම් තමන් දේශපාලනය නිසා යම් කුණු නාමයක්, මඩක් ගා ගන්නේ නැතිව තමන්ගේ දේශපාලනය අවසන් තැන ලකුණු කරන්න, ඒක බොහොම වැදගත් එකක්. සරත් සුමනසේකර මැතිතුමා එවැනි ගෞරවනීය තත්ත්වයක ඉන්න කාලයකදී තමයි එතුමාගේ මරණය සිද්ධ වුණේ. ඇත්තටම සරත් සුමනසේකර මැතිතුමාගේ මරණය මේ නිවසට වඩා පාඩුව අපේ සමාජයට කියන කාරණය එතුමාට ගෞරවයක් විධියට මතක් කරන්න ඕනෑ. ඒ තරම් වටිනා සමාජ සේවකයෙකු විධියට තමයි එතුමා ජීවත් වුණේ. ඒ නිසා මේ මරණයේ පාඩුව සමාජයට බරපතළ විධියට දැනෙනවා. ලංකාවේ ඉතාම පිරිසිඳු දේශපාලනයක් අපේක්ෂා කරන මිනිස්සුන්ට මේ මරණයේ පාඩුව දැනෙනවා. ඒ වාගේම තමයි සමාජයේ පිළිසරණක් නැතිව ඉන්න සමාජයේ පිළිසරණක් අපේක්ෂා කරන මිනිස්සුන්ට මේ මරණයේ පාඩුව දැඩිව දැනෙනවා. එතුමාට තව දීර්ඝ කාලයක් දේශපාලනයේ නිරත වෙන්න පුළුවන්කම තිබුණා. හැබැයි, ඉතාම අවාසනාවන්ත විධියට එතුමා අපි කවුරුත් නොහිතපු රෝගී තත්ත්වයකට පත් වුණා. අර අපේ මහ ඇමතිතුමා කිව්වා වාගේම එතුමා පළාත් සභාව ඇතුළේ හොඳ මිත්‍ර සමාජයක් නඩත්තු කළා. බොහෝ අයට පුළුවන්කමක් නැහැ දීර්ඝකාලීනව මිත්‍ර සමාජයක් නඩත්තු කරන්න. සමහරුන්ට යාළුවෝ ඉන්නවා. නැති වෙනවා. සමහරුන්ට අද ඉන්න යාළුවෝ හෙට නැහැ. හැබැයි, සරත් සුමනසේකර මැතිතුමාලගේ යාළුවෝ ටික හැමදාම එතුමා ළඟ හිටියා. එතුමා ඉතාම හොඳ මිත්‍රයෙක් විධියට, සමාජ සේවකයෙක් විධියට කටයුතු කරන කාලයේ අයාලයේ වෙන්ව යාම මම හිතන්නේ, මේ සමාජයට දැනෙන බරපතළ පාඩුවක්. ඒ නිසා මේ වෙලාවේ විශේෂයෙන් සරත් සුමනසේකර මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ ශෝකය ඒ පවුල වෙනුවෙන් එකතු කරමින් සරත් සුමනසේකර මැතිතුමා වෙනුවෙන් මේ ශෝක යෝජනාවේ අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම ගැනත් ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. මම හිතනවා, සරත් සුමනසේකර කියන අපේ හිතවතා, නැත්නම් ගරු මන්ත්‍රීතුමා පිළිබඳව ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා විශේෂයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ගාමිණී තිලකසිරි ඇමතිතුමා ඇතුළු සියලු දෙනාගේ අදහස් මේ සභාවේ අද හැන්සාඩ් වාර්තාගත වුණා. මම හිතන්නේ, සරත් සුමනසේකර මැතිතුමාගේ ආදරණීය භාර්යාව, පුතණුවන් ඇතුළු පවුලේ සියලු ඥාතීන් බොහොමත්ම මානසික තෘප්තියක් ලබනවා ඇති මගේ ආදරණීය ස්වාමි පුරුෂයා, නැත්නම් මගේ පියා කළ සේවාව පිළිබඳව, සමස්ත මන්ත්‍රීතුමන්ලා අද මේ සභාවේ කථා කරපු අදහස් පිළිබඳව.

හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී සරත් සුමනසේකර මැතිතුමාගේ අභාවය වෙනුවෙන් වූ ශෝක ප්‍රකාශ

යෝජනාව සම්බන්ධයෙන් අද දින මෙම පළාත් සභාවේදී ගරු මන්ත්‍රීවරුන් විසින් පළ කළ අදහස් ඇතුළත් නිල වාර්තා පිටපත් එතුමාගේ පවුලේ ඥාතීන්ගේ දැන ගැනීම සඳහා ලබා දෙන මෙන් මම මේ අවස්ථාවේදී සභා ලේකම්තුමාට දන්වනවා.

ඒ එක්කම අද දින න්‍යාය පත්‍රයේ පෞද්ගලික මන්ත්‍රී යෝජනා දෙකක් තිබුණා. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ සහ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ යෝජනා. ඒ යෝජනා දෙකම ඊළඟ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන මෙන් දන්වනවා.

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"මම දැන් මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.54 ට, 2017 මාර්තු මස 07 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 01.54 p.m till 9.30 a.m. on 07.03.2017*